# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2013

# ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2013

## ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ආර්ථික විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2013

## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2013 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 209 906 ක් පාසල් අයදුම්කරුවෝ ද 31 723 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2013 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

**ඉදිරියේ** දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2013 ජනවාරි 19

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල,

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා සංවිධානය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය | : | ඊ. කුලසේකර<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| සංස්කරණය | : | මහාචාර්ය ඊ. දයාරත්න<br>වාණිජ විද්‍යා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>මහාචාර්ය එච්.එම්. නවරත්න බණ්ඩා<br>ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය<br>කැලණිය විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය සුමුදු පෙරේරා<br>ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| සැකසුම් කමිටුව | : | ඩබ්ලිව්. ලයනල් වීරසිංහ<br>විශාඛා විද්‍යාලය<br>කොළඹ 05.<br><br>ඩී.ජී. සුගත්<br>මාර / සාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය<br>මාතර.<br><br>කේ.එන්.ආර්. පෙරේරා<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කැලණිය |
| පරිගණක පිටපත සැකසුම | : | කේ.ජී. ඉරෝෂා බණ්ඩාර<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවරය සැකසුම | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරි |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7


## II කොටස


2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 19
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 20
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 24
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 25
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 62


## III කොටස


3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 63
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 64

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම.
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ සාර්ව ආර්ථික විචල්‍යවල හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙලඹවීම.
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම.
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරීම.
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම.
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ ආර්ථික විද්‍යා විෂයය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම.
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ, මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම.
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම.
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම.

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 62 886 | 5150 | 68 036 |
| දෙමළ | 9834 | 862 | 10 696 |
| ඉංග්‍රීසි | 1947 | 561 | 2508 |
| එකතුව | 74 667 | 6573 | 81 240 |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 4062 | 5.44 | 184 | 2.80 | 4246 | 5.23 |
| B | 6973 | 9.34 | 505 | 7.68 | 7478 | 9.20 |
| C | 16 889 | 22.62 | 1319 | 20.06 | 18 208 | 22.41 |
| S | 21 715 | 29.08 | 1770 | 26.93 | 23 485 | 28.91 |
| F | 25 028 | 33.52 | 2795 | 42.52 | 27 823 | 34.25 |
| එකතුව | **74 667** | **100.00** | **6573** | **100.00** | **81 240** | **100.00** |

වගුව 2

## 1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 10663 | 902 | 8.46 | 1070 | 10.03 | 2375 | 22.27 | 3109 | 29.16 | 7456 | 69.92 | 2307 | 30.08 |
| 2. ගම්පහ | 6794 | 420 | 6.18 | 579 | 8.52 | 1297 | 19.09 | 1905 | 28.04 | 4201 | 61.83 | 2593 | 38.17 |
| 3. කළුතර | 3426 | 213 | 6.22 | 337 | 9.84 | 749 | 21.86 | 921 | 26.88 | 2220 | 64.80 | 1206 | 35.20 |
| 4. මහනුවර | 4320 | 238 | 5.51 | 337 | 7.80 | 918 | 21.25 | 1230 | 28.47 | 2723 | 63.03 | 1597 | 36.97 |
| 5. මාතලේ | 1217 | 30 | 2.47 | 67 | 5.51 | 205 | 16.84 | 378 | 31.06 | 680 | 55.88 | 537 | 44.12 |
| 6. නුවරඑළිය | 1711 | 79 | 4.62 | 134 | 7.83 | 372 | 21.74 | 442 | 25.83 | 1027 | 60.02 | 684 | 39.98 |
| 7. ගාල්ල | 3295 | 239 | 7.25 | 306 | 9.29 | 652 | 19.79 | 882 | 26.77 | 2079 | 63.10 | 1216 | 36.90 |
| 8. මාතර | 2682 | 88 | 3.28 | 178 | 6.64 | 524 | 19.54 | 760 | 28.34 | 1550 | 57.79 | 1132 | 42.21 |
| 9. හම්බන්තොට | 1629 | 45 | 2.76 | 130 | 7.98 | 318 | 19.52 | 457 | 28.05 | 950 | 58.32 | 679 | 41.68 |
| 10. යාපනය | 1283 | 69 | 5.38 | 115 | 8.96 | 323 | 25.18 | 377 | 29.38 | 884 | 68.90 | 399 | 31.10 |
| 11. කිලිනොච්චි | 266 | 4 | 1.50 | 11 | 4.14 | 74 | 27.82 | 92 | 34.59 | 181 | 68.05 | 85 | 31.95 |
| 12. මන්නාරම | 234 | 16 | 6.84 | 20 | 8.55 | 56 | 23.93 | 61 | 26.07 | 153 | 65.38 | 81 | 34.62 |
| 13. වව්නියාව | 332 | 31 | 9.34 | 44 | 13.25 | 82 | 24.70 | 91 | 27.41 | 248 | 74.70 | 84 | 25.30 |
| 14. මුලතිව් | 211 | 4 | 1.90 | 14 | 6.64 | 41 | 19.43 | 72 | 34.12 | 131 | 62.09 | 80 | 37.91 |
| 15. මඩකලපුව | 954 | 50 | 5.24 | 116 | 12.16 | 245 | 25.68 | 275 | 28.83 | 686 | 71.91 | 268 | 28.09 |
| 16. අම්පාර | 1570 | 54 | 3.44 | 129 | 8.22 | 348 | 22.17 | 523 | 33.31 | 1054 | 67.13 | 516 | 32.87 |
| 17. ත්‍රිකුණාමලය | 829 | 39 | 4.70 | 58 | 7.00 | 157 | 18.94 | 260 | 31.36 | 514 | 62.00 | 315 | 38.00 |
| 18. කුරුණෑගල | 4464 | 173 | 3.88 | 295 | 6.61 | 915 | 20.50 | 1249 | 27.98 | 2632 | 58.96 | 1832 | 41.04 |
| 19. පුත්තලම | 1833 | 77 | 4.20 | 167 | 9.11 | 422 | 23.02 | 529 | 28.86 | 1195 | 65.19 | 638 | 34.81 |
| 20. අනුරාධපුරය | 2257 | 71 | 3.15 | 154 | 6.82 | 374 | 16.57 | 660 | 29.24 | 1259 | 55.78 | 998 | 44.22 |
| 21. පොළොන්නරුව | 1139 | 41 | 3.60 | 79 | 6.94 | 208 | 18.26 | 294 | 25.81 | 622 | 54.61 | 517 | 45.39 |
| 22. බදුල්ල | 2301 | 67 | 2.91 | 149 | 6.48 | 455 | 19.77 | 680 | 29.55 | 1351 | 58.71 | 950 | 41.29 |
| 23. මොණරාගල | 1148 | 48 | 4.18 | 81 | 7.06 | 242 | 21.08 | 355 | 30.92 | 726 | 63.24 | 422 | 36.76 |
| 24. රත්නපුරය | 2889 | 178 | 6.16 | 259 | 8.97 | 606 | 20.98 | 769 | 26.62 | 1812 | 62.72 | 1077 | 37.28 |
| 25. කෑගල්ල | 2025 | 63 | 3.11 | 144 | 7.11 | 400 | 19.75 | 587 | 28.99 | 1194 | 58.96 | 831 | 41.01 |
| **සමස්ත දිවයින** | **59472** | **3239** | **5.45** | **4973** | **8.36** | **12358** | **20.78** | **16958** | **28.51** | **37528** | **63.10** | **21044** | **35.38** |

වගුව 3

### 1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 3 | 0.03 | 81 240 | 100.00 |
| 81 - 90 | 194 | 0.24 | 81 237 | 100.00 |
| 71 - 80 | 1821 | 2.24 | 81 043 | 99.76 |
| 61 - 70 | 5431 | 6.69 | 79 222 | 97.52 |
| 51 - 60 | 9538 | 11.74 | 73 791 | 90.83 |
| 41 - 50 | 12 945 | 15.93 | 64 253 | 79.09 |
| 31 - 40 | 16 351 | 20.13 | 51 308 | 63.16 |
| 21 - 30 | 18 016 | 22.18 | 34 957 | 43.03 |
| 11 - 20 | 15 107 | 18.60 | 16 941 | 20.85 |
| 01 - 10 | 1824 | 2.25 | 1834 | 2.26 |
| 00 - 00 | 10 | 0.01 | 10 | 0.01 |

වගුව 5

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 16 351ක් වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 20.13% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 51 308කි. එම සංඛ්‍යාව මුළු අපේක්ෂකයින්ගෙන් 63.16% කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 4 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය ආසන්න වශයෙන් 81%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 5, 27, 32 සහ 34 යන ප්‍රශ්නවලට ය. ඒවායේ ප්‍රතිශත ආසන්න වශයෙන් 13% බැගින් වේ.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයට අනුව 'අ' කොටසේ 01 වන ප්‍රශ්නය, අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනකු තෝරා ගෙන ඇත. එම ප්‍රතිශතය 97% කි. 'ආ' කොටසේ 10 වන ප්‍රශ්නය, අඩුම පිරිසක් තෝරා ගෙන ඇති අතර, එම ප්‍රතිශතය 16% කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙහි 04 වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 3%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 59%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2013**
**21 - ආර්ථික විද්‍යාව - II පත්‍රය ('අ' කොටස)**
**එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වල/අනුකොටස්වල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරය අනුව 01 වන ප්‍රශ්නයෙහි (iii) කොටසෙහි පහසුතාව 47% ක් වන අතර, 04 වන ප්‍රශ්නයෙහි iv කොටසෙහි (b) අනුකොටසෙහි පහසුතාව 66% කි.




ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ★ කාලය පැය 02කි.
- ★ වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- ★ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. පහත සඳහන් ද අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශයක් වනුයේ කවරක් ද?
   (1) ආර්ථික විද්‍යාඥයෝ ස්වාභාවික සම්පත් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි වශයෙන් වර්ග කරති.
   (2) පරිසරය හිඟ සම්පතකට උදාහරණයක් වේ.
   (3) අසීමිත වුවමනා සපුරාලීම සඳහා ආර්ථිකයක් සතුව ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි.
   (4) වර්තමානයේ ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය අංක එකේ සංඛ්‍යාවකි.
   (5) ආදායම අසමාන ලෙස බෙදීයාම අසාධාරණ වේ.

2. පූර්ණ සේවා නියුක්තිය පවතින ආර්ථිකයක, ප්‍රාග්ධන ආයෝජනය ඉහළ නැංවීමේ ආවස්ථික පිරිවැය වනුයේ
   (1) පරිභෝජනය පහළ වැටීම ය.
   (2) ආදායම පහළ වැටීම ය.
   (3) ඉතුරුම් ඉහළ නැගීම ය.
   (4) පොලී අනුපාතිකය ඉහළ නැගීම ය.
   (5) නිමැවුම පහළ වැටීම ය.

3. 'පරිවර්තන ආර්ථිකය' යන සංකල්පයෙන් විස්තර කෙරෙනුයේ
   (1) ශ්‍රම සූක්ෂ්ම නිෂ්පාදන ක්‍රමශිල්ප වෙනුවට ප්‍රාග්ධන සූක්ෂ්ම නිෂ්පාදන ක්‍රමශිල්ප යොදා ගන්නා රටකි.
   (2) මධ්‍යගත සැලසුම් ආර්ථිකයක සිට වෙළෙඳපොළ ආර්ථිකයක් කරා නැඹුරු වන රටකි.
   (3) අඩු ආදායම් සහිත ආර්ථිකයක සිට මධ්‍යම ආදායම් සහිත ආර්ථිකයක් කරා නැඹුරු වන රටකි.
   (4) වෙළෙඳ ශේෂයේ හිඟයක් සහිත තත්ත්වයක සිට වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් සහිත තත්ත්වයකට පත්වන රටකි.
   (5) සාම්ප්‍රදායික ආර්ථිකයක සිට මධ්‍යගත සැලසුම් ආර්ථිකයක් කරා නැඹුරු වන රටකි.

4. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක දැකිය හැකි වැදගත් ලක්ෂණයක් වනුයේ
   (1) සාපේක්ෂ මිල ගණන් පදනම් කර ගනිමින් සම්පත් බෙදී යාම ය.
   (2) ආර්ථික වෘද්ධියට බලපාන ප්‍රබල සාධකයක් ලෙස සම්පත් පිළිබඳ පෞද්ගලික හිමිකාරිත්වය පැවතීම ය.
   (3) භාණ්ඩ හා සේවා වඩාත් හොඳින් නිෂ්පාදනය කළ හැකි ආකාරය පිළිබඳ තීරණ ආණ්ඩුවේ සැලසුම් සම්පාදකයන් විසින් ගැනීම ය.
   (4) වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක පවතිනවාට වඩා ඉහළ මට්ටමේ කාර්යක්ෂමතාවක් අත්කර ගැනීම ය.
   (5) ආදායම හා ධනය ඉතා අසමාන ආකාරයකට බෙදී යාම ය.

5. එක්තරා භාණ්ඩයක් සඳහා අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර රූපසටහනෙහි දක්වේ.




සමතුලිත ඒකක ප්‍රමාණය මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් විසින් ගෙවීමට කැමති මුළු මුදල් ප්‍රමාණය රූපසටහනෙහි නිරූපණය කෙරෙන ප්‍රදේශය වන්නේ

(1) 0QEP ය. (2) 0TEQ ය. (3) PEK ය. (4) 0KM ය. (5) 0KEQ ය.

6. X හා Y යන රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




මෙම රටවල් දෙක සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?
(1) රටවල් දෙකේ ම එක හා සමාන වූ ආවස්ථික පිරිවැයක් හැමවිට ම පවතී.
(2) රටවල් දෙකේ ම අනාගත වෘද්ධි අපේක්ෂා එක සමාන වේ.
(3) රටවල් දෙකේ ම ආවස්ථික පිරිවැය වැඩි වෙමින් පවතී.
(4) රටවල් දෙකේ ම එක සමාන වූ භාණ්ඩ සංයෝජනයක් කිසිවිටකත් නිපදවිය නොහැකි ය.
(5) පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනයේ දී X රටේ ආවස්ථික පිරිවැය Y රටේ ආවස්ථික පිරිවැයට වඩා වැඩි ය.

7. අදාළ භාණ්ඩය සඳහා ඇති කිට්ටු ම ආදේශක භාණ්ඩවල මිල සැලකිල්ලට ගනිමින්, කිසියම් සමාගම් පහක් විසින් නිපදවනු ලබන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමේ හරස් මිල නම්‍යතා පහත සඳහන් වගුවේ දක්වේ.

| සමාගම | හරස් මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|
| A සමාගම | + 3.0 |
| B සමාගම | + 2.5 |
| C සමාගම | + 1.0 |
| D සමාගම | + 0.8 |
| E සමාගම | + 0.2 |

මේ අනුව ඉහත සමාගම් අතුරෙන් වැඩි ම වෙළෙඳපොළ බලය හිමි ව ඇත්තේ කවර සමාගමකට ද?
(1) A සමාගමට ය. (2) B සමාගමට ය. (3) C සමාගමට ය.
(4) D සමාගමට ය. (5) E සමාගමට ය.

8. පහත දී ඇති අවස්ථා අතුරෙන් නිෂ්පාදන ආයතනයේ මුළු අයභාරය පහළ වැටෙනුයේ කවර අවස්ථාවක දී ද?
(1) සැපයුම නම්‍ය තත්ත්වයක තිබියදී මිල ඉහළ යන විට
(2) ඉල්ලුම නම්‍ය තත්ත්වයක තිබියදී මිල පහළ යන විට
(3) ඉල්ලුම අනම්‍ය තත්ත්වයක තිබියදී මිල ඉහළ යන විට
(4) ඉල්ලුම නම්‍ය තත්ත්වයක තිබියදී මිල ඉහළ යන විට
(5) ඉල්ලුම ඒකීය නම්‍ය තත්ත්වයක තිබියදී මිල පහළ යන විට

9. X බාල භාණ්ඩයක් වේ නම්, ආදායමෙහි හටගන්නා පහළ වැටීමක් නිසා එම භාණ්ඩයෙහි
(1) ඉල්ලුම අඩු වේ, මිල අඩු වේ, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ.
(2) ඉල්ලුම අඩු වේ, මිල වැඩි වේ, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ.
(3) ඉල්ලුම වැඩි වේ, මිල වැඩි වේ, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ.
(4) සැපයුම වැඩි වේ, මිල අඩු වේ, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.
(5) ඉල්ලුම වැඩි වේ, මිල වැඩි වේ, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.

10. දෙඩම් වෙළෙඳපොළ දැනට සමතුලිතතාවේ පවතී යැයි සලකන්න. දෙඩම් සඳහා ඉල්ලුම වැඩි වෙමින් තිබියදී දෙඩම් සැපයුම අඩු වුවහොත් වෙළෙඳපොළ මිල හා ප්‍රමාණය කෙරෙහි ඇති වන බලපෑම පිළිබඳ ව කිව හැක්කේ කුමක් ද?
(1) මිල හා ප්‍රමාණය යන දෙක ම ඉහළ නගී.
(2) මිල ඉහළ නගී. එහෙත් ප්‍රමාණයෙහි වෙනස්වීම නොපැහැදිලි ය.
(3) මිල හා ප්‍රමාණය යන දෙක ම පහළ බසී.
(4) ප්‍රමාණය ඉහළ නගී. එහෙත් මිලෙහි වෙනස් වීම නොපැහැදිලි ය.
(5) ඉල්ලුම් හා සැපයුම් වක්‍රවල විතැන්වීම් මගින් එකිනෙකෙහි බලපෑම සමහන් වන බැවින්, මිලෙහි හෝ ප්‍රමාණයෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.

11. සිගරට් සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව 1ට වඩා අඩු ය'යි සලකන්න. සිගරට් නිෂ්පාදනය මත දේශීය භාණ්ඩ බද්දක් පනවනු ලැබූ විට, භාණ්ඩයේ මිල, ප්‍රමාණය හා පාරිභෝගික පැහැදම වෙනස් වනුයේ පහත සඳහන් කවර ආකාරයට ද?

| | මිල | ප්‍රමාණය | පාරිභෝගික පැහැදම |
|---|---|---|---|
| (1) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| (3) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |

12. දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙත යොමු කෙරෙන දරුවන් වෙනුවෙන් වැය කිරීමට සිදුවන පිරිවැය ආවරණය කරගනු වස් රජය විසින් සෑම දෙමව්පියෙකුට ම එක් එක් දරුවා වෙනුවෙන් සහනාධාර කූපන් පතක් දෙනු ලැබේ යැ'යි සලකන්න. මේ නිසා දිවා සුරැකුම් සේවා සැපයුම් වෙළෙඳපොළෙහි කෙබඳු වෙනසක් ඇති විය හැකි ද?
   (1) දිවා සුරැකුම් සේවා සඳහා ඉල්ලුම අඩු වන අතර මිල පහළ බසී.
   (2) දිවා සුරැකුම් සේවා සඳහා ඉල්ලුම වැඩි වන අතර මිල ඉහළ නගී.
   (3) දිවා සුරැකුම් සේවා සැපයුම වැඩි වන අතර මිල පහළ බසී.
   (4) දිවා සුරැකුම් සේවා සැපයුම අඩු වන අතර මිල ඉහළ නගී.
   (5) දිවා සුරැකුම් සේවා සැපයුමේ හිඟයක් දිගින් දිගට ම හට ගනී.

13. පාරිභෝගික අතිරික්තය ශූන්‍ය අගයක් ගැනීමට අවශ්‍ය කරන කොන්දේසිය වනුයේ
   (1) ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (2) ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (3) සැපයුම පූර්ණ මිල නම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (4) සැපයුම පූර්ණ මිල අනම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (5) ඉල්ලුමේ මිල නම්‍යතාව සාපේක්ෂ වශයෙන් සැපයුමේ මිල නම්‍යතාවට වඩා ඉහළ අගයක් ගැනීම ය.

14. 'සාමාන්‍ය භාණ්ඩයක්' සඳහා වන වෙළෙඳපොළක, අලෙවි කරනු ලබන භාණ්ඩ ඒකක ප්‍රමාණයත්, මිලත් යන දෙක ම එකවර ඉහළ යාම පැහැදිලි කළ හැක්කේ පහත සඳහන් ද අතුරෙන් කවරක් මගින් ද?
   (1) එම භාණ්ඩය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද සඵල උපරිම මිල ප්‍රතිපත්තිය ඉවත් කර දැමීම
   (2) භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී හට ගත් තාක්ෂණික දියුණුව
   (3) භාණ්ඩය මත බද්දක් පැනවීම
   (4) එම භාණ්ඩයේ නිෂ්පාදකයනට සහනාධාරයක් ලබා දීම
   (5) එම භාණ්ඩය සඳහා ඇති ආදේශක භාණ්ඩයක මිල පහළ යාම

15. ශ්‍රමයේ ආන්තික ඵලදාව, ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාවට සමාන වන විට
   (1) ශ්‍රමයේ ආන්තික ඵලදාව උපරිම වේ.
   (2) නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම වේ.
   (3) නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වේ.
   (4) සාමාන්‍ය මුළු පිරිවැය, අවම අගයක් ගනී.
   (5) ශ්‍රමයේ මුළු ඵලදාව උපරිම වේ.

16. කිසියම් නිෂ්පාදන ආයතනයක ශ්‍රම හමුදාවේ ප්‍රමාණය දිනකට ශ්‍රමිකයින් 100 සිට 101 දක්වා වැඩි කරන විට, ශ්‍රමිකයෙකුගේ දෛනික වැටුප ද රු. 600 සිට රු. 650 දක්වා ඉහළ නැංවීමට නිෂ්පාදන ආයතනයට සිදු වේ. මේ අනුව එක් දිනක දී ශ්‍රමයේ ආන්තික පිරිවැය කොපමණ වේ ද?
   (1) රු. 50 කි. (2) රු. 650 කි. (3) රු. 5 650 කි. (4) රු. 60 000 කි. (5) රු. 65 650 කි.

17. කිසියම් නිෂ්පාදන ආයතනයක වාර්ෂික නිෂ්පාදන පිරිවැය ආර්ථික විද්‍යාඥයෙකු විසින් ගණනය කොට, පහත සඳහන් ආකාරයට ඉදිරිපත් කර ඇත.

| අයිතමය | පිරිවැය (රු.දහස් ගණනින්) |
|---|---|
| වැටුප් සහ වේතන | 150 |
| අයිතිකරුවාගේ කාලයෙහි ආවස්ථික පිරිවැය | 40 |
| ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා පිරිවැය | 80 |
| බදු කුලිය | 30 |
| අලෙවිකරණ පිරිවැය | 20 |
| බැංකු ණය සඳහා පොලී ගෙවීම් | 25 |
| අයිතිකරුවා ම යොදන ලද ප්‍රාග්ධනයෙහි අහිමි වුණු පොලී ආදායම් | 15 |

මෙම තොරතුරුවලට අනුව ආර්ථික විද්‍යාඥයෙකු විසින් නිර්වචනය කරනු ලබන මුළු පිරිවැය, ගණකාධිකාරීවරයෙකු විසින් නිර්වචනය කරනු ලබන මුළු පිරිවැයට වඩා කොතරම් ප්‍රමාණයකින් ඉක්මවා යනු ලැබේ ද?
   (1) රු. 30 500 යි. (2) රු. 55 000 යි. (3) රු. 85 000 යි.
   (4) රු. 305 000 යි. (5) රු. 360 000 යි.

18. A නමැති නිෂ්පාදන සමාගමේ ශ්‍රමිකයන් සංඛ්‍යාව 250 සිට 200 දක්වා අඩු කළ විට, සමාගමේ දෛනික නිෂ්පාදනය ඒකක 5 000 සිට 4 800 දක්වා පහළ බසී. B නමැති නිෂ්පාදන සමාගමේ ශ්‍රමිකයන් සංඛ්‍යාව 800 සිට 1000 දක්වා වැඩි කළ විට, එම සමාගමේ දෛනික නිෂ්පාදනය ඒකක 2000 සිට 2200 දක්වා ඉහළ නගී. මෙම ආයතන දෙකෙහි ශ්‍රම ඵලදයිතාවේ කෙබඳු වෙනසක් දක්නට ලැබේ ද?

| | A සමාගමේ ශ්‍රම ඵලදයිතාව | B සමාගමේ ශ්‍රම ඵලදයිතාව |
|---|---|---|
| (1) | පහළ බසී. | ඉහළ නගී. |
| (2) | ඉහළ නගී. | පහළ බසී. |
| (3) | ඉහළ නගී. | ඉහළ නගී. |
| (4) | පහළ බසී. | පහළ බසී. |
| (5) | ඉහළ නගී. | නොවෙනස්ව පවතී. |

19. එක්තරා කර්මාන්තයක් නිෂ්පාදන ආයතන විශාල සංඛ්‍යාවකින් සමන්විත වන අතර, ඒ සෑම ආයතනයක් ම සමජාතීය වූ භාණ්ඩ නිෂ්පාදනය කරයි. මෙම කර්මාන්තය තුළ එක් එක් ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍ර පහළට බෑවුම් වන්නේ නම්, එය පැහැදිලි කළ හැක්කේ පහත සඳහන් කවර කරුණක් මගින් ද?
   (1) සියලු ම ආයතන මිල ගනුවන් ලෙස ක්‍රියා කිරීම
   (2) අබාධ ප්‍රවේශය සහ පිටවීම
   (3) නිෂ්පාදන සම්පත් පිළිබඳ පූර්ණ සංචලතාව
   (4) භාණ්ඩ සඳහා වියදම් කිරීමට පාරිභෝගිකයන් සතුව ඇති මුදල් ප්‍රමාණය සීමිත වීම
   (5) වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ පූර්ණ දැනුමක් පාරිභෝගිකයින්ට නොතිබීම

20. පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් සතියකට සහල් මලු 200ක් නිෂ්පාදනය කොට, මල්ලක් රු. 250 බැගින් වූ මිලකට අලෙවි කරයි. එම ආයතනයේ පිරිවැය පහත දක්වේ.

| අයිතමය | පිරිවැය (රු.) |
|---|---|
| මුළු ස්ථාවර පිරිවැය | 20 000 |
| මුළු විචල්‍ය පිරිවැය | 40 000 |
| ආන්තික පිරිවැය | 250 |

කෙටි කාලයේ දී ලාභය උපරිම කිරීමට හෝ අලාභය අවම කර ගැනීමට හෝ ආයතනය කුමක් කළ යුතු වේ ද?
   (1) නිෂ්පාදනය මුළුමනින් ම අත්හිටුවීම
   (2) නිමැවුම ප්‍රසාරණය කිරීම
   (3) නිමැවුම සංකෝචනය කිරීම
   (4) මිල පහළ හෙළීම
   (5) වර්තමාන මට්ටමෙහි ම නිමැවුම පවත්වා ගැනීම

21. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමාණය කෙරෙහි බලපෑමක් ඇති **නොවනුයේ** පහත සඳහන් කවරක් නිසා ද?
   (1) පෞද්ගලික පරිහරණය සඳහා පාරිභෝගිකයකු විසින් අලුත් මෝටෝරියක් මිලට ගැනීම
   (2) ආණ්ඩුව ආරක්ෂක විද්‍යා පීඨයට නව බස් රථයක් මිලට ගැනීම
   (3) පාරිභෝගිකයකු විසින් බාබර් සාප්පුවකින් කොණ්ඩය කප්පවා ගැනීම
   (4) ආයෝජකයකු විසින් දුර්ලභ ගණයේ පැරණි චිත්‍රයක් වෙන්දේසියකින් මිලදී ගැනීම
   (5) නිෂ්පාදන සමාගමක් තම කර්මාන්ත ශාලාව සඳහා විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගැනීම

22. ස්වාධීන පරිභෝජනය රු. 400ක් ද, ආන්තික පරිභෝජන නැඹියාව 0.8ක් ද වේ යැයි සලකන්න. වැය කළ හැකි ආදායම රු. 1200කින් ඉහළ ගියහොත්, පරිභෝජන වියදම වැඩි වනුයේ
   (1) රු. 1 600 කිනි.   (2) රු. 1 360 කිනි.   (3) රු. 1 200 කිනි.
   (4) රු. 960 කිනි.   (5) රු. 400 කිනි.

23. ආන්තික ඉතුරුම් නැඹියාව 0.25 ක් සහිත ස්ථාවර බදු පමණක් දක්නට ලැබෙන ආවෘත ආර්ථිකයක, ආණ්ඩුවේ මිලදී ගැනීම් රු. බිලියන් 80 කින් ඉහළ යාමක් කරණකොටගෙන නිමැවුම උපරිම වශයෙන් වැඩි වනුයේ
   (1) රුපියල් බිලියන 80 කිනි.   (2) රුපියල් බිලියන 80.25 කිනි.
   (3) රුපියල් බිලියන 160 කිනි.   (4) රුපියල් බිලියන 240 කිනි.
   (5) රුපියල් බිලියන 320 කිනි.

24. රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 30 + 0.7Y$ ($C$ = පරිභෝජන වියදම, $Y$ = ආදායම) වේ. මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම රු. මිලියන 300 ක් වේ නම්, ආයෝජන මට්ටම කොපමණ වේ ද?
   (1) රුපියල් මිලියන 60 කි.   (2) රුපියල් මිලියන 100 කි.
   (3) රුපියල් මිලියන 210 කි.   (4) රුපියල් මිලියන 240 කි.
   (5) රුපියල් මිලියන 300 කි.

25. රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක ඉතුරුම් හා ආයෝජන වක්‍ර රූපසටහනේ දැක්වේ.




මෙම ආර්ථිකයේ විභව නිමැවුම $Y_p$ වේ. එබැවින් සැබෑ නිමැවුම සහ විභව නිමැවුම අතර පරතරය ප්‍රස්තාරික ව මැනෙනුයේ

(1) LG මගිනි. (2) GH මගිනි. (3) JH මගිනි. (4) KJ මගිනි. (5) HK මගිනි.

26. දෙන ලද වර්ෂයක් තුළ පරිභෝජනය, ආයෝජනය හා ආණ්ඩුවේ මිල දී ගැනීම් සඳහා වැය වූ මුළු වියදම, රටේ මුළු දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමින් 103% ක් විය. මෙවැනි තත්ත්වයක් හට ගත හැක්කේ

(1) මුදල් සැපයුම වැඩි වුවහොත් පමණි.
(2) ශුද්ධ අපනයන ධන අගයක් ගනු ලැබුවහොත් පමණි.
(3) ශුද්ධ අපනයන සෘණ අගයක් ගනු ලැබුවහොත් පමණි.
(4) අයවැය ලේඛනයේ අතිරික්තයක් හට ගතහොත් පමණි.
(5) තුලිත අයවැයක් ඇති වුවහොත් පමණි.

27. ආවෘත ආර්ථිකයක බැංකු පද්ධතිය තනි වාණිජ බැංකුවකින් පමණක් සමන්විත වේ යැ'යි ද, බැංකුව 10% ක සංචිත අනුපාතයක් යටතේ කටයුතු කරන අතර ගනුදෙනුකරුවන් රුපියල් 10 000 ක මුදලක් බැංකුවේ අලුතෙන් තැන්පත් කරන්නේ යැ'යි ද සලකන්න. රට තුළ සංසරණය වන ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ වෙනස්කම් කිසිවක් පසුව සිදු නොවේ යැ'යි උපකල්පනය කළහොත්, මෙම තැන්පතුව නිසා බැංකුවට ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ වේ ද?

(1) රුපියල් 1 000 කි. (2) රුපියල් 9 000 කි. (3) රුපියල් 10 000 කි.
(4) රුපියල් 90 000 කි. (5) රුපියල් 100 000 කි.

28. කේන්සියානු විග්‍රහයට අනුව මුදලට ඇති ඉල්ලුම වැඩි විය හැක්කේ පහත සඳහන් කවර තත්ත්වයක් යටතේ ද?

| | මූර්ත ආදායම | මිල මට්ටම | පොලී අනුපාතිකය |
|---|---|---|---|
| (1) | වැඩි වීම | අඩු වීම | වැඩි වීම |
| (2) | ස්ථාවරව තිබීම | ස්ථාවරව තිබීම | වැඩි වීම |
| (3) | වැඩි වීම | වැඩි වීම | අඩු වීම |
| (4) | ස්ථාවරව තිබීම | අඩු වීම | අඩු වීම |
| (5) | අඩු වීම | ස්ථාවරව තිබීම | වැඩි වීම |

29. ආර්ථිකය පූර්ණ සේවා නියුක්තියේ පවතී යැ'යි සලකන්න. මිල මට්ටම ස්ථාවරව පවත්වා ගනිමින් ආයෝජනය ඉහළ නැංවීමට ප්‍රතිපත්ති සම්පාදකයන් අපේක්ෂා කරන්නේ නම්, පහත සඳහන් මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල කෙබඳු සංයෝගයක්, එම අරමුණ සාක්ෂාත් කරගැනීමට යෝග්‍ය වන්නේ ද?

| | මූල්‍ය ප්‍රතිපත්තිය | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය |
|---|---|---|
| (1) | නොවෙනස්ව තබාගැනීම | සංකෝචනාත්මක |
| (2) | ප්‍රසාරණාත්මක | නොවෙනස්ව තබාගැනීම |
| (3) | ප්‍රසාරණාත්මක | සංකෝචනාත්මක |
| (4) | ප්‍රසාරණාත්මක | ප්‍රසාරණාත්මක |
| (5) | සංකෝචනාත්මක | ප්‍රසාරණාත්මක |

30. ආර්ථිකය, පසුබෑමකින් හෙවත් ප්‍රතිගමනාත්මක තත්ත්වයකින් (recession) මුදවා ගැනීම සඳහා යෝග්‍ය මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල සංයෝගය පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් වේ ද?

(1) බදු සහ මුදල් සැපයුම යන දෙක ම පහත හෙළීම
(2) බදු සහ මුදල් සැපයුම යන දෙක ම ඉහළ දැමීම
(3) ආණ්ඩුවේ මිලදී ගැනීම් ඉහළ නැංවීම හා මහ බැංකුවේ පොලී අනුපාතික පහත හෙළීම
(4) බදු සහ වට්ටම් අනුපාතික යන දෙක ම ඉහළ නැංවීම
(5) හිඟ අයවැය ප්‍රතිපත්තියක් යොදා ගැනීම සහ රජය විවෘත වෙළෙඳපොළේ සුරැකුම්පත් අලෙවි කිරීම

31. එක්තරා ආර්ථිකයක වර්ෂයක් තුළ මුළු නිමැවුම 2%කින් ද, මුදල් තොගය 5%කින් ද ඉහළ යති'යි සලකන්න. මුදලේ සංසරණ ප්‍රවේගය නොවෙනස්ව පවතින්නේ නම්, මෙම තත්ත්වය යටතේ මිල මට්ටම හා මුළු නිමැවුමේ නාමික වටිනාකම ආසන්න වශයෙන් කෙතරම් ප්‍රමාණයකින් ඉහළ යයි ද?

| | මිල මට්ටම ඉහළ යාම | මුළු නිමැවුමේ නාමික අගය ඉහළ යාම |
|---|---|---|
| (1) | 2% | 5% |
| (2) | 2% | 7% |
| (3) | 2.5% | 10% |
| (4) | 3% | 5% |
| (5) | 3% | 7% |

32. 2008-2012 කාලය තුළ කිසියම් රටක දළ දේශීය නිෂ්පාදිතයේ නාමික අගය දර්ශක අංක මගින් ඉදිරියෙන් ඇති වගුවේ දැක්වේ.

| වර්ෂය | ද.දේ. නිෂ්පාදිතයේ නාමික අගය |
|---|---|
| 2008 | 100 |
| 2009 | 96 |
| 2010 | 90 |
| 2011 | 85 |
| 2012 | 83 |

මෙම දත්තවලට අනුව, 2008-2012 කාලය තුළ පහළ වැටී ඇතැ'යි නිගමනය කළ හැකි විචල්‍යය වනුයේ
(1) සමාහාර ඉල්ලුමයි. (2) මූර්ත නිමැවුමයි
(3) උද්ධමන අනුපාතිකයයි. (4) රජයේ අයවැය හිඟයයි.
(5) වෙළෙඳ ශේෂයේ හිඟයයි.

33. නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ දී අත් වන ප්‍රතිඵල ලෙස දක්වා ඇති පහත සඳහන් ද අතුරෙන් ධන බාහිරතාවක් ලෙස සැලකිය හැක්කේ කවරක් ද?
(1) මහාමාර්ගවල සිදුවන රිය අනතුරු අඩුවීම
(2) දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන ලාභ ඉහළ යාම
(3) සංචාරකයන් දුම්රියෙන් ගමන් කිරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම වැඩිවීම
(4) දුම්රියේ ගමන් කරන මගීන්ගේ ගමන් කාලය ඉතිරිවීම
(5) දුම්රිය මාර්ගයට ආසන්නව පිහිටි ඉඩම්වල වටිනාකම අඩුවීම

34. 'ශුභසාධන භාණ්ඩයක්' යනු
(1) එකිනෙකාගේ සුදුසුකම් මත පාරිභෝගිකයින් වෙත ලබාදෙන භාණ්ඩයකි.
(2) එම භාණ්ඩය නිදහස් වෙළෙඳපොළ මගින් සැපයුවහොත් පාරිභෝගිකයින් මිලදී ගනු ඇත්තේ ඉතා මඳ වශයෙන් ය'යි රජය විශ්වාස කරන භාණ්ඩයකි.
(3) එම භාණ්ඩය නිදහස් වෙළෙඳපොළ මගින් සැපයුවහොත්, පාරිභෝගිකයින් විසින් අවශ්‍ය ප්‍රමාණයටත් වැඩියෙන් මිල දී ගනු ඇතැ'යි රජය විශ්වාස කරන භාණ්ඩයකි.
(4) යම් භාණ්ඩයකින් එක් පාරිභෝගිකයෙකු ලබන ප්‍රතිලාභය, සියලු ම පාරිභෝගිකයින් වෙතට ද ලබා දිය හැකි භාණ්ඩයකි.
(5) යම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් ලබන පෞද්ගලික ප්‍රතිලාභය, එහි සමාජීය ප්‍රතිලාභ ඉක්මවන භාණ්ඩයකි.

35. ප්‍රතික්‍රමික බද්දක් යනු
(1) සියලු ම බදු ගෙවන්නන් තම ආදායමෙන් නිරපේක්ෂ වශයෙන් සමාන ආදායම් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවීම ය.
(2) ඉහළ ආදායම් ලබන්නන් තම ආදායමෙන්, පහළ ආදායම් ලබන්නන්ට වඩා අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවීම ය.
(3) ඉහළ ආදායම් ලබන්නන්, පහළ ආදායම් ලබන්නන්ට වඩා අඩු මුදල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවීම ය.
(4) ඉහළ ආදායම් ලබන්නන්, පහළ ආදායම් ලබන්නන්ට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවීම ය.
(5) බදු බර පසුපසට විතැන් කළ හැකි බද්දකි.

36. පහත දැක්වෙන වගුව **A** හා **B** යන රටවල් දෙක විසින් සංයුක්ත සම්පත් ඒකකයක් භාවිත කොට නිෂ්පාදනය කරනු ලබන **X** හා **Y** යන භාණ්ඩවල නිමැවුම් ප්‍රමාණ පෙන්නුම් කරයි.

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| X | 100 | 300 |
| Y | 200 | 400 |

එක් එක් රට තමනට සාපේක්ෂ වාසි පවතින භාණ්ඩය පිළිබඳ විශේෂීකරණය කරයි නම්, රටවල් දෙකට ම වෙළෙඳමෙන් වාසි ලබා ගත හැකි හුවමාරු අනුපාතිකය කුමක් ද?
(1) 1X = 1Y (2) 1X = 1.3Y (3) 1X = 1.5Y (4) 1X = 2Y (5) 1X = 3Y

37. ශ්‍රී ලාංකික නිෂ්පාදන ආයතනයක් එක්සත් ජනපද ඩොලර් මිලියන 10ක් වටිනා ටයර්, එක්සත් රාජධානියේ සමාගමකට අපනයනය කරයි. ද්විත්ව සටහන් ක්‍රමය යටතේ ගිණුම් තැබීමේ දී මෙම ගනුදෙනුව මගින් බලපෑමක් ඇතිවන්නේ ගෙවුම් ශේෂයේ කවර ගිණුම් කොටස් දෙකට ද?
(1) වර්තන ගිණුමේ අපනයන හා ප්‍රාග්ධන ගිණුමේ ප්‍රාග්ධන සංක්‍රාම
(2) වර්තන ගිණුමේ අපනයන හා වර්තන ගිණුමේ ආදායම්
(3) වර්තන ගිණුමේ අපනයන හා මූල්‍ය ගිණුමේ සංචිත වත්කම්
(4) මූල්‍ය ගිණුමේ වගකීම් හා මූල්‍ය ගිණුමේ අනේවාසිකයන් මත හිමිකම්
(5) වර්තන ගිණුමේ අපනයන හා මූල්‍ය ගිණුමේ අනේවාසිකයන් මත හිමිකම්

38. කිසියම් රටක සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට එහි අවසාන ගෙවුම් ශේෂ ගිණුම් සකසා ඉදිරිපත් කිරීමට අවශ්‍යව ඇත. එම දෙපාර්තමේන්තුව මගින් වර්තන ගිණුමේ ශේෂය, ප්‍රාග්ධන ගිණුමේ ශේෂය හා මූල්‍ය ගිණුමේ ශේෂය ගණනය කර ඇත. ඉහත කාර්යය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන අමතර තොරතුර වනුයේ
   (1) විදේශ මුදල් සංචිත වෙනස්වීම් ය.
   (2) විදේශ ආධාර ය.
   (3) වැරදීම් හා අත්හැරීම් ය.
   (4) සමපේක්ෂණ මුදල් ලැබීම් ය.
   (5) කළඹ ආයෝජන වෙනස්වීම් ය.

39. එක්තරා රටක වෙළෙඳ අනුපාතය වර්තමානයේ 150 ( පාද වර්ෂය 2010 = 100) කි. 2010 න් පසුව එම රටේ අපනයන සඳහා ලැබුණු සාමාන්‍ය මිල 20% කින් වැඩි වී ඇත්නම්, ආනයන සඳහා එම රට ගෙවා ඇති සාමාන්‍ය මිල වෙනස් වී ඇත්තේ
   (1) –50% කිනි.
   (2) –25% කිනි.
   (3) –20% කිනි.
   (4) +20% කිනි.
   (5) +25% කිනි.

40. යම් තෝරා ගන්නා ලද භාණ්ඩ පැසක් සඳහා ඇමෙරිකාවේ දී ගෙවීමට සිදුවන මිල ඩොලර් 120 කි. ඒ හා සමාන වූ පැසක් සඳහා ශ්‍රී ලංකාවේ දී ගෙවීමට සිදුවන මිල රුපියල් 9 600 කි. මෙමගින් කිව හැක්කේ
   (1) රුපියලේ බාහිර අගය 25%කින් අධිතක්සේරු වී ඇති බව ය.
   (2) රුපියලේ බාහිර අගය 20%කින් ඌන තක්සේරු වී ඇති බව ය.
   (3) ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය ඩොලරයකට රුපියල් 96 ක් බව ය.
   (4) ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය ඩොලරයකට රුපියල් 80 ක් බව ය.
   (5) ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය රුපියලකට ඩොලර් 0.10 ක් බව ය.

41. දියුණු වෙමින් පවතින රටවලට ලැබෙන විදේශ සෘජු ආයෝජන නිසා
   (1) දේශීය වැටුප් මට්ටම් පහළ වැටේ.
   (2) සංවර්ධනය වෙමින් පවතින රටවල බදු ආදායම පහළ වැටේ.
   (3) දේශීය ජනතාවට ලබා ගත හැකි විවිධ පාරිභෝගික භාණ්ඩ සංඛ්‍යාව අඩු වේ.
   (4) ආයෝජනයෙන් ලැබෙන ශුද්ධ විදේශ ආදායම් ප්‍රවාහ අයහපත් වේ.
   (5) ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන ගිණුම අයහපත් වේ.

42. කිසියම් රටක ප්‍රතිශීර්ෂ ආදායම සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පවතින විට, ඒ හා බැඳුණු තවත් ලක්ෂණයක් ලෙස දැකිය හැක්කේ
   (1) ඉතුරුම් අනුපාතිකය ඉහළ අගයක් ගැනීම ය.
   (2) ආර්ථික වර්ධන අනුපාතිකය පහළ අගයක් ගැනීම ය.
   (3) උද්ධමන අනුපාතිකය පහළ අගයක් ගැනීම ය.
   (4) ජනගහන වර්ධන අනුපාතිකය පහළ අගයක් ගැනීම ය.
   (5) සේවා නියුක්ති අනුපාතිකය ඉහළ අගයක් ගැනීම ය.

43. වඩා වේගවත් ආර්ථික වර්ධනයක් ජනනය කිරීමට වැඩි හැකියාවක් ඇති සාධක සංයෝගයක් වන්නේ
   (1) සේවා නියුක්තියත්, ගෙවුම් ශේෂයේ හිඟයත් ඉහළ යාම ය.
   (2) ආයෝජන මට්ටමත්, වැඩ කරන ජනගහනයේ ප්‍රමාණයත් ඉහළ යාම ය.
   (3) ධනය වඩාත් සමාන ලෙස බෙදී යාම හා සංක්‍රාම ගෙවීම් ඉහළ මට්ටමක තිබීම ය.
   (4) උද්ධමනය වේගවත් වීම හා ජාතික ණය ප්‍රමාණය ඉහළ යාම ය.
   (5) විදේශ සෘජු ආයෝජන හා පොලී අනුපාතික ඉහළ යාම ය.

44. දෙන ලද වර්ෂයක් තුළ A,B,C,D හා E යන රටවල පරිභෝජනය, දළ ප්‍රාග්ධන සම්පාදනය හා ක්ෂයවීම් පිළිබඳ සංඛ්‍යා දත්ත පහත සඳහන් වගුව පෙන්නුම් කරයි. (සියලු ම අගයන් මිනුම් කර ඇත්තේ ඇමෙරිකානු ඩොලර් මිලියනවලිනි.)

| රට | පරිභෝජනය | දළ ප්‍රාග්ධන සම්පාදනය | ක්ෂයවීම් |
|---|---|---|---|
| A | 200 | 40 | 50 |
| B | 500 | 200 | 150 |
| C | 1 000 | 1 200 | 1 400 |
| D | 5 000 | 6 000 | 6 000 |
| E | 10 000 | 8 000 | 8 200 |

මෙම රටවල පවතින තාක්ෂණයේ වෙනසක් සිදු නොවේ නම්, ඉහත තොරතුරු අනුව ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමට වඩාත් ඉඩකඩ ඇති රට කුමක් ද?
   (1) A
   (2) B
   (3) C
   (4) D
   (5) E

45. 'සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති' යන්නෙන් අදහස් කෙරෙනුයේ
   (1) ඵලදායිතාව දියුණු කෙරෙන සහ වෙළෙඳපොළ අපූර්ණතා අඩු කෙරෙන ප්‍රතිපත්ති වේ.
   (2) හැකි තරම් භාණ්ඩ හා සේවා සැපයීමට රජයට හැකියාව ලබා දෙන ප්‍රතිපත්ති වේ.
   (3) සේවා වියුක්ති ගැටලුව අවම වන ආකාරයට ශ්‍රම සැපයුම අඩු කිරීමට හේතු වන ප්‍රතිපත්ති වේ.
   (4) පොලී අනුපාතික පාලනය කිරීම මගින් උද්ධමනය අඩුකරන ප්‍රතිපත්ති වේ.
   (5) සමාහාර ඉල්ලුම ඉහළ නංවන ප්‍රතිපත්ති වේ.

46. 2000-2010 කාලය තුළ එක්තරා ආර්ථිකයක මුළු ආදායම, විවිධ ආදායම් කාණ්ඩ අතර බෙදී ගිය ආකාරය පහත වගුව පෙන්නුම් කරයි.

| ආදායම් කාණ්ඩය | මුළු ආදායමෙන් හිමි වූ ප්‍රතිශතය | |
|---|---|---|
| | 2000 | 2010 |
| පහළ 10% | 4.1 | 2.5 |
| පහළ 20% | 9.8 | 6.8 |
| පහළ 30% | 16.0 | 12.0 |
| ඉහළ 30% | 47.0 | 54.0 |
| ඉහළ 20% | 35.0 | 41.0 |
| ඉහළ 10% | 20.0 | 26.0 |

මෙම දත්ත මගින් නිගමනය කළ හැක්කේ අදාළ කාලය තුළ
(1) පහළ ආදායම් කාණ්ඩවල ආදායම් අඩු වී ඇති බව ය.
(2) ආදායම් ව්‍යාප්තිය වඩාත් අසමාන වී ඇති බව ය.
(3) ධන ව්‍යාප්තිය වඩාත් අසමාන වී ඇති බව ය.
(4) මුළු ආදායම ඉහළ යාම නිසා සැම දෙනාට ම වාසිදායක තත්ත්වයක් උදා වී ඇති බව ය.
(5) ගිනි සංගුණකයේ අගය අඩු වී ඇති බව ය.

47. පහත දැක්වෙන වෙනස්වීම් අතුරෙන් රටක් සංවර්ධනය වී ඇති බව හොඳින් ම ඇඟවෙන්නේ කවර වෙනස්වීමක් මගින් ද?
(1) සාමාන්‍ය පුරවැසියකුගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වයේ දියුණුවක් ඇති වීම
(2) රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යාම
(3) රටේ වෙළෙඳ ශේෂයෙහි දියුණුවක් ඇති වීම
(4) දේශීය මුදලෙහි විදේශ අගය ඉහළ යාම
(5) වැඩිහිටි සාක්ෂරතා අනුපාතය ඉහළ යාම

48. සංවර්ධනය ඉහළ නැංවීම සඳහා හොඳ ම ප්‍රතිපත්තිය වන්නේ 'ආධාර නොව වෙළෙඳාම' බව ආර්ථික විද්‍යාඥයන් විසින් යෝජනා කර ඇත. මෙම යෝජනාව මගින් ඇඟවෙන්නේ
(1) සංවර්ධනය වෙමින් පවතින රටවල් ආධාර මත රඳා නොසිට, ස්වයංපෝෂිත විය යුතු බව ය.
(2) සංවර්ධනය වෙමින් පවතින රටවලට, සංවර්ධිත රටවල වෙළෙඳපොළවලට ඇතුළුවීමට ඉඩකඩ ලබා දිය යුතු බව ය.
(3) සංවර්ධනය වෙමින් පවතින රටවල් තම රටට ලැබුණු විදේශ ආධාර, අපනයන කර්මාන්ත සංවර්ධනය සඳහා ආයෝජනය කළ යුතු බව ය.
(4) සංවර්ධනය වෙමින් පවතින රටවල් ආනයන ආදේශනය දිරි ගැන්වීම සඳහා, ආරක්ෂණවාදී ප්‍රතිපත්ති යොදා ගත යුතු බව ය.
(5) සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් පවත්වා ගැනීම මගින්, සංවර්ධනය දිරිගැන්විය යුතු බව. ය.

49. **X** නමැති රටෙහි ප්‍රජා විද්‍යාත්මක දත්තවලින් සමහරක් පහත දී ඇත.

| අයිතමය | සංඛ්‍යාව (මිලියනවලින්) |
|---|---|
| මුළු ජනගහනය | 180 |
| ජනගහනය (අවුරුදු 10 හා ඉහළ) | 150 |
| සේවා නියුක්ත ජනගහනය | 81 |
| සේවා වියුක්ත ජනගහනය | 09 |
| ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය | 60 |

ඉහත තොරතුරු අනුව **X** නමැති රට සඳහා සේවා වියුක්ති අනුපාතිකය හා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය දක්වෙන පිළිතුර කුමක් ද?

| | සේවා වියුක්ති අනුපාතිකය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය |
|---|---|---|
| (1) | 10.00% | 60.00% |
| (2) | 10.00% | 53.33% |
| (3) | 6.66% | 50.00% |
| (4) | 5.55% | 50.00% |
| (5) | 5.65% | 33.33% |

50. යම් දෙන ලද ආර්ථිකයක සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය යන දෙක ම, වසර 10ක කාල පරිච්ඡේදයක් තුළ ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වයට හේතු වන්නට ඇත්තේ පහත දක්වෙන කවරක් ඉහළ යාම ද?
(1) උපත් අනුපාතය
(2) ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය
(3) ආයු අපේක්ෂාව
(4) යැපුම් අනුපාතය
(5) රටින් පිටතට සිදුවන සංක්‍රමණ

2.1.3. **I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 5 | 26. | 3 |
| 02. | 1 | 27. | 4 |
| 03. | 2 | 28. | 3 |
| 04. | 3 | 29. | 5 |
| 05. | 5 | 30. | 3 |
| 06. | 5 | 31. | 4 |
| 07. | 5 | 32. | 1 |
| 08. | 4 | 33. | 1 |
| 09. | 5 | 34. | 2 |
| 10. | 2 | 35. | 2 |
| 11. | 4 | 36. | 3 |
| 12. | 2 | 37. | 5 |
| 13. | 1 | 38. | 3 |
| 14. | 1 | 39. | 3 |
| 15. | 3 | 40. | 4 |
| 16. | 3 | 41. | 4 |
| 17. | 2 | 42. | 2 |
| 18. | 2 | 43. | 2 |
| 19. | 5 | 44. | 2 |
| 20. | 5 | 45. | 1 |
| 21. | 4 | 46. | 2 |
| 22. | 4 | 47. | 1 |
| 23. | 5 | 48. | 2 |
| 24. | 1 | 49. | 1 |
| 25. | 2 | 50. | 2 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 100 කි.

## 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




ඉහත ප්‍රස්තාරයට අනුව, I ප්‍රශ්න පත්‍රය සැලකීමේදී පහසුතාව අඩුම ප්‍රශ්නය, 27 වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 12.7%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් 12.7%ක් පමණක් වන අඩුම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 27 වන ප්‍රශ්නයට ය. එසේම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ, 04 වන ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 81.3%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් වැඩිම ප්‍රතිශතයක් වන 81.3%ක් ම නිවැරදි ව පිළිතුරු සපයා ඇති ප්‍රශ්නය 04 වන ප්‍රශ්නය වේ.

සමස්ත ප්‍රශ්න පත්‍රය සැලකීමේදී I ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 56.45%ක් වේ.

## 2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | **5** | **Missing** |
| 1 | 5 | 10.78 | 7.17 | 8.50 | 10.33 | **62.83** | 0.33 |
| 2 | 1 | **61.11** | 10.83 | 13.83 | 10.28 | 3.83 | 0.11 |
| 3 | 2 | 10.17 | **57.67** | 9.72 | 10.33 | 11.89 | 0.22 |
| 4 | 3 | 6.33 | 4.94 | **81.33** | 5.28 | 1.83 | 0.28 |
| 5 | 5 | 44.28 | 6.28 | 33.33 | 3.06 | **12.83** | 0.22 |
| 6 | 5 | 21.39 | 4.61 | 4.11 | 12.72 | **56.61** | 0.56 |
| 7 | 5 | 24.44 | 3.06 | 14.89 | 4.50 | **52.67** | 0.44 |
| 8 | 4 | 7.06 | 18.17 | 17.89 | **44.33** | 12.06 | 0.50 |
| 9 | 5 | 13.06 | 10.50 | 20.72 | 13.78 | **41.61** | 0.33 |
| 10 | 2 | 17.44 | **65.50** | 3.67 | 5.50 | 7.72 | 0.17 |
| 11 | 4 | 2.00 | 3.33 | 34.33 | **50.67** | 9.44 | 0.22 |
| 12 | 2 | 11.28 | **30.56** | 36.06 | 11.06 | 10.83 | 0.22 |
| 13 | 1 | **33.50** | 26.56 | 9.78 | 11.33 | 18.28 | 0.56 |
| 14 | 1 | **38.22** | 27.00 | 10.44 | 8.83 | 15.17 | 0.33 |
| 15 | 3 | 8.11 | 10.33 | **36.94** | 15.06 | 28.28 | 1.28 |
| 16 | 3 | 61.28 | 7.67 | **19.61** | 2.89 | 8.17 | 0.39 |
| 17 | 2 | 8.22 | **52.56** | 15.89 | 12.11 | 9.94 | 1.28 |
| 18 | 2 | 23.39 | **43.11** | 6.00 | 6.28 | 21.06 | 0.17 |
| 19 | 5 | 24.78 | 29.28 | 16.39 | 14.22 | **15.11** | 0.22 |
| 20 | 5 | 11.33 | 32.22 | 10.00 | 5.94 | **39.89** | 0.61 |
| 21 | 4 | 6.07 | 8.17 | 32.72 | **48.06** | 4.00 | 0.28 |
| 22 | 4 | 11.50 | 22.61 | 10.06 | **47.44** | 7.56 | 0.83 |
| 23 | 5 | 12.00 | 12.94 | 11.94 | 15.33 | **46.89** | 0.89 |
| 24 | 1 | **57.06** | 6.44 | 11.50 | 19.72 | 4.28 | 1.00 |
| 25 | 2 | 5.67 | **30.72** | 22.17 | 24.94 | 16.06 | 0.44 |
| 26 | 3 | 18.06 | 21.72 | **29.00** | 25.33 | 5.17 | 0.72 |
| 27 | 4 | 11.17 | 63.83 | 4.78 | **12.67** | 7.06 | 0.50 |
| 28 | 3 | 14.22 | 10.00 | **40.78** | 23.50 | 10.83 | 0.67 |
| 29 | 5 | 22.78 | 24.06 | 21.89 | 16.56 | **13.83** | 0.89 |
| 30 | 3 | 10.50 | 10.00 | **50.78** | 5.78 | 22.33 | 0.61 |
| 31 | 4 | 18.94 | 16.11 | 33.61 | **14.00** | 15.83 | 1.50 |
| 32 | 1 | **13.22** | 42.72 | 25.78 | 8.22 | 9.44 | 0.61 |
| 33 | 1 | **38.72** | 8.94 | 11.78 | 33.72 | 6.28 | 0.56 |
| 34 | 2 | 2.33 | **13.00** | 11.72 | 47.83 | 24.44 | 0.67 |
| 35 | 2 | 7.72 | **43.78** | 14.44 | 18.94 | 14.39 | 0.72 |
| 36 | 3 | 13.83 | 35.50 | **21.83** | 20.28 | 7.28 | 1.28 |
| 37 | 5 | 11.06 | 46.61 | 20.00 | 4.22 | **17.50** | 0.61 |
| 38 | 3 | 13.28 | 8.78 | **60.33** | 6.83 | 10.17 | 0.61 |
| 39 | 3 | 12.28 | 15.11 | **32.22** | 23.94 | 14.17 | 2.28 |
| 40 | 4 | 4.89 | 9.17 | 8.56 | **71.56** | 5.00 | 0.83 |
| 41 | 4 | 10.72 | 24.11 | 11.50 | **31.78** | 21.17 | 0.72 |
| 42 | 2 | 8.67 | **57.00** | 15.44 | 9.11 | 8.94 | 0.83 |
| 43 | 2 | 7.44 | **71.28** | 9.72 | 3.39 | 7.72 | 0.44 |
| 44 | 2 | 12.67 | **36.00** | 13.06 | 25.78 | 11.56 | 0.94 |
| 45 | 1 | **37.72** | 15.17 | 19.11 | 13.72 | 13.44 | 0.83 |
| 46 | 2 | 21.78 | **36.06** | 9.11 | 14.50 | 17.56 | 1.00 |
| 47 | 1 | **27.33** | 27.33 | 10.44 | 9.44 | 4.78 | 0.67 |
| 48 | 2 | 25.11 | **29.11** | 20.00 | 10.33 | 14.94 | 0.50 |
| 49 | 1 | **41.67** | 14.78 | 16.78 | 17.28 | 8.22 | 1.28 |
| 50 | 2 | 19.50 | **49.06** | 10.28 | 13.44 | 7.33 | 0.39 |

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු පසුබිමෙහි දක්වා ඇත.
* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ ශිෂ්‍ය ප්‍රතිශතයයි.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- ⋆ සමස්තයක් ලෙස සලකා බලන විට, බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත I පත්‍රයේ අංක 01, 02, 04, 10, 38, 40 සහ 43 යන ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් 60% ඉක්මවූ ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත.

- ⋆ අංක 05, 12, 13, 14, 15, 16, 19, 25, 26, 27, 29, 31, 32, 33, 34, 36, 37, 39, 41, 44, 45, 46 සහ 48 යන ප්‍රශ්න සඳහා නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ සමස්ත අපේක්ෂකයින් අතුරින් 40%කටත් අඩු ප්‍රතිශතයක් පමණි.

- ⋆ 5 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරා ඇති ප්‍රතිශතය 12.83%කි. මෙම ප්‍රශ්නයෙහිදී, භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතය පිළිබඳ ව දෙන ලද රූප සටහනක් ඇසුරින්, සමතුලිත ප්‍රමාණයේදී පාරිභෝගිකයින් ගෙවීමට කැමති මුළු මුදල් ප්‍රමාණය හඳුනාගැනීම අපේක්ෂා කළ ද, පාරිභෝගික අතිරික්තය සහ සමතුලිතයේදී පාරිභෝගික පැහැදම යන වරණ කෙරේ අපේක්ෂකයන් යොමුවීමක් පෙන්වා ඇත. එබැවින් වෙළෙඳපොළ සමතුලිතයේදී පාරිභෝගික අතිරික්තය, පාරිභෝගික පැහැදම සහ පාරිභෝගිකයින් ගෙවීමට කැමති මුදල් ප්‍රමාණ ගණනය කිරීම පිළිබඳ ව නිවැරදි අවබෝධයක් සිසුනට ලබාදිය යුතුය.

- ⋆ 12 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ පාරිභෝගිකයින් වෙත සහනාධාරයක් ලබාදීම නිසා වෙළෙඳපොළ සමතුලිතය කෙරෙහි ඇතිකරන බලපෑම නිවැරදිව හඳුනාගැනීම කෙරෙහි ය. අපේක්ෂකයින්ගෙන් 69%ක් පමණ වැරදි වරණ වෙත යොමුවීමෙන් පෙනීයන්නේ පාරිභෝගිකයින් වෙත ලබාදෙන සහනාධාරය ඍජුවම බලපානුයේ ඉල්ලුමට ද සැපයුමට ද යන්න නිශ්චිතව හඳුනාගැනීමට අපොහොසත් වීමත් ඒ නිසාම සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය වෙනස්වන ආකාරය නිශ්චය කර ගැනීමට නොහැකි වීමත් ය.

- ⋆ 13 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය, ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව මත බෙදී යන ආකාරය පරීක්ෂා කිරීම සඳහා ය. ඒ සම්බන්ධ අවබෝධය නොමැතිවීම නිසා අපේක්ෂකයින්ගෙන් 66%ක් වැරදි ප්‍රතිචාර දක්වා ඇත. එබැවින් ඒ පිළිබඳ ව නිශ්චිත අවබෝධයක් සිසුන්ට ලැබෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

- ⋆ 14 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ රජයේ මැදිහත්වීම හේතුවෙන් වෙළෙඳපොළෙහි හටගත හැකි ප්‍රතිවිපාක විමර්ශනය කිරීමට ය. එහිදී අපේක්ෂකයින්ගෙන් 62%ක් පමණ නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අපොහොසත් වී ඇත. එබැවින්, රජය විසින් වෙළෙඳපොළට ඇති කරන බලපෑම් සහ ඒවා ඉවත් කිරීමේදී හටගන්නා ප්‍රතිවිපාක පිළිබඳව සිසුන්ට අවබෝධයක් ලබාදිය යුතුය.

- ⋆ 16 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ නිෂ්පාදන ආයතනයක විචල්‍ය යෙදවුම් සහ ආන්තික පිරිවැය අතර සම්බන්ධතාව විමසීම කෙරෙහි ය. එහිදී විචල්‍ය යෙදවුමේ මිල ඉහළ ගිය විට මුළු පිරිවැය නිවැරදිව ඇස්තමේන්තු කිරීම මගින් ආන්තික පිරිවැය ගණනය කිරීමට අපොහොසත් වීම නිසා අපේක්ෂකයින්ගෙන් 80%ක් අසාර්ථක වී ඇත. එබැවින්, විචල්‍ය සාධක මිල වෙනස් වනවිට ආන්තික පිරිවැය වෙනස් වන ආකාරය පිළිබඳ ව සිසුන්ට දැනුම ලබාදීම වැදගත් වේ.

- ⋆ 19 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් වක්‍රයේ පිහිටීම මත වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය විමසීමට ය. එහිදී ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය තිරස් රේඛාවක් ලෙස පිහිටීමට සහ කර්මාන්තය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීමට බලපාන සාධක නිශ්චිතව තීරණය කිරීමේ දැනුම නොමැතිකමින් අපේක්ෂකයින්ගෙන් 85%ක් පමණ වැරදි පිළිතුරු කරා යොමු වී ඇත.

- ⋆ 25 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ සරල ආර්ථිකයක සමතුලිත නිමැවුම් මට්ටම පදනම් කරගෙන නිමැවුම් පරතරය තීරණය කිරීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමට ය. එහිදී අපේක්ෂකයින්ගෙන් 69%ක් සැබෑ නිමැවුම් මට්ටම සහ විභව නිමැවුම් මට්ටම (පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම) තීරණය කිරීමට අපොහොසත් වී ඇත. එබැවින් ප්‍රස්තාරිකව සමතුලිත නිමැවුම් මට්ටම හා විභව නිමැවුම් මට්ටම තීරණය කිරීමේ කුසලතා සිසුන්ට ලබාදිය යුතුය.

- 26 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතය සහ දළ දේශීය වියදම අතර වෙනසට බලපාන සාධක හඳුනා ගැනීම සඳහා ය. දළ දේශීය නිෂ්පාදිතය සහ දළ දේශීය වියදම අතර වෙනස ශුද්ධ අපනයන මගින් පෙන්නුම් කෙරේ. එහිදී ශුද්ධ අපනයනවල වටිනාකම ධන (+) අගයක් හෝ සෘණ (-) අගයක් ගත හැකි බවත් ශුද්ධ අපනයන සෘණ අගයක් ගන්නා විට දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ දේශීය වියදම ඉහළ අගයක් ගන්නා බවත් තීරණය කිරීමට සමත් වී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 29%ක් පමණි. එබැවින් ශුද්ධ අපනයන වටිනාකම ධන හෝ සෘණ අගයක් ගන්නා විට දළ දේශීය වියදම සහ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම් අතර වෙනස සංඛ්‍යාත්මකව ගණනය කිරීමේ කුසලතාව සිසුන්ට ලබාදිය යුතුය.

- 27 වන ප්‍රශ්නය වාණිජ බැංකු මුදල් මැවීම ආශ්‍රිත ගණනය කිරීම් හා බැඳේ. වාණිජ බැංකු පද්ධතිය තනි බැංකුවකින් සමන්විත වන විට ද ණය මැවිය හැකි බව අවබෝධ කරගෙන තිබුණේ 13%ටත් අඩු ඉතා සුළු ප්‍රතිශතයකි. බැංකු ගණනාවකින් යුත් බැංකු පද්ධතියකට මෙන්ම තනි බැංකුවකින් සමන්විත වන බැංකු පද්ධතියකට ද ණය මැවිය හැකි ආකාරය පිළිබඳ ව සිසුන්ට දැනුම ලබාදීම වැදගත් වේ.

- සාර්ව ආර්ථික අරමුණක් ලෙස මිල ස්ථායිතාව පවත්වා ගනිමින් ආයෝජන ඉහළ නැංවීමට මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යොදා ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධය 29 වන ප්‍රශ්නය මගින් පරීක්ෂාවට ලක් කෙරේ. එහිදී රාජ්‍ය ආයෝජනය ඉහළ නැංවීම නිසා බිහිවිය හැකි සමාහාර ඉල්ලුම ඉහළයාම, මිල අස්ථායිතාවට හේතුවන බැවින් මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය එකවර ප්‍රතිවිරුද්ධව යොදා ගැනීමේ හැකියාව සිසුන්ට අවබෝධය කර දිය යුතුය.

- 31 වන ප්‍රශ්නය MV = PY යන මුදල් ප්‍රමාණවාදී විනිමය සමීකරණයේ සංරචක සම්බන්ධය විශ්ලේෂණය කිරීමේ හැකියාව පරීක්ෂා කරයි. මුළු නිමැවුමේ ප්‍රතිශතක වෙනස, මුදල් තොගයේ ප්‍රතිශතක වෙනස පදනම් කරගනිමින් මිල මට්ටමේ වෙනස්වීම සහ නාමික ජාතික නිෂ්පාදිතයේ වෙනස්වීම නිවැරදිව හඳුනාගෙන ඇත්තේ 14%ක් වන අපේක්ෂකයින් පිරිසකි. එබැවින් විනිමය සමීකරණයට අදාළ සංරචක අතර ඇති සම්බන්ධතාව සංඛ්‍යාත්මක නිදසුන් මගින් අවධාරණය කෙරෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

- 32 වන ප්‍රශ්නය මගින් යම් දෙන ලද කාලපරිච්ඡේදයක් තුළ පවත්නා මිල යටතේ ගණනය කරනු ලබන නාමික දළ දේශීය නිෂ්පාදිත අගය වෙනස්වීම කෙරේ බලපාන සාධක පිළිබඳ අවබෝධය පරීක්ෂාවට යොමු කර ඇත. ඒ සඳහා නිවැරදි ප්‍රතිචාර දක්වා ඇත්තේ 13%ක් වැනි අඩු ශිෂ්‍ය සංඛ්‍යාවකි. දී ඇති දත්ත අනුව නිමැවුමේ පහළ වැටීමට සමාහාර ඉල්ලුම පහළ වැටීම බලපා ඇති බව තීරණය කිරීමට සිසුන්ගෙන් 87%ක් පමණ අසමත් වී ඇති බැවින් සමාහාර ඉල්ලුම සහ නාමික දළ දේශීය නිෂ්පාදිතය අතර සම්බන්ධය තහවුරු වන පරිදි විෂය කරුණු ඉගැන්විය යුතු වේ.

- පුද්ගල ආදායම සහ බදු අනුපාත ප්‍රතිශතය හැසිරෙන ආකාරය මත බදු වර්ග කිරීමේ අවබෝධය 35 වැනි ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරේ. ආදායම සහ බදු ප්‍රතිශතය මත බදු වර්ග කෙරෙන ආකාරය නිශ්චිතව තීරණය කිරීමට අපොහොසත්වීම නිසා 56%ක ශිෂ්‍ය ප්‍රතිශතයක් වැරදි ප්‍රතිචාර දක්වා තිබුණි. එබැවින් බදු ප්‍රතිශතය සහ ආදායම මත බදු වර්ග කෙරෙන ආකාරය පිළිබඳ නිශ්චිත දැනුම සිසුන් තුළ වර්ධනය වන ආකාරයට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය විය යුතුය.

- 34 වන ප්‍රශ්නය ශුභසාධන භාණ්ඩ පිළිබඳ දැනුම පරීක්ෂාවට යොමු වූවකි. වෙළෙඳපොළ මගින් සැපයෙන විට ප්‍රශස්ත පාරිභෝජන මට්ටමට වඩා අඩු පාරිභෝජන මට්ටමක් තීරණය වන බව නිගමනය කිරීමට සිසුන්ගෙන් 87%ක් අසමත් වී ඇත. එබැවින් වෙළෙඳපොළ අසමත් වන අවස්ථා සහ එහිදී රජය මැදිහත්වන අවස්ථා සැලකිල්ලට ගෙන, භාණ්ඩ වර්ගකිරීමේ හැකියාව සිසුනට ලබාදිය යුතුය.

- 36 වන ප්‍රශ්නය මගින් අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක හුවමාරු අනුපාතිකය තීරණය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙයි. එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින් අතුරින් 22%ට අඩු ප්‍රතිශතයකි. ආවස්ථික පිරිවැය ඇසුරෙන් අන්‍යොන්‍ය වශයෙන් වාසි සහගත හුවමාරුවක් සිදුවිය හැකි අනුපාත පරාසය තීරණය කෙරෙන ආකාරය පිළිබඳ ව අවබෝධයක් සිසුන්ට ලබාදිය යුතුය.

- 37 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ විදේශ ගනුදෙනු, ගෙවුම් ශේෂ ලේඛනයේ ගිණුම්වල නිවැරදි ලෙස ද්විත්ව සටහන් තැබෙන ආකාරය පිළිබඳ ව අවබෝධය පරීක්ෂා කිරීමට ය. අපේක්ෂකයින්ගෙන් 82% ක් වැරදි ප්‍රතිචාර දැක්වීම මගින් පැහැදිලි වන්නේ සිසුන් වැඩිදෙනකු තුළ එම කුසලතාව නොමැති බවයි. එබැවින් දෙන ලද විදේශ ගනුදෙනු, ගෙවුම් ශේෂ ලේඛනයේ ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳ දැනුම හා භාවිත කුසලතා ප්‍රවර්ධනය කළ යුතුය.

- 39 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ වෙළෙඳ අනුපාතිකය ගණනය කෙරෙන ආකාරය පිළිබඳ භාවිත කුසලතාව ඇගයීමට ය. එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 32%ක පමණ ප්‍රතිශතයකි. අපනයන මිල හා ආනයන මිල වෙනස්වීම් පිළිබඳ තොරතුරු ඇසුරෙන් වෙළෙඳ අනුපාතිකය ගණනය කිරීමේ කුසලතා සිසුන් තුළ වර්ධනය කළ යුතු වේ.

- ප්‍රාග්ධන සම්පාදන මාර්ගයක් ලෙස විදේශ ඍජු ආයෝජන යොදා ගැනීමේදී ඇතිවන බලපෑම පරීක්ෂා කිරීමට 41 වන ප්‍රශ්නය යොමු වී ඇත. අපේක්ෂකයින්ගෙන් 68%ක් පමණ අසාර්ථක වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ සිසුන් වැඩි දෙනකු එම දැනුම ලබා නොමැති බවයි. එබැවින් විදේශ ඍජු ආයෝජනවල ප්‍රතිලාභ හා පිරිවැය විග්‍රහ කිරීමට හැකි වන සේ සිසුන් තුළ දැනුම පුළුල් කළ යුතුය.

- 44 වන ප්‍රශ්නය යොමු කර ඇත්තේ ආර්ථික වෘද්ධිය තීරණය කරන සාධක වන ශුද්ධ ආයෝජනය හා එය තීරණය වන සාධක පිළිබඳ දැනුම හා අවබෝධය විමර්ශනය කිරීමට ය. අපේක්ෂකයින්ගෙන් 36%ක් පමණක් නිවැරදි පිළිතුර වෙත යොමුවීම මගින් පැහැදිලි වන්නේ උක්ත මාතෘකාව පිළිබඳ ව සිසුන්ගේ අවබෝධය තවදුරටත් සංවර්ධනය කළ යුතු බවයි.

- 45 වන ප්‍රශ්නය යොමු කර ඇත්තේ සැපයුම් පාර්ශ්වීය ප්‍රතිපත්ති උපකරණ හඳුනා ගැනීම කෙරෙහි ය. නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ ප්‍රතිශතය 38%කටත් අඩු වීම මගින් අනාවරණය වන්නේ එම කුසලතාව සිසුන් බහුතරයක් තුළ නොමැති බව ය. එබැවින් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රවර්ධනය කෙරෙන ඉගෙනුම් ක්‍රියාවලියක් වෙත යොමු විය යුතුය.

- 46 වන ප්‍රශ්නය යොමු වී ඇත්තේ ආදායම් කාණ්ඩ අතර ආදායම් ප්‍රතිශත බෙදී ගිය ආකාරය අනුව ආදායම් ව්‍යාප්තිය පිළිබඳ නිගමන දැක්වීම සම්බන්ධව ය. අපේක්ෂකයින්ගෙන් 64%ක් පමණ එම කුසලතාව ළඟා කරගෙන නොමැති හෙයින් සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යා වගු හා වක්‍ර ඇසුරෙන් එකී දැනුම ලබාදීමට කටයුතු කළ යුතුය.

- 48 වන ප්‍රශ්නය යොමු කර ඇත්තේ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ සිසුන්ගේ අවබෝධය මැනීම වෙත ය. සංවර්ධනය සඳහා වඩාත් යෝග්‍ය වන්නේ විදේශාධාරද, විදේශ වෙළෙඳාමද යන්න හේතු සහිතව තීරණය කිරීමේදී සිසුන් තුළ වූ අවබෝධය ප්‍රමාණවත් නොවන බව අපේක්ෂකයින්ගෙන් 71%ක් පමණ වැරදි වරණ වෙත යොමුවීම මගින් අනාවරණය වේ. එබැවින් සංවර්ධන ප්‍රතිපත්ති ලෙස විදේශාධාර හා විදේශ වෙළෙඳාම තුලනාත්මකව විග්‍රහ කිරීම පිළිබඳ සිසුන්ගේ දැනුම ප්‍රවර්ධනය කළ යුතුය.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

'අ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| II පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| අවසාන ලකුණ = 200 ÷ 2 | | = | 100 |

2.2.2. **II** ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4.1 සහ 4.2 ඇසුරින් ඉදිරිපත් කර ඇත.

**"අ" කොටස**

## 01 ප්‍රශ්නය

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

1. (i) 'ප්‍රාග්ධනය' හා 'මානව ප්‍රාග්ධනය' අතර වෙනස කුමක් ද? *(ලකුණු 04 යි)*

(ii) විශේෂීකරණය හා ශ්‍රම විභජනය නගාලීම සඳහා මුදල් උපකාරී වන්නේ කුමන ආකාරයෙන් ද? *(ලකුණු 04 යි)*

(iii) හිඟකම පිළිබඳ ගැටලුවට මුහුණ දෙමින් ආර්ථිකය මෙහෙයවීමේ දී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් හා විධානගත ආර්ථික පද්ධතියක් එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ ද'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iv) ආර්ථිකයේ සම්පත් කාර්යක්ෂම ව උපයෝජනය වේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේ ද? *(ලකුණු 04 යි)*

(v) ආර්ථිකයේ සූක්ෂ්ම හා සාර්ව ආර්ථික ගැටලු පැහැදිලි කිරීම සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය යොදා ගත හැක්කේ කෙසේ ද? *(ලකුණු 04 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i) - ප්‍රාග්ධනය යනු නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන සාධකයක් වේ. කර්මාන්තශාලා, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, අමුද්‍රව්‍ය තොග යනාදී මූර්ත වත්කම් ප්‍රාග්ධනයට ඇතුළත් වේ.

- මානව ප්‍රාග්ධනය යන්නෙන් අදහස් කෙරෙන්නේ කිසියම් පුද්ගලයකු විසින් අධ්‍යාපනය, පුහුණුව හා අත්දැකීම් මගින් අත්කර ගනු ලැබූ නිපුණතා, දැනුම, සමාජීය හා පෞරුෂත්ව ගුණාංග සම්භාරයයි. (ලකුණු 02යි)

- මානව ප්‍රාග්ධනය භෞතික ප්‍රාග්ධනය මෙන් ස්පර්ශ කළ හැකි වත්කමක් නොවේ.

- ශ්‍රමය හා ප්‍රාග්ධනය යන සාධක දෙකෙහිම ඇතැම් ගුණාංග මානව ප්‍රාග්ධනය තුළ මිශ්‍ර වී ඇත.

- වෙනත් වත්කම්වල කරනු ලබන ආයෝජනය මෙන් නොව මානව ප්‍රාග්ධනය තුළ කරනු ලබන ආයෝජනය අදාළ පුද්ගලයාට පමණක් සුවිශේෂිතව පවතී.

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(ii) - විශේෂ ප්‍රාගුණ්‍යනය හා ශ්‍රමික විභජනය සමග වෙළෙඳාම ද එකිනෙකට බැඳී පවතී. කිසියම් එක් සාධකයක් හෝ සේවාවක් හෝ පමණක් නිෂ්පාදනයෙහි යෙදී සිටින පුද්ගලයකුට, තමන්ට අවශ්‍ය කරන අවශේෂ භාණ්ඩ ලබාගැනීම සඳහා තම නිෂ්පාදනයෙන් වැඩි කොටසක් වෙළෙඳාම් කරගත යුතුය.

- අතීතයේදී මෙම වෙළෙඳාම සිදුවූයේ භාණ්ඩයට භාණ්ඩයක් ලෙස සෘජු හුවමාරු ක්‍රමයකට ය. එහෙත් එය අතිශයින් දුෂ්කර හා වියදම් අධික ක්‍රමයක් වූ අතර වුවමනා පිළිබඳ ද්විත්ව සම්පාතයක් ඇති කර ගැනීමේ ගැටලුව නිසා විශේෂ ප්‍රාගුණ්‍යනයට ඇති ඉඩකඩ ද බෙහෙවින් සීමාවිය.

- බඩු හුවමාරු ක්‍රමය යටතේ පැන නැගුණු දුෂ්කරතා ඉවත් කරගැනීම සඳහා මුදලේ භාවිතය ඉවහල් වූයේය. වී ගොවිතැන් කරන ගොවියකුට රෙදි අවශ්‍ය වූයේ නම්, දැන් ඔහු තම වී නිෂ්පාදනයේ අතිරික්තයෙන් කොටසක් මුදලට හුවමාරු කොට එම මුදල් යොදා රෙදි හා වෙනත් භාණ්ඩ පහසුවෙන් මිල දී ගනී.

- බඩු හුවමාරු ක්‍රමයේ පැවැති දුෂ්කරතා ඉවත් කිරීම මගින් මුදල්, වෙළෙඳාමට හා විශේෂ ප්‍රාගුණ්‍යනය පුළුල් වීමට විශාල ඉඩක් සලසා ඇත.

- මුදල් ආර්ථික ක්‍රමයක, පුද්ගලයෝ තමන්ට වඩාත් නිපුණතාව හා හැකියාව ඇති අංශ විශේෂ ප්‍රාගුණ්‍යනය සඳහා තෝරා ගනිති. එමගින් තමන්ගේ අවශ්‍යතාවට වඩා වැඩි අතිරික්ත නිෂ්පාදනයක් වෙළෙඳපොළ සඳහා බිහිකරති. ඔවුහු මෙම වෙළෙඳපොළ අතිරික්තය, මුදලට පෙරළා ගෙන තමන්ට අවශ්‍ය සෙසු භාණ්ඩ මිල දී ගනිති.

- ශ්‍රම විභජනය වැනි සංකීර්ණ ක්‍රියාවලියක් සාර්ථක වනුයේ විශාල වෙළෙඳපොළක් පවතින විටදී ය. මුදල් භාවිතය නිසා හුවමාරුව කාර්යක්ෂම වීම කරණ කොට, විශාල වෙළෙඳපොළක් ඒ සඳහා විවෘත කර ගැනීමට හැකියාව ලැබේ.

**(ඕනෑම කරුණු එකකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iii) **වෙළෙඳපොළ පද්ධතිය :**

- සම්පත් පිළිබඳ පෞද්ගලික හිමිකම, වෙළෙඳපොළ හා මිල යන්ත්‍රණය මගින් සිදුවන සම්බන්ධීකරණ ඔස්සේ ආර්ථිකය මෙහෙයවීම, වෙළෙඳපොළ ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණය වේ. **(ලකුණු 01යි)**

- එම ක්‍රමය තුළ ආර්ථික කටයුතුවලට සහභාගි වන සෑම ඒකකයක්ම, තම තමන්ගේ ස්වාර්ථය උදෙසා වෙහෙසන අතර, සෑම පුද්ගලයෙක් හා ආයතනයක්ම, තෘප්තිය හෝ ලාභය උපරිම වන ආකාරයට පරිභෝජන හා නිෂ්පාදන තීරණ ගනී.

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා සම්පත් සැපයීම තම තමන්ගේ අභිමතය හා හැකියාව පරිදි සිදුවේ. භාණ්ඩ හා නිෂ්පාදන සම්පත් මිලදී ගන්නන් හා සපයන්නන් එකිනෙකාට ස්වාධීනව තරග කිරීමට ක්‍රියාකරන අතර, ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය අතිශයින් විකේන්ද්‍රණය වී පවතී.

- පෞද්ගලික දේපොළ ආරක්ෂා කිරීමට සහ වෙළෙඳපොළට කාර්යක්ෂමව ක්‍රියාත්මකවීමට අවශ්‍ය හිතකර වාතාවරණය සැපයීමට ආණ්ඩුවේ කාර්යභාරය සීමා වේ. **(ලකුණු 01යි)**

(iii) **විධානගත ආර්ථික පද්ධතිය :**

- මෙම ක්‍රමය තුළ සියලුම දේපොළ සම්පත් ආණ්ඩුව හිමිකර ගනු ලබන අතර, ආර්ථික තීරණ ගැනීම සිදුවනුයේ මධ්‍යගත ආර්ථික සැලැස්මක් මගිනි. සම්පත් භාවිත කෙරෙන ආකාරය, නිමැවුමේ සංයුතිය හා බෙදාහැරීම, නිෂ්පාදනය සංවිධානය කිරීම යන කරුණුවලට අදාළ සියලුම වැදගත් තීරණ ගනු ලබනුයේ ආණ්ඩුව විසින් පත්කරනු ලබන මධ්‍යගත සැලසුම් මණ්ඩලය විසිනි.

- සියලුම නිෂ්පාදන ආයතන ආණ්ඩුව සතුවන අතර, ඒවා නිෂ්පාදනය කරනුයේ ආණ්ඩුව ලබාදෙන නියෝගවලට අනුව ය.

- එක් එක් නිෂ්පාදන ආයතනයේ නිමැවුම් ඉලක්ක සහ ඒවා සාක්ෂාත් කරගැනීමට ඒ ඒ ආයතනයට වෙන් කරනු ලබන සම්පත් ප්‍රමාණය තීරණය කෙරෙන්නේ ද මධ්‍යම සැලසුම් මණ්ඩලය විසිනි.

- නිමැවුම, ප්‍රාග්ධන භාණ්ඩ හා පරිභෝජන භාණ්ඩ අතර බෙදා වෙන් කරනු ලබන ආකාරයත් කර්මාන්ත අතර ප්‍රාග්ධන භාණ්ඩ බෙදා වෙන් කෙරෙන ආකාරයත් තීරණය කරනුයේ ද මධ්‍යම සැලැසුම් මණ්ඩලයේ දිගුකාලීන ආර්ථික ප්‍රමුඛතා මත ය. **(ලකුණු 02යි)**

[විකල්ප පිළිතුර :
වෙළෙඳපොළ ආර්ථිකය :
- මූලික ආර්ථික ප්‍රශ්න වන කුමක්, කොපමණ, කා සඳහා නිෂ්පාදනය කරනවාද යන කරුණු මිල යන්ත්‍රණය මගින් විසඳා ගැනේ. ලාභයක් සහිතව නිපදවිය හැකි භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන අතර, පාඩුවක් හට ගන්නා භාණ්ඩ නිෂ්පාදනය නොකෙරේ. භාණ්ඩ හා සාධක වෙළෙඳපොළවලින් ලැබෙන මිල සංඥා පදනම් කර ගනිමින් අදාළ තීරණ ගනු ලැබේ.

- වෙළෙඳපොළ ක්‍රමය තුළ නිෂ්පාදකයෝ පවත්නා තාක්ෂණය සහ සාධක මිල අනුව වඩාත් කාර්යක්ෂමව නිෂ්පාදන ශිල්ප ක්‍රම තෝරා ගනිති.

- පෞද්ගලික ආදායම් තීරණය වනුයේ පුද්ගලයන් සතු ඵලදායි සම්පත් ප්‍රමාණය හා ඒවාට සාධක වෙළෙඳපොළෙහි ලැබෙන මිල ගණන් අනුව ය. සාධක මිල තීරණය වන්නේ සාධක වෙළෙඳපොළෙහි ඉල්ලුම සහ සැපයුම මතයි.

(ලකුණු 2යි)]

විධානගත ආර්ථිකය :
- විධානගත ආර්ථිකයක සම්පත් බෙදීයාම සිදු වනුයේ මධ්‍යම සැලසුම් අධිකාරිය විසින් ලබා දෙන නියෝග මගිනි. මෙහිදී ඔවුන් භාණ්ඩවල මිල නියම කරනු ලබන අතර, එම පාලන මිලේදී කොපමණ මිල දී ගන්නවා ද යන්න පාරිභෝගිකයෝ තීරණය කරති.

- නිෂ්පාදන ක්‍රම ශිල්ප තේරීම කරනු ලබන්නේ ද මධ්‍යම සැලසුම් අධිකාරිය විසිනි.

- නිමැවුම හා ආදායම බෙදීයාම ද මූලික වශයෙන් සැලසුම් අධිකාරිය තීරණය කරයි. අවම වැටුප් අනුපාතික සහ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ද තීරණය කරනුයේ සැලසුම් අධිකාරියයි.

(ලකුණු 2යි)

(iv) - නිෂ්පාදන කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කෙරෙනුයේ අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ අදාළ භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීම ය. (එනම් දෙන ලද යෙදවුම් ප්‍රමාණයකින් උපරිම නිමැවුමක් ලබාගැනීම හෝ දෙන ලද නිමැවුමක් අවම යෙදවුම් ප්‍රමාණයකින් නිපදවීම හෝ මින් අදහස් වේ.)

(ලකුණු 1යි)

- නිෂ්පාදන කාර්යක්ෂමතාව සඳහා අවශ්‍යතා දෙකක් සපුරාලිය යුතු වේ.
  (i) පූර්ණ සේවා නියුක්තිය හා
  (ii) පූර්ණ නිෂ්පාදනය
  එම අවශ්‍යතා වේ.

(ලකුණු 1යි)

- සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව යනු සමාජයට වඩාත් අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා සමාජය සතු සීමාසහිත සම්පත් යොදා ගැනීම ය.

(ලකුණු 1යි)

- මෙම අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා සෑම භාණ්ඩයකම ආන්තික පිරිවැය එහි ආන්තික ප්‍රතිලාභයට සමාන විය යුතුය. එනම් MC = P වශයෙනි.

(ලකුණු 1යි)

(v) - සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක විශ්ලේෂණය ඔස්සේ ආර්ථිකයේ විවිධ කොටස්වල ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කරනු ලබන අතර සාර්ව ආර්ථික විශ්ලේෂණයේදී සමස්ත ආර්ථිකයේ ව්‍යුහය හා සාධනය විශ්ලේෂණය කෙරේ.

- සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක භාවිත :
  (i) හිඟකම
  (ii) තේරීම් කිරීම
  (iii) තේරීම් නිසා හට ගන්නා ආවස්ථික පිරිවැය විග්‍රහ කිරීම
  (iv) තාක්ෂණයේ වෙනස්වීම නිසා ඇතිවන ප්‍රතිඵල

**(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02යි)**

- සාර්ව ආර්ථික විද්‍යාත්මක භාවිත :
  (i) පූර්ණසේවා නියුක්තිය සහ ඌන සේවා නියුක්තිය
  (ii) ආර්ථික වෘද්ධිය
  (iii) ආර්ථික පසුබෑසීම් හා අවපාත
  (iv) ආර්ථික බිඳ වැටීම

**(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02යි)**




ආවස්ථික පිරිවැය හා තේරීම




හිඟකම




ආහාර නිෂ්පාදන අංශයේ තාක්ෂණික දියුණුව




ආර්ථික වෘද්ධිය

**(පිළිතුරට රූප සටහන් අවශ්‍ය නොවේ.)**

**01 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 97%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 54%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 12%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 3%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 05ක් ඇත. පහසුතාව අඩුම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 10%කි. එමෙන්ම (iii) කොටස පහසුම කොටස වී ඇති අතර එහි පහසුතාව 47%කි.

- ⋆ (i) කොටසෙහි පහසුතාව 36%කි. ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය නිශ්චිතව අර්ථ දැක්වීමට නොහැකිවීම මත සාධන මට්ටමේ ඌනතාවක් පැවතිණි. එමෙන්ම සමහර සිසුන් සංකල්ප දෙකෙන් එකක් පමණක් අර්ථ දක්වා තිබීම ද ප්‍රශ්නයෙහි පහසුතාව අඩුවීමට බලපෑ සාධකයකි. එබැවින් සංකල්ප අතර වෙනස විමසන විටකදී සංකල්ප දෙකම අර්ථ දැක්වීමටත් ඊට ම සීමා නොවී විකල්ප වෙනස්කම් දැක්වීමටත් අවබෝධය හා කුසලතාව සිසුනට ලබාදිය යුතුය.

- ⋆ (ii) කොටසේ පහසුතාව 10%ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයකි. විශේෂීකරණය හා ශ්‍රම විභජනය සහ මුදල් භාවිතය අතර ඇති සම්බන්ධතාව විග්‍රහ කිරීමේ හැකියාව විමසීමට යොමු වූ ප්‍රශ්නයකි. සිසුන් තුළ විශේෂීකරණය හා ශ්‍රම විභජනය සහ මුදල් යන සංකල්ප පැහැදිලි කිරීමේ කුසලතාව පැවතියත් ඒවා අතර සම්බන්ධතාව ගොඩනැගීමට අවශ්‍ය කුසලතාව නොතිබිණි. එබැවින් ප්‍රශ්නයෙහි දුෂ්කරතාව 90%ක් වී ඇති අතර, එසේ පැවතීම අසතුටුදායක තත්ත්වයකි. පිළිතුර පැහැදිලි කිරීමේදී, ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍යය සමග වෙළෙඳාම බැඳී පවතින බව සහ බඩු හුවමාරු යුගයේ පැවති දුෂ්කරතා ඉවත් කිරීමට මුදල් භාවිතය උපකාරී වීම ද ඒ නිසාම ශ්‍රම විභජනය හා විශේෂීකරණය සඳහා පුද්ගලයින්ට යොමුවීමට හැකිවූ බව ද පැහැදිලි කිරීමේ කුසලතාව සහ නිර්මාණශීලි බව සිසුන් තුළ සංවර්ධනය කළ යුතුය.

- ⋆ පළමුවන ප්‍රශ්නයේ ඉහළ ම පහසුතාව සහිත මෙම (iii) වන කොටස වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් සහ විධානගත ආර්ථික පද්ධතියක් අතර වෙනස පැහැදිලි කිරීමේ කුසලතාව පරීක්ෂාවට යොමු වූවකි. මෙහි පහසුතාව 47%ක් වූ අතර පසුගිය ප්‍රශ්න පත්‍රවල ද නිරන්තරයෙන් විමසීමට යොමු වූ විෂය කරුණු හා බැඳී පවතී. එහෙත් 53%ක් පමණ දුෂ්කරතාවක් තවමත් පැවතීම සතුටුදායක නොවන බැවින්, ආර්ථික පද්ධති අතර වෙනස්කම් නිශ්චිතව විග්‍රහ කිරීමේ හැකියාව සිසුනට ලබාදීම කෙරෙහි අවධානය යොමු විය යුතුය.

★ මෙහි (iv) වන කොටස මගින් ආර්ථිකයක් සතු හිඟ සම්පත්, කාර්යක්ෂමව නිෂ්පාදනයට භාවිතවීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි විමසීමට යොමු වූ අතර එහි පහසුතාව 36%ක් විය. ඒ සඳහා නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව යන කොන්දේසි දෙකම ඉටු වීම අවශ්‍ය බවත් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව ඉටු වීමට තවත් අවශ්‍යතා දෙකක් එනම් පූර්ණ සේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය යන කරුණු සපුරාලිය යුතු බවත් දැක්වීමට බහුතරයක් සිසුන් අසමත් වී ඇත. එබැවින් විෂය සංකල්ප ආශ්‍රිතව බැඳී පවතින කරුණු ඉස්මතුවන අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දියුණු කරගත යුතුය.

★ (v) වන කොටස ආර්ථික විද්‍යාවේ ප්‍රධාන පැතිකඩ දෙක වන සූක්ෂ්ම ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව සමඟ බැඳී පවතින සංකල්ප හා ඒවා නිෂ්පාදන හැකියා වක්‍රයක් ඇසුරින් පැහැදිලි කිරීමේ කුසලතාව පරීක්ෂණයට යොමුවූ ප්‍රශ්නයකි. මෙහි පහසුතාව 18%කි. එය සතුටුදායක මට්ටමක් නොවන්නේ මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂිත සංකල්ප සහ ඒවා නිරූපණය සඳහා නිෂ්පාදන හැකියා වක්‍රය යොදා ගනු ලබන ආකාරය බොහෝ තැන්හිදී භාවිත වන බැවිනි. එබැවින් එම දුෂ්කරතා කෙරෙහි අවධානය යොමු කර සිසුන් අභ්‍යාස සඳහා යොමු කිරීමෙන් සාධනය ඉහළ නංවා ගත හැකිය.

## 02 ප්‍රශ්නය

2. (i) සංඥා සැපයීමෙහි හා සලාකනයෙහි ලා වෙළෙඳපොළ මිල විසින් ඉටුකරනු ලබන කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) කිසියම් කාර්මික භාණ්ඩයක සැපයුම තීරණය කරන, **මිල නොවන** ප්‍රධාන සාධක **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛනවලට අදාළ දත්ත සමහරක් පහත දී ඇත.

| මිල (රු.) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ($Q_d$) | සැපයුම් කරනු ලබන ප්‍රමාණය ($Q_s$) |
|---|---|---|
| 4 | 84 | 12 |
| 8 | 68 | 44 |

ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙක ම රේඛීය වක්‍ර වේ යයි උපකල්පනය කොට, වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සඳහා අදාළ සමීකරණ ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 04 යි)

(iv) ඉල්ලුම් හා සැපයුම් සමීකරණ උපයෝගී කරගනිමින්, සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(v) රජය භාණ්ඩ ඒකකයක් මත රු. 3ක විශේෂිත බද්දක් පනවන්නේ යැ'යි උපකල්පනය කරමින්, බද්ද පැනවීමෙන් පසු නිෂ්පාදකයන්ට ලැබුණු මිල හා රජයේ බදු අයභාරය ගණනය කරන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) සංඥා සැපයීමේ කාර්යය (තොරතුරු සැපයීමේ කාර්යය)

- වෙළෙඳපොළ ක්‍රමය තුළ පාරිභෝගිකයන්ට, නිෂ්පාදකයන්ට සහ නිෂ්පාදන සම්පත් හිමියන්ට කුමක්, කොපමණ ප්‍රමාණයකින් මිල දී ගන්නවා ද සපයනවා ද යන්න තීරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාපේක්ෂ මිල ගණන් පිළිබඳ තොරතුරු මිල සංඥා මගින් ලබා දුනහොත් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය අකාර්යක්ෂම වන අතර, එය වෙළෙඳපොළ අසමත්වීම්වලට තුඩුදේ.

(ලකුණු 02යි)

- වෙළෙඳපොළ ක්‍රමය තුළ සීමිත සම්පත්, භාණ්ඩ හා සේවා යනාදිය, ඒවා මිල දී ගැනීමට වඩාත් කැමැත්තක් දක්වන සහ වඩාත් හැකියාව ඇති පුද්ගලයන්ට ලබාදීමේ ලා, සලාකනය කිරීම සිදුවන්නේ ද මිල මගිනි. කිසියම් භාණ්ඩයක හෝ සේවාවක මිල වැඩි නම් එය මිල දී ගැනීමට කැමති පිරිස අඩුවන අතර, මිල අඩු නම් වැඩි දෙනෙක් මිල දී ගැනීමට පෙළැඹෙති. පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් මිල සංඥාවලට ප්‍රතිචාර දක්වන විට හිඟ සම්පත් විකල්ප භාවිත අතර සලාකනය වන අතර, මිල ගණන්, සම්පත් බෙදා වෙන් කිරීමේ යන්ත්‍රණය ලෙස ක්‍රියා කරයි.

(ලකුණු 02යි)

(ii) - භාණ්ඩය නිෂ්පාදනය කිරීමට යොදා ගැනෙන යෙදවුම්වල මිල ගණන්
- සම්බන්ධිත භාණ්ඩවල මිල
- තාක්ෂණය
- නිෂ්පාදන බදු සහ සහනාධාර
- වෙළෙඳපොළ අපේක්ෂා
- සැපයුම්කරුවන් සංඛ්‍යාව

**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iii) ඉල්ලුම් සමීකරණය : $Q_d = a - bP$

- $Q_d = 100 - 4P$ **(ලකුණු 02යි)**

සැපයුම් සමීකරණය : $Q_S = a + bP$

- $Q_S = -20 + 8P$ **(ලකුණු 02යි)**

(iv) සමතුලිත මිල හා ප්‍රමාණය

$Q_d = Q_S$

$100 - 4P = -20 + 8P$

$120 = 12P$

$10 = P$ **(ලකුණු 02යි)**

$Q_d = 100 - 4(10)$

$= 60$ **(ලකුණු 02යි)**

(v) බද්දක් පැන වූ පසු නිෂ්පාදකයන්ට ලැබුණු මිල සහ රජයේ අයභාරය :

$Q_d = 100 - 4P_b$

$Q_d = -20 + 8P_S$

$P_b = P_S + t$

$100 - 4(P_S + t) = -20 + 8P_S$

$100 - 4(P_S + 3) = -20 + 8P_S$

$100 - 4P_S - 12) = -20 + 8P_S$

$108 = 12P_S$

$9 = P_S$

**(ලකුණු 02යි)**

බදු අයභාරය :

බද්දට පසු අලෙවි කළ ප්‍රමාණය × ඒකක බද්ද

$Q_S = -20 + 8(9) = 52$

බදු අයභාරය $= 52 \times 3 = 156$ **(ලකුණු 02යි)**

## 02 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :




02 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 89%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 39%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 20%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 5කින් සමන්විත වේ. එහි අඩුම පහසුතාව ඇත්තේ (v) වන කොටසට වන අතර එහි පහසුතාව 32%කි. ඉහළම පහසුතාව වන 65%, (iii) කොටසට හිමි වී ඇත. (ii) වන සහ (iv) වන කොටස්වල පහසුතා පිළිවෙළින් 55% සහ 62% කි.

- ★ (i) කොටසේ පහසුතාව 41%කි. වෙළෙඳපොළ මිල මගින් ඉටු කෙරෙන කාර්යයන් විමසෙන මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරෙහි, සංඥා සැපයීම හා සලාකනය කිරීම යන කාර්යයන් දෙක වෙන් වෙන්ව විස්තර කිරීමෙහිලා අපොහොසත්වීමක් විද්‍යාමාන විය. එබැවින් වෙළෙඳපොළ මිල මගින් ඉටුකෙරෙන කාර්යයන් තුනම, එනම් සංඥා සැපයීම, සලාකනය හා සානුබල සැපයීම යනාදිය උදාහරණ සහිතව විස්තරාත්මකව පැහැදිලි කිරීමේ දැනුම ලබාදීමට කටයුතු කළ යුතුය.

- ★ (ii) කොටස මගින් “භාණ්ඩයක සැපයුම” වෙනුවට, “කාර්මික භාණ්ඩයක” සැපයුම තීරණය කරන සාධක විමසා ඇත. ඇතැම් ශිෂ්‍යයින් පොදුවේ සැපයුම් තීරක පිළිතුරු ලෙස ඉදිරිපත් කර තිබූ අතර මිල නොවන සාධක වැඩි අවධාරණයකින් විමසා ඇතත් මිල ද සහිත ව පිළිතුර ඉදිරිපත් කර තිබුණි. භාණ්ඩයේ ස්වභාවය අනුව සැපයුම් තීරකවල විය හැකි වෙනස්කම් අවධාරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීම වැදගත් ය. කෙසේ වෙතත් මෙහි පහසුතාව 55%කි.

- ★ (iii) කොටසේදී, දෙන ලද සංඛ්‍යා දත්ත ඇසුරින් ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය ගොඩනගා ගැනීම අපේක්‍ෂා කෙරේ. දෙවැනි ප්‍රශ්නයේ වඩාත් ම ඉහළ පහසුතාව පෙන්වන්නේ මෙම කොටස මගිනි. එය 65%කි. ලේඛන ඇසුරින් සමීකරණ ගොඩ නැගීමත්, ඒ ඇසුරින් ප්‍රස්තාර ඇඳීම හා ගණනය කිරීමත් කෙරෙහි ශිෂ්‍යයා වැඩි දක්‍ෂතාවක් පෙන්වන බව හැඟේ.

⋆ (iv) කොටස, (iii) කොටස හා බැඳේ. එයද ගණිතමය කොටසක් වන අතර පහසුතාව 62%කි. සමීකරණ මගින් අවශ්‍ය විසඳුම් ලබාගැනීමට තවදුරටත් හුරු කරවීමෙන් ශිෂ්‍යයාට පහසුවෙන් ලකුණු අත්කර ගැනීමට අවස්ථාව ලබාදිය හැකිය.

⋆ (v) කොටස, මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම කොටසයි. එහි පහසුතාව 32%කි. ඉල්ලුම් සැපයුම් සමීකරණ ගොඩනගා ගත හැකි වුවත් ඒවාට බදු ගළපා ගැනීමට අපොහොසත් බවක් පෙන්වයි. සංකීර්ණ ගණිත කර්ම නොවන මෙවැනි අභ්‍යාසවලට ශිෂ්‍යයා තව තවත් හුරුකරවීම අවශ්‍ය ය.

## 03 ප්‍රශ්නය

**3. (i) හීනවන ඵලද නීතිය හා පරිමාණානුකූල ඵල නීතිය නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන්නේ කෙසේ ද'යි පැහැදිලි කරන්න.** *(ලකුණු 04 යි)*

**(ii) ආයතනයක ආන්තික පිරිවැය වක්‍රය හා එම ආයතනය අයත් කර්මාන්තයේ සැපයුම් වක්‍රය අතර සබඳතාවක් පවතින්නේ ද යන්න සාකච්ඡා කරන්න.** *(ලකුණු 04 යි)*

**(iii) පූර්ණ තරගකාරී ආයතනයක් තිරස් ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙන අතර, එම කර්මාන්තය පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙන්නේ මන් ද'යි පැහැදිලි කරන්න.** *(ලකුණු 04 යි)*

**(iv) කෙටි කාලයෙහි නිෂ්පාදනයෙහි නිරත ව සිටින ආයතනයක මුළු අයභාරය රු. මිලියන 100 ක් බවත්, මුළු පිරිවැය රු. මිලියන 120 ක් බවත්, මුළු ස්ථාවර පිරිවැය රු. මිලියන 40 ක් බවත් වාර්තා කරයි. මෙම තත්ත්වය යටතේ එම ආයතනය තවදුරටත් නිෂ්පාදනයේ රැඳී සිටිය යුතු ද? එසේ නම් ඒ ඇයි?** *(ලකුණු 04 යි)*

**(v) සෑම වෙළෙඳපොළ ව්‍යුහයක ම ලාභ උපරිමනය සඳහා ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි? නිෂ්පාදන ආයතනය පූර්ණ තරගකාරී ආයතනයක් වේ නම්, ආන්තික අයභාරය = ආන්තික පිරිවැය (MR = MC) කොන්දේසිය යටතේ, ආන්තික අයභාරය (MR) වෙනුවට මිල (P) ආදේශ කළ හැක්කේ කුමක් නිසා ද'යි පැහැදිලි කරන්න.** *(ලකුණු 04 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (i) නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන තාක්ෂණය මත ආයතනයේ පිරිවැය තීරණය වේ. හීනවන ඵලදා නීතියට අනුව ස්ථාවර සම්පත් ප්‍රමාණයක් මත, විචල්‍ය යෙදවුම ක්‍රම ක්‍රමයෙන් වැඩි කරන විට, ආන්තික හා සාමාන්‍ය ඵලදායිතාව ඉහළ නගින අතර, ආන්තික සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ බසී.

ආන්තික ඵලදාව උපරිම වන ලක්ෂ්‍යයේදී ආන්තික පිරිවැය අවම අගයක් ගනී. තවදුරටත් විචල්‍ය යෙදවුම වැඩි කරන විට ආන්තික ඵලදාව පහළ බසින අතර, ආන්තික පිරිවැය ඉහළ නගී. එහෙත් සාමාන්‍ය ඵලදාව තවදුරටත් ඉහළ නගින අතර, ආන්තික සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය ද තවදුරටත් පහළ බසිමින් පවතී.

සාමාන්‍ය ඵලදාව උපරිම අගයක් අත්කර ගන්නා අවස්ථාවේදී, සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවම අගයක් ගන්නා අතර, තවදුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කරන විට සාමාන්‍ය ඵලදාව පහළ බසියි; සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහළ නගී.

(ලකුණු 02යි)

- දිගු කාලයේදී නිෂ්පාදන ක්‍රියාවලිය පරිමාණානුකූල ඵල නීතියට යටත් වන අතර දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පැතලි U - අකුරක හැඩයක් ගනුයේ පරිමාණානුකූල පිරිමැසුම් සහ නොපිරිමැසුම් නිසා ය.

ධාරිතාව ප්‍රසාරණය කරන විට හට ගන්නා වැඩි වන පරිමාණානුකූල ඵල නිසා සාමාන්‍ය පිරිවැය අඩු වේ. ධාරිතාව ප්‍රසාරණය කරන විට හට ගන්නා අඩුවන පරිමාණානුකූල ඵල නිසා සාමාන්‍ය පිරිවැය ඉහළ නගී. ධාරිතාව ප්‍රසාරණය කරන විට ස්ථාවර පරිමාණානුකූල ඵල හට ගැනීම නිසා සාමාන්‍ය පිරිවැය නොවෙනස්ව පවතී.

(ලකුණු 02යි)

(ii) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් සපයනුයේ, ලාභය උපරිම කෙරෙන හෝ අලාභය අවම කෙරෙන නිමවුම් ප්‍රමාණයකි. මෙය අත්කර ගනුයේ ආන්තික අයභාරය හා ආන්තික පිරිවැය එකිනෙකට සමාන වන නිමැවුම් ප්‍රමාණයක් නිපදවීමෙනි. එබැවින් පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම් වක්‍රය වනුයේ, අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහළින් පවත්නා ආන්තික පිරිවැය වක්‍රයේ ඉහළ නගින කොටසයි. **(ලකුණු 02යි)**

කර්මාන්තයේ සැපයුම් වක්‍රය පෙන්නුම් කරන්නේ, එක් එක් ආයතනයේ ධාරිතාව සහ කර්මාන්තය තුළ සිටින ආයතන සංඛ්‍යාව නොවෙනස්ව පවතින විට ඒ ඒ මිලෙහිදී මුළු කර්මාන්තය විසින් ම සපයනු ලබන ප්‍රමාණ කොපමණ ද යන්නයි. යම් දෙන ලද මිලකදී කර්මාන්තය විසින් වෙළෙඳපොළට සපයනු ලබන මුළු නිමැවුම් ප්‍රමාණය සැකසෙනුයේ එම මිලෙහිදී එක් එක් ආයතනය විසින් සපයන ලද ප්‍රමාණවල මුළු එකතුවෙනි. එබැවින් එක් එක් ආයතනයේ අවම විචල්‍ය පිරිවැයට ඉහළින් ඇති ආන්තික පිරිවැය වක්‍ර, තිරස් අතට එකතු කරනු ලැබුවහොත්, කර්මාන්තයේ සැපයුම් වක්‍රය ලබාගත හැකි ය.

**(ලකුණු 02යි)**



ආයතනයේ සැපයුම් වක්‍රය



කර්මාන්තයේ සැපයුම් වක්‍රය

(iii) පූර්ණ තරගකාරී ආයතනයක් මිල ගනුවෙක් වේ. මෙම තත්ත්වය හට ගනුයේ ආයතනය සමජාතීය වූ භාණ්ඩ නිපදවන නිසාත්, ආයතනය විසින් සපයනුයේ මුළු වෙළෙඳපොළ සැපයුමෙන් අතිශය කුඩා කොටසක් පමණක් වන නිසාත්, ගැනුම්කරුවන් සියලුම ආයතන අය කරනු ලබන මිල ගණන් පිළිබඳ ව පූර්ණ දැනුමක් අත්කර ගෙන සිටින නිසාත් ය.

මිල ගනුවෙක් වශයෙන් ක්‍රියාකරන නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් වක්‍රය, ප්‍රස්තාරයක් මගින් පෙන්නුම් කරනුයේ, පවත්නා වෙළෙඳපොළ මිල යටතේ ප්‍රමාණ අක්ෂයට සමාන්තරව අඳිනු ලැබූ සරල රේඛාවක් ලෙසිනි. එවැනි ඉල්ලුම් වක්‍රයක මිල නම්‍යතාව අපරිමිත හෝ පූර්ණ නම්‍ය අගයක් ගනී. ඉන් අදහස් වන්නේ පවත්නා වෙළෙඳපොළ මිලට, ආයතනය කැමති ඕනෑම ප්‍රමාණයක් අලෙවි කළ හැකි බව ය.

**(ලකුණු 02යි)**

කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන අතර එය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් නොවේ. එක් ආයතනයක් විසින් සපයනු ලබන භාණ්ඩය, කර්මාන්තය තුළ සිටින සෙසු ආයතන විසින් සපයනු ලබන භාණ්ඩවලට පූර්ණ ආදේශකයක් වේ. එබැවින් ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ. එහෙත් පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක නම්‍යතාව රඳා පවතිනුයේ, එම කර්මාන්තය සපයන භාණ්ඩය සහ වෙළෙඳපොළේ අවශේෂ භාණ්ඩ හා සේවා අතර කොතරම් ආදේශකත්වයක් පවතිනවා ද යන්න මත ය.

**(ලකුණු 02යි)**

(iv) කෙටිකාලයේදී ආයතන නිෂ්පාදනයෙහි රැඳී සිටිය යුතුය. මක් නිසා ද යත් ආයතනය වසා දැමීමට තීරණය කරනු ලැබුවහොත්, සිදුවිය හැකි පාඩුව ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය ප්‍රමාණය වන රුපියල් මිලියන 40කට සමාන වේ.

එහෙත් ආයතනය තවදුරටත් නිෂ්පාදනයේ රැඳී සිටිය හොත් හට ගන්නා පාඩුව වනුයේ ආයතනයේ මුළු අයභාරය (රු. මිලියන 100) සහ මුළු පිරිවැය (රු. මිලියන 120) අතර වෙනස වන රුපියල් මිලියන 20කි. එබැවින් මුළු අලාභය අවම කර ගැනීම සඳහා ආයතනය වසා දමනවාට වඩා නිෂ්පාදනයේ නිරතවීම ලාභ උපරිමයට හේතු වේ. **(ලකුණු 04යි)**

(v) කිසියම් නිමැවුම් ප්‍රමාණයකදී ආන්තික අයභාරය ආන්තික පිරිවැය ඉක්මවා (MR>MC) යන්නේ නම් එම ආන්තික ඒකකය නිපදවීමෙන් ආර්ථික ලාභයක් අත්කර ගත හැකිය. මෙවැනි අවස්ථාවක නිමැවුම් ප්‍රසාරණය කරන විට ආයතනයේ ආර්ථික ලාභය ඉහළ නගී.

කිසියම් නිමැවුම් ප්‍රමාණයකදී ආන්තික පිරිවැය, ආන්තික අයභාරය ඉක්මවා (MC>MR) යන්නේ නම්, එම ආන්තික ඒකකය නිපදවීමේදී ආයතනයකට පාඩුවක් දැරීමට සිදුවේ. එවැනි තත්ත්වයකදී නිමැවුම සංකෝචනය කිරීමෙන් ආයතනයේ පාඩු අවම කරගත හැකි වන අතර එය ලාභ ඉහළ යාමට ද හේතු වේ.

ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන (MR=MC) නිමැවුම් මට්ටමකදී ආර්ථික ලාභය උපරිම වේ. **(ලකුණු 02යි)**

ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමේ (MR=MC) කොන්දේසිය පූර්ණ තරගකාරී ආයතනයක් සම්බන්ධයෙන් තරමක් වෙනස් ආකාරයකට දැක්විය හැකිය. පූර්ණ තරගකාරී ආයතනයකට, පවත්නා වෙළෙඳපොළ මිල යටතේ, කැමැති ප්‍රමාණයක් විකුණා ගත හැකිය. එබැවින් එය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙයි. මෙහි ප්‍රතිඵලය වනුයේ භාණ්ඩයේ මිලත්, ආන්තික අයභාරයත් යන දෙකම එකිනෙකට සමාන වීම ය. අතිරේක ඒකකයක් අලෙවිකරනු ලබන සෑම විටකදීම මුළු අයභාරයට එකතු වන්නේ හරියටම මිලට සමාන ප්‍රමාණයකි. එබැවින් පූර්ණ තරගකාරී ආයතනයක් සම්බන්ධයෙන් MR=MC කොන්දේසි යොදා ගන්නා විට, MR වෙනුවට මිල (P) ආදේශ කළ හැකිය. **(ලකුණු 02යි)**

**03 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගෙන් 49%ක් 03 වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 43%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 05ක් ඇත. පහසුතාව අඩුම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 24%කි. පහසුතාව වැඩිම කොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 53%කි.

- (i) කොටසෙහි පහසුතාව 39%කි. හීනවන ඵලදා නීතිය හා පරිමාණානුකූල ඵල නීතිය නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන ආකාරය මෙම ප්‍රශ්නය මගින් විමසා ඇත. නිෂ්පාදන න්‍යායේදී කෙටිකාලය හා දිගු කාලය නිවැරදි ව හඳුනා ගැනීමට අසමත් වීමත්, ඵලදාව හා පිරිවැය අතර සම්බන්ධය හඳුනා ගැනීමට අසමත් වීමත් නිසා මෙම ප්‍රශ්නයට සපයා ඇති පිළිතුරු දුර්වල වී ඇති බව පෙනේ. විශේෂයෙන්ම ඵලදාව හා පිරිවැය අතර සම්බන්ධය, ඵලදා වක්‍ර හා පිරිවැය වක්‍ර යොදා ගනිමින් අවධාරණය කළ යුතු යැයි නිගමනය කළ හැකිය.

- (ii) කොටස මෙම ප්‍රශ්නයේ අඩු ම පහසුතාව පෙන්වන කොටසයි. එහි පහසුතාව 24%කි. ආයතනයක ආන්තික පිරිවැය හා කර්මාන්තයේ සැපයුම් වක්‍රය පිළිබඳ ව විමසා ඇති මෙම ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කරගැනීමට ශිෂ්‍යයා අසමත්ව ඇති බවක් පෙන්වයි. ආයතනය සහ කර්මාන්තය අතර වෙනස හඳුනා ගත්තත් ආයතනයක සැපයුම් වක්‍රය සහ විචල්‍ය පිරිවැය අතර සම්බන්ධය හඳුනා ගැනීමට අසමත් ව ඇත. එමෙන්ම ආයතනයක අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රය සැපයුම් වක්‍රයට සමාන වන බවත්, ආයතන සියල්ලේම සැපයුම් වක්‍රවල තිරස් එකතුවෙන් කර්මාන්තයේ සැපයුම් වක්‍රය ගොඩ නැගෙන බවත් තහවුරු වන අයුරින් දැනුම ලබාදීම වැදගත් වේ.

- (iii) කොටසෙහි පහසුතාව 45%කි. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ආයතනයේ ඉල්ලුම් වක්‍රය හා කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය පිළිබඳ අවබෝධය මැනෙන ප්‍රශ්නයකි. ආයතනයක ඉල්ලුම් වක්‍රයේ හැඩය හා ඊට හේතු දැන සිටියත් කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය හා ඊට හේතු පැහැදිලි ව දැන නොසිටීම අපහසුතාවට හේතු වී ඇති බව පෙනේ. ඉහත කොටසේදී මෙන්ම මෙහිදීත් ආයතනය සහ කර්මාන්තය/වෙළෙඳපොළ අතර සම්බන්ධය විවිධ අංශවලින් ඉදිරිපත් කරමින් ඉගැන්වීමෙන් මෙම දුර්වලතා අඩු කරගත හැකි වනු ඇත.

- (iv) කොටස මෙහි ඉහළ ම පහසුතාව සහිත කොටසයි. එහි පහසුතාව 53%කි. ගණිතමය පිළිතුරක් අපේක්ෂා කෙරෙයි. ප්‍රශ්නය තුළ සාපේක්ෂ වශයෙන් වඩාත් ම සාර්ථක වී ඇති කොටසයි. ලාභය, අලාභය හා පිරිවැය, අයභාරය ආශ්‍රිත ගණනය කිරීම්වලට ශිෂ්‍යයා හුරුකරවීමෙන් බොහෝ අඩුපාඩු තවදුරටත් මඟහරවා ගත හැකි වේ.

- (v) කොටසේ පහසුතාව 44%කි. ලාභ උපරිමනය සඳහා ආන්තික අයභාරය හා ආන්තික පිරිවැය එකිනෙකට සමාන වීම අවශ්‍ය වන්නේ මන්ද යන්නත් පූර්ණ තරගකාරී ආයතනයකදී MC = P වන්නේ ඇයි ද යන්නත් මෙම ප්‍රශ්නය මගින් විමසා බැලේ. බොහෝ විට මෙවැනි ප්‍රශ්නවලදී මුල් කොටසට පිළිතුරු සපයන ශිෂ්‍යයා එතැනින් පිළිතුර නිමා කිරීමක් දැක ගත හැකිය. ඉතිරි කොටස වෙත අවධානය යොමු නො වේ. එතරම් අසීරු ප්‍රශ්නයක් නොවන මෙම කොටසට අඩු ලකුණු ලැබීමට මෙය හේතුවකි. ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ අභ්‍යාසවල නිරත

## 04 ප්‍රශ්නය

**4. (i) තොග වෙනස්වීම් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? තොග වෙනස්වීම් ආයෝජන වියදමෙහි සංරචකයක් ලෙස ඇතුළත් කරන්නේ ඇයි?** *(ලකුණු 04 යි)*

**(ii) රජය විසින් කරනු ලබන පොලී ගෙවීම් පෞද්ගලික ආදායමේ සංරචකයක් වශයෙන් සලකන නමුදු, එය ජාතික ආදායමේ සංරචකයක් වශයෙන් නොසලකන්නේ මක් නිසා ද?** *(ලකුණු 04 යි)*

**(iii) "යම් රටක් තම ජාතික ආදායමට වඩා වැඩි ප්‍රමාණයක් වියදම් කරන්නේ නම්, එම රටෙහි වෙළෙඳ ශේෂයෙහි හිඟයක් පැවැතිය යුතු ය." මෙම ප්‍රකාශය පිළිබඳ ව අදහස් දක්වන්න.** *(ලකුණු 04 යි)*

**(iv) යම් ආර්ථිකයක් පිළිබඳ ව පහත තොරතුරු ඔබට දී ඇත. (සියලු ම අගයන් රු. මිලියනවලිනි.)**

| | | |
|---|---|---|
| ජාතික ආදායම (Y) | = | 5 200 |
| වැය කළ හැකි ආදායම ($Y_d$) | = | 4 400 |
| පරිභෝජනය (C) | = | 4 100 |
| අයවැය හිඟය (BD) | = | 150 |
| වෙළෙඳ ශේෂයේ හිඟය | = | 110 |

**ඉහත තොරතුරු උපයෝගි කර ගනිමින් පහත ද ගණනය කරන්න.**

**(අ) රජයේ මිලදී ගැනීම් (G)**

**(ආ) ඉතුරුම් (S)**

**(ඇ) ආයෝජනය (I)** *(ලකුණු 04 යි)*

**(v) 'සැඟවුණු ආර්ථිකය (underground economy)' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? එහි විශාලත්වය අඩු කළ හැක්කේ කෙසේ ද?** *(ලකුණු 04 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (i) තොග වෙනස්වීම යන්නෙන් අදහස් වනුයේ නිෂ්පාදන ආයතනයක් සතු

(අ) නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට ගැනීමට රැස්කොට ඇති අමුද්‍රව්‍ය හා අතරමැදි යෙදවුම් තොග

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියෙහි තවදුරටත් රැඳී ඇති අර්ධ-නිමි භාණ්ඩ තොග සහ

(ඇ) මෙතෙක් අලෙවි නොකළ එහෙත් අලෙවිය සඳහා සූදානම් කොට ඇති අවසාන භාණ්ඩ තොග

යනාදියෙහි වර්ෂය අවසානයේ වටිනාකම හා වර්ෂය ආරම්භයේ පැවති වටිනාකම අතර වෙනස් වීම ය.

(ලකුණු 02යි)

දළ දේශීය නිෂ්පාදිතය මගින් අදාළ වර්ෂයේ රට තුළ හටගත් මුළු නිෂ්පාදනයේ වටිනාකම මනිනු ලැබේ. එබැවින් දළ දේශීය නිෂ්පාදිතය මගින් නිමැවුමේ වටිනාකම නිවැරදි ව මැනීමට නම්, එම වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද එහෙත් එම වර්ෂය තුළ අලෙවි නොවූ සියලු ඵලදායි දෑ නිෂ්පාදනයේ වටිනාකමට ඇතුළත් විය යුතුය. මේ අනුව වියදම් ප්‍රවේශය ඔස්සේ නිමැවුමේ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී, තොග වෙනස්වීම්වල වටිනාකම ද ආයෝජන වියදමක් වශයෙන් ගිණුම් ගත විය යුතු ය.

(ලකුණු 02යි)

(ii) ජාතික ගිණුම් සැකසීමේදී රජය විසින් රාජ්‍ය ණය සඳහා ගෙවනු ලබන පොලිය සැලකෙනුයේ සංක්‍රාම වියදමක් වශයෙනි. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී භාණ්ඩ හා සේවා මත කරනු ලබන වියදම් සැලකිල්ලට ගන්නා නමුත් සංක්‍රාම වියදම් බැහැර කෙරේ.

(ලකුණු 02යි)

රජය විසින් පොලී ගෙවීම් කෙරෙනුයේ මීට පෙර වර්ෂවල රජයේ වැඩ සටහන් සඳහා ලබාගත් රාජ්‍ය ණය වෙනුවෙන් කරනු ලබන ගෙවීමක් වශයෙන් මිස, අදාළ වර්ෂයේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීම සඳහා දරන ලද වියදමක් වශයෙන් නොවේ. එබැවින් පොලී ගෙවීම්, දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී බැහැර කෙරේ. එහෙත් කුටුම්බවල ආදායම හෙවත් පෞද්ගලික ආදායම ගණනය කිරීමේදී එම වර්ෂය තුළ රජය විසින් කුටුම්බවලට ලබාදුන් පොලී ගෙවීම් ඇතුළත් කෙරේ.

(ලකුණු 02යි)

(iii) - ජාතික ආදායම (නිමැවුම) :

$Y = E (= C + I + G + NX)$ (ලකුණු 02යි)

- යම් රටක් ජාතික ආදායමට වඩා වියදම් කරනවා නම් ඉන් අදහස් වන්නේ $Y < (C + I + G)$ තත්ත්වයකි.
- මෙවැනි තත්ත්වයක් හට ගත් විට, ඉහත සමතුලිත කොන්දේසියට අනුව අවශ්‍යයෙන් ම ශුද්ධ අපනයන (X-M) සෘණ අගයක් ගත යුතු ය. (ලකුණු 02යි)

(iv) (අ) ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) :

බදු $(T) = Y - Y_d = 5200 - 4400 = 800$

අයවැය හිඟය $(G - T) = 150$

$G - T = 150$

$G - 800 = 150$

එබැවින් $G = 150 + 800 = 950$ (ලකුණු 02යි)

(ආ) ඉතුරුම් (S) :

ඉතුරුම් = වැය කළ හැකි ආදායම (Yd) - පෞද්ගලික පරිභෝජනය (C)

$S = Y_d - C$

S = 4400 - 4100 = 300

**(ලකුණු 01යි)**

(ඇ) ආයෝජනය (I) :

Y = C + I + G + NX

5200 = 4100 + I + 950 + (-110)

I = 5200 - 4940

I = 260 **(ලකුණු 01යි)**

(v) සැඟවුණු ආර්ථිකය සමන්විත වන්නේ කිසියම් රටක බලධාරින්ගේ හඳුනා ගැනීමකට හෝ ගණනය කිරීමකට හෝ ලක් නොවී ඒවායින් වැළැකී සිටිමින් කරනු ලබන ආර්ථික ක්‍රියාකාරකම්වලිනි. එබඳු ආර්ථික ක්‍රියා එක්කෝ නිසැක වශයෙන් ම නීති විරෝධී ඒවා වේ. නැතහොත් බදුවලින් වැළැකී සිටීම හෝ බලධාරීන් හඳුනා ගැනීමෙන් වැළැකී සිටීම හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා හෝ වාර්තා නොකෙරෙන ඒවා ය. **(ලකුණු 01යි)**

ඉහත දක්වන ලද පළමුවන ගණයේ ආර්ථික ක්‍රියාවලට උදාහරණ වශයෙන් නීති විරෝධි මත්ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය, ඔට්ටු සහ සූදු පැවැත්වීම, ගණිකා සේවය වැනි දෑ සඳහන් කළ හැකිය. දෙවැනි ගණයේ ක්‍රියාකාරකම් ලෙස ආපනශාලා, තැබෑරුම් සහ වෙනත් සිල්ලර වෙළෙඳසැල්හිමියන් තමන්ට ලැබෙන ආදායම් ප්‍රකාශ නොකිරීම, රජයේ ශුභ සාධන ගෙවීම (සමෘද්ධි) ලබමින් තාවකාලික හා අර්ධ කාලීන රැකියාවල නිරත වෙමින් අතිරේක ආදායම් ඉපැයීම, නීත්‍යානුකූල වීසා බලපත්‍රයක් නොමැතිව රටක් තුළ රැඳී සිටිමින් ආදායම් ඉපයීම්වල යෙදී සිටීම වැනි දෑ සඳහන් කළ හැකිය.

**(ලකුණු 01යි)**

සැඟවුණු ආර්ථිකයේ විශාලත්වය අඩු කිරීම :

- බදු අඩු කිරීම
- බදු ක්‍රමය වඩාත් සාධාරණ කිරීම
- නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිපුර සම්පත් යෙදවීම
- එබඳු ආර්ථික කටයුතුවල නිරතවන්නන්ට දැඩි දඬුවම් පැනවීම
- යහපාලනය ශක්තිමත් කිරීම

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)**

**04 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




04 වන ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 36%ක් පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 59%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 12%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 3%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස් 7ක් ඇත. පහසුතාව අඩුම කොටස් (i) සහ (ii) වන අතර, ඒවායේ පහසුතා 20% බැගිනි. පහසුතාව වැඩිම අනුකොටස iv (ආ) වන අතර, එහි පහසුතාව 66%කි.

- i කොටස ආයෝජන වියදමේ කොටසක් වන තොග වෙනස්වීම අර්ථ දැක්වීම සහ එහි සංරචක පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක් වූ ප්‍රශ්නයකි. මෙහි පහසුතාව 20%කි. තොග වෙනස්වීම යනු නිෂ්පාදන ආයතනයක වර්ෂය අග තොගය සහ වර්ෂය මුල තොගය අතර වෙනස බවත් ඒ යටතට අමුද්‍රව්‍ය හා අර්ධ නිමි තොග සහ නිමි භාණ්ඩ තොග යන සියලු තොග ඇතුළත් වන බවත් දැක්වීමට අපොහොසත්වී ඇත. එමෙන්ම දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම යටතට සියලු එළදායි නිෂ්පාදනවල වටිනාකම ඇතුළත් විය යුතු බැවින් සහ අදාළ වර්ෂයේදී නිපදවා අළෙවි නොවූ තොග පැවතීම, දළ දේශීය නිෂ්පාදිතයේ සැබෑ වටිනාකම අඩුවීමට හේතුවන බැවින් තොග වෙනස්වීම ආයෝජන වියදමේ කොටසක් ලෙස සැලකිය යුතු බවත් අවධාරණය කළ යුතුය.

- ii කොටසේ ද පහසුතාව 20%කි. රාජ්‍ය ණය සඳහා ගෙවනු ලබන පොලී සංක්‍රාම වියදමක් බව බහුතරයක් සිසුන් අවබෝධ කරගෙන නොතිබුණි. එමෙන්ම රජයේ පොලී ගෙවීම් අදාළ වර්ෂයේ නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා දරන ලද පිරිවැයක් නොවීම නිසා නිෂ්පාදිතයේ වටිනාකම ඇගයීමේදී බැහැර කළ යුතු බව අවබෝධ කර දීම වැදගත් වේ. එහෙත් පෞද්ගලික ආදායම ගණනයේදී එය ඊට ඇතුළත් විය යුතු බව ද අවධාරණය කළ යුතුය.

- iii වන කොටසද 21% වැනි අඩු පහසුතාවක් දැක්වූ ප්‍රශ්නයකි. යම් රටක් තම ජාතික ආදායමට වඩා වියදම් කරයි නම් එසේ වැඩිවූ ප්‍රමාණය විදේශ වර්තන ගිණුමේ ඇතුළත් වෙළෙඳ ගිණුමේ ශේෂයට සමාන වන බව සමතුලිත ජාතික ආදායමේ සංකේත ඇසුරෙන් පැහැදිලි කිරීමේ හැකියාව මෙම කොටසින් අපේක්ෂා කරන ලදී. ජාතික ආදායම් සමතුලිතයේ විග්‍රහයේදී වෙළෙඳ ශේෂය ශුද්ධ අපනයනවලට සමාන වන බවත්, ආදායමට වඩා වැඩියෙන් වියදම් කරන විට ශුද්ධ අපනයන සෘණ අගයක් ගත යුතු බවත් තහවුරු කිරීමට බොහෝ සිසුන් අපොහොසත් වී ඇත.

★ iv වන කොටස ජාතික ආදායම ආශ්‍රිතව දෙන ලද දත්ත ඇසුරින් අවශ්‍ය පිළිතුරු ගණනය කිරීමේ හැකියාව පරීක්ෂාවට යොමු වූවකි. එය අනුකොටස් 3කින් සමන්විත වූ අතර එක් එක් අනුකොටසේ පහසුතාවෙහි වෙනස්කම් පැවතිණි.

අ. අනුකොටසේ පහසුතාව 44%කි. දී ඇති දත්ත ඇසුරින් බදු වටිනාකම සහ අය-වැය හිඟය යොදා ගෙන රාජ්‍ය මිල දී ගැනීම් ගණනය කිරීමේ කුසලතාව පරීක්ෂා කළ අතර එහිදී 56%ක දුෂ්කරතාවක් විද්‍යාමාන විය.

ආ. අනුකොටසෙහි පහසුතාව 66%ක් වැනි ඉහළ ප්‍රතිශතයකි. බොහෝ දෙනකු වැය කළ හැකි ආදායම සහ පරිභෝජනය අතර වෙනසින් ඉතුරුම් ගණනය කිරීමට සමත් වී ඇත.

ඇ. අනුකොටසෙහි පහසුතාව 29%කි. ජාතික ආදායමේ සමතුලිත කොන්දේසි යොදා ගනිමින් එක් සංරචකයක වටිනාකම ව්‍යුත්පන්න කරගැනීමේ කුසලතාව මේ මගින් අපේක්ෂා කළ ද එම නිපුණතාව වැඩි පිරිසක් තුළ නොමැති වීම නිසා 71%ක දුෂ්කරතාවක් පෙන්නුම් කරයි. එබැවින් දෙන ලද දත්ත භාවිතයෙන් සමතුලිත ජාතික ආදායම හා බැඳුණු විවිධ සංකල්ප ගණනය කිරීමේ කුසලතාව දියුණු කළ යුතුය.

★ v වන කොටසේ පහසුතාව 45%කි. විශේෂයෙන් "සැඟවුනු ආර්ථිකය" යන සංකල්පය නිවැරදිව නිර්වචනය කිරීමේ හැකියාවත් ඊට අයත් වන ආර්ථික කටයුතු උදාහරණ සහිතව දැක්වීමේ හැකියාවත් ඒ සඳහා පුද්ගලයින් තුළ පවත්නා ආකල්ප සහ නෛතික තත්ත්ව බලපාන බව අවධාරණය කිරීමත් වැදගත් වේ. එමෙන්ම එම තත්ත්ව අවම කිරීම හෝ පාලනය කිරීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද දැනුවත් භාවය ලබාදිය යුතුය.

## 05 ප්‍රශ්නය

5. (i) 'ආයෝජන ගුණකය' යන්නෙහි අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) 'උද්ධමන පරතරය (inflationary gap)' හා 'ප්‍රතිගමනාත්මක පරතරය (recessionary gap)' (අවධමන පරතරය) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) "ආදයම තීරණය වීමේ සරල ආදායම්-වියදම් ආදර්ශයට අනුව ආර්ථිකයක් **එක්කෝ** උද්ධමනය හෝ සේවා වියුක්තිය හෝ සහිත ව, **නැත්නම්** මේ දෙකෙන් එකක්වත් නොමැතිව සමතුලිතතාවයේ පැවතිය හැකි ය." සුදුසු රූප සටහන් යොද ගනිමින් මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) දෙන ලද කාලසීමාවක දී කිසියම් ආවෘත ආර්ථිකයක ආයෝජනය 100 ක් බවත්, රජයේ මිලදී ගැනීම් 75 ක් බවත්, ශුද්ධ බදු 100 ක් බවත්, පරිභෝජනය $(C) = 25 + 0.8Y_d$ යන ශ්‍රිතයෙන් දී ඇති බවත් සලකන්න. මෙහි $Y_d$ යනු වැය කළ හැකි ආදායම වේ.

(අ) රජයේ වියදම් ගුණකය හා බදු ගුණකය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(ආ) මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම 1000 යයි සලකන්න. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම කරා ළඟාවීමට රාජ්‍ය මිලදී ගැනීම් කෙතරම් ප්‍රමාණයකින් ඉහළ යා යුතු ද? එයට විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම කරා ළඟාවීමට බදු ආදායම පහළ හෙළන්නේ නම්, බදු කොපමණ ප්‍රමාණයකින් අඩු කිරීම ප්‍රමාණවත් වේ ද? (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i) - නිමැවුම මත ගුණාකාර ප්‍රතිඵල ඇති කරලීමේ හැකියාවක් ආයෝජන වියදමට පවතී. ආයෝජනය වැඩි කළ විට, මුලින්ම නිමැවුම එම ප්‍රමාණයෙන්ම ඉහළ නගී. දෙවැනිව ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නිරත වූවන්ගේ ආදායම වැඩි වන විට, පෙළැඹුණු පරිභෝජන වියදම් ඇති කරමින් වට රාශියකින් නිමැවුම් ප්‍රසාරණය සිදුවේ. මෙම විශ්මයජනක ක්‍රියාවලිය ගුණක ප්‍රතිවිපාකය හෝ ගුණකය වශයෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 02යි)

- ආයෝජන ගුණකය නිර්වචනය කරනු ලබන්නේ ආයෝජන වියදමේ වෙනස්වීම් හා එහි ප්‍රතිඵල වශයෙන් මූර්ත නිමවුමේ හට ගන්නා වෙනස්වීම් අතර අනුපාතයක් ලෙස ය.
එනම්,

$$\text{ආයෝජන ගුණකය (k)} = \frac{\text{මූර්ත නිෂ්පාදිතයේ වෙනස්වීම } (\Delta Y)}{\text{ආයෝජනයේ වෙනස්වීම } (\Delta I)}$$

$$k = \frac{\Delta Y}{\Delta I}$$

(ලකුණු 01යි)

- ගුණකයේ විශාලත්වය රඳා පවතිනුයේ ආන්තික පරිභෝජන නැමියාව (MPC) හෝ ඒ හා සමඟ බැඳී පවත්නා ආන්තික ඉතුරුම් නැමියාව (MPS) කොතරම් විශාල ද යන්න මත ය.

$$k = \frac{1}{1 - MPC} \quad \text{හෝ} \quad k = \frac{1}{MPS}$$

(ලකුණු 01යි)

(ii) - උද්ධමන පරතරය යනු පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමේදී ආර්ථිකයේ පවත්නා සමාහාර වියදම, පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන සමාහාර වියදම කොතරම් ප්‍රමාණයකින් ඉක්මවා තිබේ ද යන්නයි. (ලකුණු 01යි)

- ප්‍රතිගමනාත්මක (අවධමන) පරතරය යනු පූර්ණ සේවා නියුක්තිය පවත්වා ගැනීමට අවශ්‍ය කරන නිමැවුම් මට්ටමේදී පවතින සමාහාර වියදම, පූර්ණ සේවා නියුක්ති මට්ටමට පවත්වා ගැනීමට අවශ්‍ය කරන සමාහාර වියදමට වඩා කොතරම් ප්‍රමාණයකින් පහළින් පවතිනවා ද යන්නය. (ලකුණු 01යි)

- උද්ධමනාත්මක පරතරයක ප්‍රතිඵලය වනුයේ මිල ගණන් ඉහළ නැගීම ය. ඉහළ යන සමාහාර වියදමට ප්‍රතිචාර වශයෙන්, මූර්ත නිමැවුම ප්‍රසාරණය කිරීමට ව්‍යාපාරික ආයතනවලට නොහැකි බැවින් ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හට ගනී. එහිදී දළ දේශීය නිෂ්පාදිතයේ නාමික වටිනාකම ඉහළ යන නමුදු මූර්ත අගය නොවෙනස්ව පවතී. (ලකුණු 01යි)

- ප්‍රතිගමනාත්මක පරතරයකදී සමාහාර වියදමේ ඌනතාවක් පවතින බැවින් ආර්ථිකයේ පසු බැසීමක් හට ගන්නා අතර, සේවා වියුක්තිය ඉහළ යාමට නැඹුරු වේ. (ලකුණු 01යි)



(iii) - ජාතික ආදායම සමතුලිත වනුයේ එය ප්‍රසාරණය වීමට හෝ සංකෝචනය වීමට හෝ නැඹුරුවක් නොපවතින විටදී ය.

ආදායමේ සමතුලිතතාව සඳහා අවශ්‍ය වන්නේ සමාහාර නිමැවුමේ වටිනාකමට සමාන වූ සමාහාර වියදමක් හට ගැනීම ය. එනම් $Y = E$ වීම ය. නැතහොත් සමාහාර වියදමට සිදුවන විදීම් (J) හා කාන්දුවීම් (W) අතර තුලනයක් හට ගැනීම ය. එනම් $W = J$ වීම ය. සමතුලිතතාව සඳහා අවශ්‍ය කරන මෙම කොන්දේසි ඇතිවිට ආර්ථිකය කවර ආදායම් මට්ටමක් යටතේ වුව ද සමතුලිත විය හැකිය. එක්කෝ උද්ධමනය සහිතව නැතහොත් සේවා වියුක්තිය සහිතව එසේත් නැතහොත් ඒ දෙකම නොමැතිව ආර්ථිකය සමතුලිත විය හැකිය.

(ලකුණු 01යි)




$Y_F$ = පූර්ණසේවා නියුක්ති නිමැවුම

(එක් නිවැරදි රූප සටහනකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(iv) (අ) - ආණ්ඩුවේ වියදම් ගුණකය $K_G = \dfrac{1}{1 - MPC}$

(ලකුණු 01යි)

- $K_G = \dfrac{1}{1 - 0.8}$

(ලකුණු 01යි)

- $K_G = \dfrac{1}{0.2} = 5$

- බදු ගුණකය $K_T = \dfrac{MPC}{1 - MPC}$ (ලකුණු 01යි)

- $K_T = \dfrac{0.8}{1 - 0.8}$

$K_T = \dfrac{0.8}{0.2} = 4$

(ලකුණු 01යි)

(ආ) සමතුලිත ආදායම :

$$Y = 25 + 0.8\,(Y-100) + 100 + 75$$
$$Y = 25 + 0.8Y - 80 + 175$$
$$Y = 0.8Y + 120$$
$$Y - 0.8Y = 120$$
$$0.2Y = 120$$
$$Y = 600$$

$$1000 - 600 = 400$$

$K_G = 400/5 = 80$ (ලකුණු 02යි)

$K_T = 400/4 = 100$ (ලකුණු 02යි)

- නිමැවුම් පරතරය = පූර්ණ සේවා නියුක්තියේදී නිමැවුම් මට්ටම - පවත්නා නිමැවුම් මට්ටම
  = $Y_F - Y$
  = 1000 - 600 = 400

- පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීම සඳහා රජයේ මිල දී ගැනීම් ඉහළ නැංවිය යුතු ප්‍රමාණය:

$$\frac{\text{නිමැවුම් පරතරය}}{\text{ආණ්ඩුවේ වියදම් ගුණකය}} = \frac{400}{5} = 80$$

(ලකුණු 02යි)

- පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීම සඳහා බදු පහත හෙළිය යුතු ප්‍රමාණය :

$$\frac{\text{නිමැවුම් පරතරය}}{\text{බදු ගුණකය } (K_T)} = \frac{400}{4} = 100$$

(ලකුණු 02යි)

**05 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්න පත්‍රයේ “අ” කොටසේ ප්‍රශ්න අතුරෙන් අඩුම පිරිසක් තෝරා ඇති ප්‍රශ්නය 05 වන ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 23%කි (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 46%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (iv) වන කොටස (අ), (ආ) වශයෙන් අනුකොටස් දෙකකින් යුක්තය. මෙම ප්‍රශ්නය තුළ වැඩිම පහසුතාව (iv) (අ) අනුකොටසට හිමිවන අතර, එහි පහසුතාව 67%කි. අඩුම පහසුතාව ඇත්තේ (ii) කොටසට වන අතර, එහි පහසුතාව 18% කි.

- i වන කොටසේ පහසුතාව 37%කි. ආයෝජන වියදමට නිමැවුම මත ගුණාකාර ප්‍රතිඵල බිහිකිරීමේ හැකියාව පවතින බවත්, වියදම් වට ගණනාවකින් එය සිදුවන බවත් දැන සිටීම සහ මූර්ත නිෂ්පාදනයේ සහ ආයෝජන වියදමේ වෙනසෙහි අනුපාතය මගින් ආයෝජන ගුණකය ගණනය කිරීමේ හැකියාව සොයා බැලීමට යොමු වූ ප්‍රශ්නයකි. ඊට අමතරව ආන්තික ඉතුරුම් නැඹියාවේ (ආන්තික ගිලිහීම් අනුපාතයේ) ප්‍රමාණය මත ගුණකයේ විශාලත්වය තීරණය වන බව නිගමනය කිරීමේ කුසලතාව නොමැති වීම අඩු සාධනයට හේතුවී ඇති බැවින් එම ශක්තිය වර්ධනය වන අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

- ii කොටසෙහි පහසුතාව 18%කි. 5 වන ප්‍රශ්නයේ ඉහළ ම දුෂ්කරතාවක් සහිත කොටසයි. ජාතික ආදායමේ පූර්ණ සේවා නියුක්ති මට්ටම සහ සමාහාර වියදම (ඉල්ලුම) අතර වෙනස උද්ධමන සහ අවධමන පරතර බිහිකිරීමට හේතුවන බව පැහැදිලි කිරීමටත් ජාතික ආදායමේ සමතුලිතය නිරූපණය කරන, ආදායම = වියදම (Y = E) රූප සටහනක් මගින් එය පැහැදිලි කිරීමේ කුසලතාව ලබාදීමටත් කටයුතු කළ යුතුය.

- iii වන කොටසේ පහසුතාව 28%කි. සමතුලිත ජාතික ආදායම තීරණය වීමේ ආදායම = වියදම (Y = E) සහ ගිලිහීම් = එකතුවීම් (W = J) යන කොන්දේසි ඇසුරින් විමසන ලද ප්‍රශ්නයකි. මෙම කොන්දේසි සපුරාලන විට තීරණය වන ආදායම් මට්ටම යටතේ ආර්ථිකය සමතුලිත වුව ද එම මට්ටම පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා වැඩි නම් උද්ධමනයක් ද පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා අඩු නම් සේවා වියුක්තියක් ද පවතින බවත් සමාහාර ඉල්ලුම විභව නිෂ්පාදිතයට සමාන වන විට උද්ධමනයක් හෝ සේවා වියුක්තියක් හෝ බිහි නොවන බවත් (Y = E) රූප සටහනකින් හෝ පැහැදිලි කිරීමේ කුසලතාව වර්ධනය කළ යුතුය.

- iv වන කොටස 'අ' සහ 'ආ' වශයෙන් අනුකොටස් දෙකකින් සමන්විත වේ. 'අ' කොටසේ පහසුතාව 67% කි. සාර්ව ආර්ථික සමතුලිතයට අදාළ දත්ත ඇසුරින් රජයේ වියදම් ගුණකය සහ බදු ගුණකය ගණනය කිරීමේ කුසලතාව පරීක්ෂා කිරීමට අපේක්ෂිත ප්‍රශ්නයකි. බහුතරයක් සිසුන් සතුව එම කුසලතාව තිබුණු අතර තවදුරටත් එම හැකියාව වර්ධනය කළ යුතුය.

  'ආ' අනුකොටසෙහි පහසුතාව 43%කි. පවත්නා නිමැවුම් මට්ටමක සිට පූර්ණ සේවා නියුක්ති මට්ටම අත්කර ගැනීමට කෙතරම් රජයේ මිලදී ගැනීම් වැඩි කළ යුතු ද සහ කෙතරම් බදු කපා හැරීමක් කළ යුතු ද යන විකල්ප දෙක ගණනය කිරීමේ කුසලතාව මැනීමට යොමු වූ ප්‍රශ්නයකි. ඒ සඳහා නිමැවුම් පරතරය, රජයේ මිලදී ගැනීම් ගුණකය සහ බදු ගුණකය යොදා ගැනීමේ කුසලතාව තවදුරටත් වැඩි දියුණු කළ යුතුය.

**"ආ" කොටස**

## 06 ප්‍රශ්නය

**(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

6. (i) 'අධිබලැති මුදල්' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? මහ බැංකුවක් අධිබලැති මුදල් මවනු ලබන්නේ කෙසේ ද'යි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

   (ii) ආර්ථිකයක මුදල් සැපයුම තීරණය කරනු ලබන සාධක මොනවා ද? (ලකුණු 04 යි)

   (iii) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සමන්විත වී ඇති ප්‍රධාන මූල්‍ය ආයතන කාණ්ඩ (categories) කවරේ ද? (ලකුණු 04 යි)

   (iv) යම් කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම (M) රු. බිලියන 1 200 ක් ද, මුළු තැන්පතු (D) රු. බිලියන 800 ක් ද, අවශ්‍ය සංචිත-තැන්පතු අනුපාතය 10% ක් ද වේ. බැංකු සතුව අතිරික්ත සංචිත නොපවතින බව ද සලකන්න.

   (අ) මෙම ආර්ථිකය සඳහා වන මුදල් ගුණකයේ අගය කුමක් ද?

   (ආ) මහ බැංකුව රු. බිලියන 3 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් වාණිජ බැංකු වෙතින් මිලදී ගන්නේ නම්, මුළු මුදල් සැපයුම උපරිම වශයෙන් වෙනස් විය හැක්කේ කොපමණ ප්‍රමාණයකින් ද? (ලකුණු 04 යි)

   (v) 'මුදල් ප්‍රමාණවාදය' පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න. ඒ හා බැඳුණු උපකල්පන හඳුනා ගන්න. (ලකුණු 04 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(6) (i) - කිසියම් රටක සමස්ත මුදල් සැපයුමේ පදනම ලෙස සැලකෙන මූල්‍ය වත්කම් අධිබලැති මුදල් ලෙස හඳුන්වනු ලැබේ. මේවා සංචිත මුදල් හා පදනම් මුදල් යන නම්වලින් ද හැඳින්වේ. රටේ සමස්ත මුදල් සැපයුම අධි බල මුදල් ප්‍රමාණය මෙන් කීප ගුණයකි. **(ලකුණු 01යි)**

$M = mH$ ; මෙහි M මුදල් සැපයුම වන අතර, m මුදල් ගුණකයත් H අධිබල මුදල් ප්‍රමාණයත් පෙන්නුම් කරයි.

- කිසියම් රටක අධි බල මුදල් තොගය සමන්විත වනුයේ,
  (අ) මහජනයා සහ වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය
  (ආ) වාණිජ බැංකු සතුව මහ බැංකුවේ ඇති තැන්පතු ප්‍රමාණය
  යන සංරචක දෙකිනි. **(ලකුණු 01යි)**

- මහ බැංකුව විසින් අධි බලැති මුදල් ආර්ථිකය මත මුදා හැරෙන යාන්ත්‍රණ දෙකක් පවතී. මින් එක් යාන්ත්‍රණයක් වනුයේ මහ බැංකුව විසින් රජයට හා වාණිජ බැංකුවට ණය සැපයීම ඔස්සේ දේශීය මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම ය. රජය මහ බැංකුවෙන් ණය ලබා ගන්නා විට ව්‍යවහාර මුදල්, මහ බැංකුවේ ඇති ආරක්ෂිත සේප්පු වෙතින් රජය කරා ඇදී යයි. රජය විවිධ වියදම් සඳහා එම මුදල් යොදා ගන්නා විට ඒවා මහජනතාවගේ හා වාණිජ බැංකුවල වත්කම් බවට පත් වේ.

  එසේ වාණිජ බැංකු තමන්ගේ වත්කම් ගොනුවල ඇති සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් වැනි පත්‍රිකා, මහ බැංකුවට විකුණන විට හෝ ඍජුවම මහ බැංකුවෙන් ණය ලබාගන්නා විට, ව්‍යවහාර මුදල් මහ බැංකුවේ සිට වාණිජ බැංකු වෙතට ගලා යයි. **(ලකුණු 01යි)**

- අධි බලැති මුදල් ආර්ථිකය කරා ගලා එන දෙවැනි යාන්ත්‍රණය වනුයේ මහ බැංකුව විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ විදේශීය විනිමය මිල දී ගැනීම ය. මහ බැංකුව හෝ වාණිජ බැංකු වෙතින් විදේශ විනිමය මිල දී ගන්නා විට, ඒ සඳහා මහ බැංකුව ගෙවනු ලබනුයේ ව්‍යවහාර මුදල්වලිනි. එවිට ආර්ථිකයේ අධිබල මුදල් තොගය ප්‍රසාරණය වේ. **(ලකුණු 01යි)**

(ii) මුදල් සැපයුම නිර්ණය කරනු ලබන සාධක :
- ● අධිබල මුදල් සැපයුමට බලපාන සාධක
- - මහ බැංකුව විසින් රජයට ණය ලබාදීම
- - මහ බැංකුව වාණිජ බැංකු සමග ප්‍රතිවිකුණුම් හා ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වලට එළැඹීම
- - මහ බැංකුව විසින් විදේශ විනිමය මිලට ගැනීම හා විකිණීම
- - මහ බැංකුවේ වෙනත් වත්කම් වෙනස්වීම
- - මහ බැංකුවේ ලාභ රජයට පැවරීම

- ● මුදල් ගුණකයේ ප්‍රමාණය කෙරෙහි බලපාන සාධක :
- - ගනුදෙනු කිරීමේදී ව්‍යවහාර මුදල් හෝ බැංකු මුදල් භාවිත කිරීමේ ලා මහජනයාගේ අභිරුචිය (සංචිත මුදල් බැංකු පද්ධතියෙන් පිටතට කාන්දුවීමේ නැඹුරුව)
- - ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
- - අධි සංචිතවල ප්‍රමාණය

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iii) බැංකු අංශය
- ● මහ බැංකුව
- ● බලපත්‍රලාභී වාණිජ බැංකු
- ● බලපත්‍රලාභී විශේෂිත බැංකු
- - තැන්පතු භාර ගන්නා වෙනත් මූල්‍ය ආයතන
- - විශේෂිත මූල්‍ය ආයතන
- - ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iv) (අ) මුදල් සැපයුම නිර්ණය කරනු ලබන සාධක :

- මුදල් සැපයුම (M) = ව්‍යවහාර මුදල් (CU) + බැංකු තැන්පතු (D)
- CU = M - D = 1200 - 800 = 400
- බැංකු අධිසංචිත තබා නොගනී නම්,
  සංචිත මුදල් (R) = (0.1) D = 0.1 (800) = 80
  අධිබල මුදල් ප්‍රමාණය (H) = CU + R = 400 + 80 = 480

- මුදල් ගුණකය $(m) = \frac{M}{H} = \frac{1200}{480} = 2.5$ (ලකුණු 02යි)

(ආ) මහ බැංකුව රුපියල් බිලියන 3ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් වාණිජ බැංකු වෙතින් මිලට ගත් විට, මුදල් සැපයුම උපරිම වශයෙන් වෙනස් වනුයේ රුපියල් බිලියන 7.5කිනි.

$AM = m\,(\Delta H) = 2.5 \times (3) = 7.5$ (ලකුණු 02යි)

(v) මුදල් ප්‍රමාණවාදය

- මුදල් තොගය සහ පොදු මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බව මුදල් ප්‍රමාණවාදය පුරෝකථනය කරයි. එනම් මුදල් ප්‍රමාණයේ හටගන්නා වෙනස්වීමක් මිල මට්ටමේ සමානුපාතික වෙනසක් ඇති කරයි. උදාහරණයක් වශයෙන් මුදල් තොගය දෙගුණ කරනු ලැබුවහොත් මිල මට්ටම ද දෙගුණ වනු ඇත.

- මුදල් ප්‍රමාණය හා මිල මට්ටම අතර සම්බන්ධය පෙන්වා දීම සඳහා මුදල් ප්‍රමාණවාදය භාවිත කරනුයේ MV = PY යන විනිමය සමීකරණයයි.

  මෙය සමීකරණයක් ලෙස දක්වන නමුදු, එය සැබැවින්ම අනන්‍යතාවකි. එසේ වුවද, මෙම සමීකරණය තුළ අඩංගු විචල්‍යවල හැසිරීම සම්බන්ධයෙන් කරනු ලබන උපකල්පන පදනම් කර ගනිමින් විනිමය සමීකරණය, න්‍යායක් (මුදල් ප්‍රමාණවාදය) බවට පෙරළා ගත හැකි ය. ඒ සඳහා යොදා ගැනෙන උපකල්පන දෙකකි. (ලකුණු 02යි)

  (i) මුදලේ සංසරණ ප්‍රවේගය (V) ස්ථාවරව පවතී.
  (ii) ආර්ථිකයේ මූර්ත නිමැවුම් පරිමාව (Y) නොවෙනස්ව පවතී. නැතහොත් ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටමේ පවතී.

- මෙලෙස විනිමය සමීකරණයේ V හා Y යන පද ස්ථාවරව පවතින්නේ නම්, M හා P අතර සමානුපාතික සම්බන්ධතාවක් හට ගනී.

(එක් උපකල්පනයකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

**06 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගෙන් 69%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වෙයි.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 58%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 12%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5 ක් ඇති අතර (iv) කොටස අනුකොටස් දෙකකින් යුක්ත ය. (v) කොටසෙහි පහසුතාව උපරිම වුව ද එහි පහසුතාව 38% කට සීමා වී ඇත. පහසුතාව අඩුම අනුකොටස iv (අ) වන අතර, එහි පහසුතාව 10% ක් පමණි. (ආ) අනුකොටස ඊළග අඩුම පහසුතාව සහිත අනුකොටසයි. එහි පහසුතාව 15% කි. අනෙක් කොටස් 3 හි පහසුතා 28% - 35% ප්‍රාන්තරයෙහි විචලනය වෙයි.

- ⋆ i වන කොටස

  අධි බලැති මුදල් යනු කුමක් ද යන්න පිළිබඳවත්, මහ බැංකුව අධි බලැති මුදල් මවනු ලබන ආකාරය පිළිබඳවත් ශිෂ්‍යයාගේ දැනුම මින් පරීක්ෂා කෙරේ. මෙම කොටසෙහි පහසුතාව 30%කි. අධි බලැති මුදල් සංයුතිය දැක්වීමට ශිෂ්‍යයා සමත් වුවත්, මහ බැංකුව අධි බලැති මුදල් මවනු ලැබීම යන්න ශිෂ්‍යයාට ආගන්තුක බවක් පෙන්වයි. අධි බලැති මුදල් බිහිවීම හා මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය අතර සම්බන්ධය පැහැදිලි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීම වැදගත් ය.

- ⋆ ii වන කොටස

  මෙම කොටසේ පහසුතාව 28%කි. ආර්ථිකයක මුදල් සැපයුම නිර්ණය කෙරෙන සාධක පිළිබඳ ව දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයකි. මුදල් සැපයුම නිර්ණය කෙරෙන සාධක පිළිබඳ මූලික දැනුමෙන් ප්‍රකාශ කළ හැකි පිළිතුරකි. එහෙත් පහසුතාව මේ තරම් අඩු වී ඇත්තේ ප්‍රමාණවත් ලෙස විෂය කරුණු කෙරෙහි අවධානය යොමු නොවීම නිසා විය හැකිය.

- ⋆ iii වන කොටස

  මෙම ප්‍රශ්නය තුළ සාපේක්ෂ වශයෙන් පහසුතාව ඉහළ කොටසකි. එහි පහසුතාව 35%කි. මීට පෙර ද මෙවැනි ප්‍රශ්නයක් අසා තිබුණු බැවින් පසුගිය ප්‍රශ්න පත්‍ර පරිශීලනය කිරීමෙන් සාර්ථකව පිළිතුරු ලිවීමට හුරුවක් ලබාගත හැකි බව පෙන්වයි.

★ iv කොටස

මෙය "අ" සහ "ආ" වශයෙන් අනුකොටස් දෙකකින් යුක්ත වේ. 6 වැනි ප්‍රශ්නයේ අඩුම පහසුතාව පෙන්වන්නේ මෙම අනුකොටස් දෙකයි.

ප්‍රශ්නයේ දී ඇති තොරතුරුවලට සමාන තොරතුරුවලින් මුදල් මැවීම පිළිබඳ ව ශිෂ්‍යයා හුරු වී ඇති නමුත් මුදල් ගුණකය ගණනය කිරීමට ආගන්තුක බවක් පෙන්වයි.

නව තැන්පතු බැංකු වෙත ගලා ඒමත් සමග මුදල් සැපයුම ප්‍රසාරණය වන ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයා තුළ ප්‍රමාණවත් දැනුමක් ඇතත්, භාණ්ඩාගාර බිල්පත් වාණිජ බැංකු වෙතින් මිල දී ගැනීමත් සමග මුදල් සැපයුම ප්‍රසාරණය කෙරෙහි ඇති කෙරෙන බලපෑම පිළිබඳ ව ශිෂ්‍යයාගේ දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනේ. එබැවින් මහ බැංකුව සහ වාණිජ බැංකු අතර භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු සිදුවීම මුදල් සැපයුම කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ ව ශිෂ්‍යයාගේ දැනුම තහවුරු වන පරිදි අභ්‍යාසවල යෙදවීම වැදගත් ය.

★ v කොටස

ප්‍රශ්නයෙහි වඩාත් ම පහසුතාව පෙන්වන්නේ මෙම කොටසයි. එහි පහසුතාව 38%කි. සංකීර්ණ ගැටලු සහිත ප්‍රශ්නයක් නොවන මෙම කොටසට මූලික දැනුමෙන් පිළිතුරු ලිවිය හැකිය. ශිෂ්‍යයා ප්‍රමාණවත් ලෙස විෂය කරුණු පිළිබඳ ව අවධානය යොමු නොකරන බවක් හැඟී යයි. අභ්‍යාසකරණයට ශිෂ්‍යයා යොමු වන පරිදි පන්ති කාමර ඉගැන්වීම් කටයුතු සැලසුම් කර ගන්නේ නම් මැනවි.

## 07 ප්‍රශ්නය

7. (i) **සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීමෙහි ලා වෙළෙඳපොළ අසමත් විය හැක්කේ කුමක් නිසා ද?** *(ලකුණු 04 යි)*

(ii) **සුදුසු රූප සටහන් ආධාරයෙන් ශ්‍රී ලංකාවේ මහාමාර්ගවල සාමාජීය වශයෙන් හිතකර ප්‍රමාණයට වඩා වැඩි මෝටෝරථ සංඛ්‍යාවක් දක්නට ලැබෙන්නේ මන් දැයි පැහැදිලි කරන්න.** *(ලකුණු 04 යි)*

(iii) **වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ රජය සතුව නොවැළැක්විය හැකි කාර්යභාරයක් පවතින්නේ ඇයි?** *(ලකුණු 04 යි)*

(iv) **යහපත් බදු ක්‍රමයක් සතුව තිබිය යුතු ගුණාංග සඳහන් කරන්න.** *(ලකුණු 04 යි)*

(v) **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් ආදායම් අසමානතාව අඩු කළ හැකි ආකාර පැහැදිලි කරන්න.** *(ලකුණු 04 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(07) (i)
- වෙළෙඳපොළ බලය
- පොදු භාණ්ඩ නොසැපයීම
- නිෂ්පාදනයේ හා පරිභෝජනයේ බාහිරතා හට ගැනීම
- පොදු සම්පත් අධි උපයෝජනයට පාත්‍රවීම
- අපූර්ණ තොරතුරු පැවැතීම
- සාධක අසංචලතාව
- ඇතැම් ගනුදෙනු සඳහා වෙළෙඳපොළ දක්නට නොලැබීම
- ආදායම් බෙදීයාමේ විෂමතා **(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(ii) - මින් පිළිබිඹු වන්නේ පරිභෝජන ක්‍රියාවලියක් ආශ්‍රයෙන් හට ගන්නා සෘණ බාහිරතාවකි. මෝටෝරථ භාවිතයේදී බාහිර පිරිවැය කෙරෙහි සැලකිල්ලක් නොදක්වමින් පෞද්ගලික ප්‍රතිලාභය මත පමණක් පරිභෝජන තීරණ ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇඩි වාහන තදබදයක් මහා මාර්ගවල දැකිය හැකිය.

පරිභෝජන ක්‍රියාවලිය සෘණ බාහිරතා ඇති කරන විට සමාජීය ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභයට වඩා අඩුවේ. එසේ වුව ද පෞද්ගලික පරිභෝජන තීරණ හුදෙක් පෞද්ගලික ප්‍රතිලාභය පමණක් සැලකිල්ලට ගෙන ගනු ලබන බැවින්, අධි පරිභෝජනයක් හෙවත් සමාජයට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා වැඩි පරිභෝජනයක් හට ගනී.

- පරිභෝජන ක්‍රියාවලිය සෘණ බාහිරතා ඇති කරන විට, පෞද්ගලික පරිභෝජනය, සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජන මට්ටම ඉක්මවා යන බව රූප සටහන පෙන්නුම් කරයි.

(ලකුණු 02යි)







(නිවැරදි රූප සටහනකට ලකුණු 02යි)

(iii) - විශේෂයෙන් පෞද්ගලික දේපොළ සුරක්ෂිත කිරීමට අදාළ නීති හා ගිවිසුම් සම්පාදනය සහ බලගැන්වීම.
- වෙළෙඳපොළ අසමත්වීම කෙරෙහි බලපාන හේතු ඉවත් කරමින් ආර්ථික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
- පරිසරය ආරක්ෂා කිරීම
- ආර්ථික වෘද්ධිය ශක්තිමත් කිරීම
- ආදායම් හා මිල උච්චාවචන වළක්වාලමින් ආර්ථිකය ස්ථායි කිරීම
- පුරවැසියන්ට පිළිගත හැකි මට්ටමක සාධාරණත්වයක් ලබාදීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)

(iv) - සාධාරණත්වය
- නිශ්චිතභාවය
- පහසුව
- පිරිමැසුම් සහිත වීම
- නම්‍යශීලී වීම
- සරල බව (එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)

(v) - අනුක්‍රමික බදු ක්‍රමයක් ඇති කිරීම
- සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාවට නැංවීම
- අධ්‍යාපනය, සෞඛ්‍යය හා නිවාස සඳහා ආණ්ඩුවේ වියදම් ඉහළ නැංවීම
- බදු දැලෙන් පලා යාම හා බදු ගෙවීම පැහැර හැරීම සඳහා ඇති අවස්ථා අඩු කිරීම
- දිළින්දන්ට හිතකර වෘද්ධි උපාය මාර්ග ක්‍රියාවට නැංවීම සඳහා ආණ්ඩුවේ සංවර්ධන වැඩ සටහන් මෙහෙයවීම

(ඕනෑම ප්‍රතිපත්ති දෙකකට ලකුණු 02 බැගින් ලකුණු 04යි
ප්‍රතිපත්ති සඳහන් කිරීමට ලකුණු 01යි.
(ප්‍රතිපත්තියේ බලපෑම පැහැදිලි කිරීමට ලකුණු 01යි)

## 07 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්න පත්‍රයේ "ආ" කොටසෙහි ප්‍රශ්නවලින් වැඩි පිරිසක් තෝරා ගෙන ඇති ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 85%කි (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 40%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (iv) කොටස පහසුම ප්‍රශ්නය වී ඇත. එහි පහසුතාව 62%කි. පහසුතාව අඩුම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 28%කි. i, iii සහ v කොටස්වල පහසුතා පිළිවෙළින් 45%, 42% සහ 33% වේ.

- ⋆ i කොටසේ පහසුතාව 45%කි. සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමෙහිලා වෙළෙඳපොළ අසමත් විය හැකි ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයාගේ දැනුම පිරික්සීම මෙහි අරමුණයි. මෙය සංකීර්ණ ප්‍රශ්නයක් නොවේ. විෂය කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුමින් පිළිතුරු සැපයිය හැකිය. ශිෂ්‍යයා තුළ ස්ව අධ්‍යයන කුසලතා ප්‍රගුණ කළ යුතුය.

- ⋆ ii කොටසේ පහසුතාව 28%කි. එය මෙම ප්‍රශ්නයේ අඩුම පහසුතාව පෙන්වන කොටසයි. න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික තත්ත්ව ඇසුරෙන් විමසීම මෙම ප්‍රශ්නය මගින් සිදු කෙරේ. න්‍යායාත්මක දැනුම ඇසුරෙන් ප්‍රායෝගික තත්ත්වය පැහැදිලි කර ගැනීමට ශිෂ්‍යයා අපොහොසත් වීම මෙම කොටසේ පහසුතාව අඩුවීමට හේතුව ලෙස ඉදිරිපත් කළ හැකිය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමේදී න්‍යායාත්මක දැනුම හැකි සෑම විටෙක ම ප්‍රායෝගික තත්ත්වය සමග ගැළපීමට කටයුතු කිරීමෙන් මෙම දුර්වලතාව මගහරවා ගත හැකි වනු ඇත.

- ⋆ iii කොටසේ පහසුතාව 42%කි. මෙම කොටස සංකීර්ණ ගැටලු සහිත ප්‍රශ්නයක් නොවේ. මැනවින් අධ්‍යයන කටයුතු කරන ශිෂ්‍යයකුට මතකයෙන් පිළිතුරු ලිවිය හැකිය. මෙවැනි කරුණු නිතර නිතර පරිශීලනය වන පරිදි පන්ති කාමර ක්‍රියාකාරකම් සැලසුම් කිරීමෙන් ශිෂ්‍යයා තුළ මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ කුසලතා ප්‍රගුණ කළ හැකිය.

- iv කොටස මෙම ප්‍රශ්නයේ පහසුතාව වඩාත් ඉහළ කොටසයි. එහි පහසුතාව 62%කි. විෂය කරුණු පිළිබඳ මූලික දැනුමෙන් පිළිතුරු ලිවිය හැකි ඉතා සරල ප්‍රශ්නයක් වුව ද පරිපූර්ණ පිළිතුරු ලිවීමට ශිෂ්‍යයින් සැලකිය යුතු පිරිසක් අසමත් වීමෙන් පෙනී යන්නේ විෂය කරුණු පරිශීලනය ප්‍රමාණවත් නොවන බවයි. නිතර නිතර දැනුම යාවත්කාලීන වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීම අවශ්‍ය බව පෙනේ.

- v කොටස සාපේක්ෂ වශයෙන් පහසුතාව අඩු කොටසකි. එහි පහසුතාව 33%කි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් ආදායම් අසමානතාව අඩු කිරීමට පියවර ගත හැකි ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයාගේ දැනුම මැන බැලෙන ප්‍රශ්නයකි. මෙම කොටසට ද මතකයෙන් පිළිතුරු සැපයිය හැකිය. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යන්න නිවැරදි ව හඳුනාගෙන නොසිටීම දුර්වලතාවට හේතුව බව පෙනේ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා එය උපයෝගී කර ගත හැකි ආකාරය වඩාත් හොඳින් තහවුරු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

## 08 ප්‍රශ්නය

8. (i) **සංඛ්‍යාත්මක උදාහරණයක් සපයමින්, නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි අතර වෙනස පහදන්න.** (ලකුණු 04 යි)
   (ii) රටවල් අතර වෙළෙඳ රටා තීරණය කිරීමට හේතු විය හැකි ආර්ථික සාධක පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (iii) **ජාත්‍යන්තර වෙළෙඳාමට ඇති බාධක ඉවත්කරලීමෙහි ලා යොදා ගන්නා ගෝලීය හා කලාපීය ප්‍රවේශ එකිනෙක සංසන්දනය කොට, ඒවා අතර වෙනස්කම් දක්වන්න.** (ලකුණු 04 යි)
   (iv) **නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක වාසි හා අවාසි මොනවා ද?** (ලකුණු 04 යි)
   (v) **ශ්‍රී ලංකාවේ ආනයන වියදම්වල හා අපනයන ඉපැයීම්වල මෑතකාලීන ප්‍රවණතා පරීක්ෂා කරන්න. වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ පා ඇති විශාල වෙළෙඳ ශේෂ හිඟයට බලපා ඇති හේතු කවරේ ද?** (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(08) (i) සංඛ්‍යාත්මක උදාහරණ

දිනකට ශ්‍රමිකයකුගේ නිමැවුම (ඒකක)

| භාණ්ඩය | එක්සත් ජනපදය | ඉන්දියාව |
|---|---|---|
| තිරිඟු | 8 | 4 |
| රෙදි | 4 | 3 |

- කිසියම් රටකට නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි පවතිනවා යැයි කියනුයේ, කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී යම් දෙන ලද යෙදවුම් ඒකකයකින් එම රට අනිත් රටට වඩා වැඩි නිමැවුම් ප්‍රමාණයක් ලබාගන්නා විටදී හෝ කිසියම් නිමැවුම් ඒකකයක් එම රට අනික් රටට වඩා අඩු යෙදවුම් ප්‍රමාණයකින් නිෂ්පාදනය කරන විටදී ය.

  ඉහත දක්වා ඇති උදාහරණයට අනුව තිරිඟු හා රෙදි යන භාණ්ඩ දෙකම නිෂ්පාදනය කිරීමේදී නිරපේක්ෂ වාසියක් ඇමෙරිකා එක්සත් ජනපදය හිමි කරගනී. භාණ්ඩ දෙකම සම්බන්ධව එක් ශ්‍රමිකයකුගේ ඵලදාව, ඉන්දියාවට වඩා ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉහළ අගයක් ගනී. (ලකුණු 02යි)

- කිසියම් රටකට නිෂ්පාදනයෙහි සාපේක්ෂ වාසියක් පවතිනවා යැයි කියනුයේ, එම රටෙහි කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය, අනිත් රටට වඩා අඩුවන විටය.

- ඉහත දක්වන ලද උදාහරණයට අනුව, ඇමෙරිකා එක්සත් ජනපදයට තිරිඟු නිෂ්පාදනයෙහිලා සාපේක්ෂ වාසියක් පවතී. ඇමෙරිකා එක්සත් ජනපදයේ තිරිඟු නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය රෙදි ඒකක 1/2ක් වන අතර ඉන්දියාවේ එය රෙදි ඒකක 3/4ක් වේ. (ලකුණු 02යි)

(ii) - නිෂ්පාදන සම්පත් සුලබ වීම
- ඵලදායිතාව වෙනස් වීම
- පරිමාණානුකූල ඵල
- තාක්ෂණයේ වෙනස්වීම් සහ නව්‍යතා
- ස්ථානගත වීම
- නිෂ්පාදන ජීව චක්‍රය (Product life leycle)
- අභිරුචිය
- රාජ්‍ය ප්‍රතිපත්ති **(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iii) - II වන ලෝක යුද්ධයට පසුව ලෝකයේ ජාත්‍යන්තර වෙළෙඳාමට එරෙහිව පැවති බාධක ඉතා වැදගත් ලෙස අඩු වී තිබේ. මෙලෙස වෙළෙඳ බාධක අඩු කිරීමෙහිලා ප්‍රධාන ප්‍රවේශ දෙකක් මුල් වූයේය. ඒවා නම්,

(අ) ගෝලීය මට්ටමින් සිදු වූ බහු පාර්ශ්වීය සාකච්ඡා හා එකඟතා
(ආ) කලාපීය වශයෙන් ඇති කරගනු ලැබූ වෙළෙඳ හවුල් වේ.

- ගෝලීය ප්‍රවේශ අතර II වන ලෝක යුද්ධයෙන් පසුව GATT (තීරු බදු හා වෙළෙඳාම පිළිබඳ පොදු ගිවිසුම) සංවිධානය යටතේ සිදු වූ වෙළෙඳ ගිවිසුම් වට 8 සඳහන් කළ යුතු ය. මෙම සෑම වටයකදීම තීරු බදු පහළ හෙළීමක් සිදු වී ඇත. 1986-93 කාලය තුළ සාකච්ඡා කොට එකඟතාවකට පැමිණි උරුගුවා වටය මේ ගිවිසුම් අතර ප්‍රධාන තැනක් ගත්තේය. ලෝක වෙළෙඳ සංවිධානය බිහිවූයේ ද එහි ප්‍රතිඵල වශයෙනි.

- ගෝලීය ප්‍රවේශය මත නොරඳා කලාපීය මට්ටමින් ආබාධ වෙළෙඳාම සඳහා අවතීර්ණ වීමට ගනු ලැබුණු උත්සාහය කලාපීය ප්‍රවේශ යටතේ දක්නට ලැබේ. කලාපයේ සාමාජිකයන් අතරෙහි තීරු බදු අඩු කිරීමත්, කලාපයෙන් පිටත සාමාජිකයන් මත ඉහළ තීරු බදු පවත්වා ගැනීමත් මේ යටතේ දක්නට ලැබේ. උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ප්‍රදේශය (NAFTA), යුරෝපා සංගමය (EU), දකුණු ආසියාතික නිදහස් වෙළෙඳ කලාපය (SAFTA) මීන් සමහරකි.

- බහු පාර්ශ්වීය හෙවත් ගෝලීය වෙළෙඳ ප්‍රවේශය සමග සසඳන විට කලාපීය ප්‍රවේශය මෑත කාලය තුළ ඉතා වේගයෙන් ජනප්‍රිය වීමට හා ප්‍රචලිත වීමට පත්ව ඇත.

- ගෝලීය ප්‍රවේශය සමග සසඳන විට කලාපීය ප්‍රවේශය ඔස්සේ ආබාධ වෙළෙඳාමට ප්‍රවේශ වීම සාපේක්ෂ වශයෙන් පහසු ය. ගෝලීය මට්ටමින් තීරු බදු ගිවිසුමක් ඇති කර ගැනීමට වසර ගණනාවක් ගත විය හැකි වුව ද කලාපීය ගිවිසුමක් කෙටි කාලයක් තුළ ඇති කරගත හැකිය. සමාන අවශ්‍යතා හා සමාන සංස්කෘතික පසුබිමක් ඇති අසල්වැසි රටවල් කණ්ඩායමකට ගෝලීය මට්ටමෙන් පවත්වනු ලබන සාකච්ඡාවලට වඩා පහසුවෙන් සාකච්ඡා පවත්වා එකඟතාවලට ළඟා විය හැකිය.

- එහෙත්, ගැඹුරින් බලන විට කලාපීය වෙළෙඳ හවුල් නිර්බාධ ජාත්‍යන්තර වෙළෙඳාමට තර්ජනයක් ලෙස ද සැලකිය හැකිය. කලාපයෙන් පිටත රටවලට කලාපය ඇතුළත රටවල් සමග වෙළෙඳාමේ යෙදීමට ඇති අවස්ථා මේ මගින් අධෛර්යමත් කෙරේ. එමගින් දෙපාර්ශ්වයටම හානි සිදුකර ගැනේ. වඩා විශාල සාමාජික කණ්ඩායමක් සහිතව ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් සිදුවන ගෝලීය මට්ටමේ ප්‍රවේශය ඔස්සේ ලබාදෙන ප්‍රතිලාභ, කලාපීය ප්‍රවේශයක් තුළින් ලබාගත හැකි ප්‍රතිලාභවලට වඩා විශාල වේ.

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04යි)**

(iv) වාසි :

- බාහිර සමතුලිතතාව රැකගැනීම සඳහා නොවෙහෙසී අභ්‍යන්තර සමතුලිතය පවත්වා ගැනීම සඳහා මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්වාධීනව ක්‍රියාත්මක කළ හැකි වේ.

- බාහිර බලපෑම්වලින් තොරව මූල්‍ය ප්‍රතිපත්තිය ස්වාධීනව ක්‍රියාත්මක කළ හැකි වේ.

- නිල විනිමය සංචිත විශාල වශයෙන් රඳවා ගැනීමට අවශ්‍ය නොවේ. එම සම්පත් වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා යොදා ගත හැකිවේ.
- ගෝලීය සම්පත් තරගකාරී භාවිත අතර කාර්යක්ෂමව බෙදා වෙන්කර ගැනීම සඳහා තාත්ත්වික විනිමය අනුපාතික ක්‍රමයක් අවශ්‍ය කෙරේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)**

අවාසි :

- විනිමය අනුපාතිකය නිතර උච්ඡාවචනය වීමත්, ඒ පිළිබඳ අවිනිශ්චිතතාවක් පැවැතීමත් ආයෝජනයට හා වෙළෙඳාමට අහිතකර වේ.
- විනිමය අනුපාතිකයේ උච්ඡාවචන පදනම් කරගනිමින් සමපේක්ෂණ ක්‍රියා හට ගනී. එමගින් විදේශීය විනිමය වෙළෙඳපොළ දැඩි අස්ථායිතාවලට ගොදුරු වේ.
- උද්ධමනය අඩු කරගැනීම සඳහා මූල්‍ය විනයක් පවත්වා ගත යුතුය යන පෙළඹවීම මේ යටතේ ඇති නොවේ. **(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)**

(v)

| | ආනයන වියදම් (US $ milion) | අපනයන ඉපැයීම් (US $ milion) |
|---|---|---|
| 2008 | 14 091 | 8111 |
| 2009 | 10 207 | 7085 |
| 2010 | 13 451 | 8626 |
| 2011 | 20 296 | 105 559 |
| 2012 | 19 183 | 9773 |

**(ආනයන වියදම් ලකුණු 01යි**

**(අපනයන ඉපැයීම් ලකුණු 01යි)**

- **වෙළෙඳ ශේෂ හිඟයට බලපා ඇති කරුණු :**

- ආනයන වියදම් වර්ධනයට සාපේක්ෂව අපනයන ඉපැයීම් වර්ධනය මන්දගාමී වීම. (2010 වර්ෂය සමග සසඳන විට 2011 වර්ෂයේ ආනයන වියදම 51%කින් ඉහළ ගිය අතර අපනයන ඉපැයීම් වැඩි වූයේ 22%කින් පමණි.)

- ගෝලීය වශයෙන් පැවැති ආර්ථික පසු බැසීම කරන කොට ගෙන ශ්‍රී ලංකාවේ අපනයන ඉල්ලුම අධෛර්යමත් වීම.

- ආනයන වියදම් ඉහළ යාමට ප්‍රබල හේතුවක් වූයේ යටිතල පහසුකම් සංවර්ධනයට රජයේ ආයෝජනය විශාල වශයෙන් යොදවමින් ආනයනය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩවල වටිනාකම ඉහළ යාම ය.

- අපනයන ක්ෂේත්‍රය භාණ්ඩ කිහිපයකට පමණක් සීමා වී ඇති අතර අපනයන විවිධාංගීකරණය සිදු වී ඇත්තේ ඉතා සුළු වශයෙන් වීම.

**(ඕනෑම කරුණු 02ට ලකුණු 02යි)**

**08 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 44%කි (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 54%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 13%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (i) කොටස වඩාත්ම පහසු වී ඇත. එහි පහසුතාව 57%කි. පහසුතාව අඩුම කොටස (v) වී ඇති අතර, එහි පහසුතාව 13%කි. (iii) කොටස ද 17% ක අඩු පහසුතාවක් දක්වා ඇත.

- i කොටසේ පහසුතාව 57%කි. මෙම කොටස මගින් සංඛ්‍යාත්මක උදාහරණ සපයමින් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය අතර වෙනස විග්‍රහ කිරීමේ කුසලතාව පරීක්ෂා කරනු ලබයි. එම කුසලතාව ඇගයීමේදී පිරිනැමෙන ලකුණුවලින් 43%ක් සිසුන් විසින් ලබා නොමැති බව අනාවරණය වේ. විශේෂයෙන් සංඛ්‍යාත්මක නිදසුන් මගින් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි විග්‍රහ කිරීමට සිසුන් තුළ කුසලතා වර්ධනය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.
- රටවල් අතර වෙළෙඳ රටා තීරණය වීමට හේතුවිය හැකි සාධක විමර්ශනය කරන දෙවන කොටසෙහි පහසුතාව 35%කි. මෙහිදී පරීක්ෂා කෙරෙන්නේ සාපේක්ෂ වාසි හෝ නිරපේක්ෂ වාසි තීරණය වීම කෙරෙහි බලපාන සාධක මත වෙළෙඳ රටාව තීරණය වන ආකාරයයි. නමුත් එම සාධක විස්තර කිරීමට සිසුන් තුළ වූ අවබෝධය ප්‍රමාණවත් නොවන බව ඊට හිමි ලකුණුවලින් 65%ක්ම අහිමි කර ගැනීම මගින් පැහැදිලි වේ.
- iii කොටස මගින් පරීක්ෂා කොට ඇත්තේ ජාත්‍යන්තර වෙළෙඳාමට ඇති බාධක ඉවත් කිරීමෙහිලා යොදා ගැනෙන ගෝලීය හා කලාපීය ප්‍රවේශ සංසන්දනය කොට, ඒවා අතර වෙනස්කම් දැක්වීමේ කුසලතාවයි. මෙම කොටසෙහි පහසුතාව 17%කි. එමගින් අනාවරණය වන්නේ සිසුන් වැඩි දෙනකුටම උක්ත මාතෘකාව පිළිබඳ ප්‍රමාණවත් දැනුම හා අවබෝධය නොමැති බව ය. එබැවින් වෙළෙඳ බාධක ඉවත් කිරීමෙහිලා ගෝලීය මට්ටමෙන් හා කලාපීය මට්ටමෙන් ගනු ලැබූ ප්‍රයත්න විස්තර කිරීමටත් සංසන්දනය කිරීමටත් අවශ්‍ය දැනුම හා අවබෝධය ප්‍රවර්ධනය කිරීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය සංවිධානය කරගත යුතුය.
- iv කොටස මගින් විමසා ඇත්තේ නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක වාසි හා අවාසි පිළිබඳව ය. මෙම ප්‍රශ්නයට සිසුන් දක්වන ලද ප්‍රතිචාර අනුව 29%ක් වැනි අඩු පහසුතාවක් පෙන්වීම සතුටුදායක නොවේ. සිසුන් වැඩි පිරිසක් ඒ පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් ලෙස ලබා නොමැත. එබැවින් විනිමය අනුපාතික ක්‍රමවල වාසි අවාසි විග්‍රහ කිරීමට සිසුන් තුළ ඇති හැකියාව හා අවබෝධය වැඩි දියුණු වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කරගත යුතුය.
- v වන කොටස මගින් විමසා ඇත්තේ ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම්වල හා ආනයන වියදම්වල මෑත කාලීන ප්‍රවනතාවත් ශ්‍රී ලංකාව මුහුණ පාන විශාල වෙළෙඳ හිඟයට බලපා ඇති හේතු පිළිබඳවත් ය. මෙම කොටසෙහි පහසුතාව 13%කි. සිසුන් වැඩි පිරිසකට මෙම කොටස ඉහළ දුෂ්කරතාවක් ඇති කොට තිබෙන්නේ එහි මුල් කොටසේදී ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන වටිනාකම්වල මෑත කාලීන ප්‍රවනතා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා ය. එබැවින් ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිණුමේ හිඟය වෙනස් වූ ආකාරය හා ඊට බලපෑ හේතු හෙළිදරව් වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුය.

## 09 ප්‍රශ්නය

9. (i) ආර්ථික වර්ධනය හා සංවර්ධනය අතර වෙනස විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි)

(ii) රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(iii) "ශ්‍රී ලංකාව මානව සංවර්ධනය සම්බන්ධයෙන් ජාතික මට්ටමෙන් ලබා ගෙන ඇති ජයග්‍රහණ සිත් ඇදගන්නාසුලු වුව ද, ප්‍රාදේශීය වශයෙන් හා ආංශික වශයෙන් මානව සංවර්ධනයේ අසමානතා තවදුරටත් දක්නට ලැබේ." පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ කැපීපෙනෙන ලක්ෂණ හඳුනා ගන්න. ඒවායේ ආර්ථික ඇඟැවීම් මොනවා ද? (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(09) (i) - ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වන්නේ කිසියම් රටක නිෂ්පාදන ධාරිතාවේ (විභව නිමැවුමේ) හට ගන්නා අඛණ්ඩ වැඩිවීමකි.

- ආර්ථික වෘද්ධිය, සංවර්ධනයට වඩා පටු සංකල්පයක් වන අතර, එය පෙන්නුම් කරනුයේ කිසියම් රටක සම්පත් ප්‍රමාණයත් ඒවායේ ගුණාත්මක තත්ත්වයත් තාක්ෂණයත් ඉහළ යාම නිසා මූර්ත ජාතික නිෂ්පාදිතයේ හට ගන්නා වැඩිවීමයි. එය ද.දේ.නි. හි වැඩි වීමක් මගින් මිනිය හැකිය.

- සංවර්ධනය අභිමතානුරූපී සංකල්පයකි. එය සියලුම මිනිස් ජීවිතවල ගුණාත්මක තත්ත්වය ඉහළ නංවන ක්‍රියාවලියකි. මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කරගැනීමත් පීඩනයෙන් මිදී සිටීමත් ආත්ම අභිමානය වර්ධනය කරගැනීමට හිතකර වූ දේශපාලන, සමාජ හා ආර්ථික පරිසරයක් හා ආයතනික ව්‍යුහයක් ගොඩනංවා ගැනීමත් සංවර්ධනයේ ඉතා වැදගත් අංශ වේ.

- මේ අනුව සංවර්ධනය බහුමානීය ප්‍රපංචයක් වන අතර එය ප්‍රමාණවත්ව මිනුම් කිරීමට ද දර්ශක රාශියක් අවශ්‍ය වේ. එය අවශ්‍යයෙන් ම දර්ශක කිහිපයක් කැටිකරගත් සංයුක්ත දර්ශකයක් විය යුතු නොවේ.

- ආර්ථික වෘද්ධි ක්‍රියාවලියේදී ස්වභාවික සම්පත් හායනයට ලක්වීමත් එමගින් පරිසර දූෂණය, මාර්ග තදබදය, ලෙඩරෝග යනාදිය හට ගැනීමත් වැනි දෑ කෙරෙහි සැලකිල්ලක් දක්වනු නොලැබේ. එහෙත් සංවර්ධන ක්‍රියාවලිය තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන අතර වර්තමාන අවශ්‍යතා සපුරා ගත යුත්තේ අනාගත අවශ්‍යතා සපුරා ගැනීමට ඇති ඉඩකඩ පැහැර නොහරිමින් බව ද පෙන්වා දේ.

- ආර්ථික වෘද්ධිය සංවර්ධනය සඳහා අවශ්‍ය කොන්දේසියක් වන නමුදු ප්‍රමාණවත් කොන්දේසියක් නොවේ.

(එක් කරුණකට ලකුණු දෙක බැගිනි කරුණු තුනකට ලකුණු 05යි)

(ii) ඵලදායිතාව කෙරෙහි බලපාන සාධක :

- ශ්‍රමයේ ගුණාත්මක තත්ත්වය (අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, අත්දැකීම්)
- තාක්ෂණය
- නව්‍යතා (පර්යේෂණ හා සංවර්ධනය සඳහා දරන වියදම්)
- ප්‍රාග්ධන ආයෝජන
- මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂමතාව
- ස්වභාවික සම්පත්
- යටිතල පහසුකම්
- නියාමන

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)

(iii) - සාර්ක් කලාපීය රටවල් අට අතුරෙන් ශ්‍රී ලංකාව ඉතා ඉහළ මානව සංවර්ධන මට්ටමක් වාර්තා කොට තිබේ. 2013 ලෝක මානව සංවර්ධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාව 0.715ක මානව සංවර්ධන දර්ශක අගයක් ලබාගත් අතර, රටවල් 187ක් අතුරෙන් 92 වැනි ස්ථානයට පත්විය.

- දිළිඳුකම අඩු කිරීමේ සහශ්‍රක සංවර්ධන අභිමතාර්ථය සපුරාලිය යුතුව ඇත්තේ 2015 වර්ෂයේ දී වුව ද, දැනටමත් ශ්‍රී ලංකාව එම ඉලක්කය අත් කරගෙන ඇත. ජාතික දරිද්‍රතා අනුපාතය 1990/91 වර්ෂයේදී 8.9%ක් දක්වා අඩුවිය.

  දරිද්‍රතාව පිළිබඳ ප්‍රාදේශීය විෂමතා කැපී පෙනේ. විශේෂයෙන්ම ඇතැම් දිස්ත්‍රික්කවලත් ගැටුම් පැවැති ප්‍රදේශවලත් වතු අංශයේත් දරිද්‍රතාව සැලකිය යුතු ලෙස පවතී.

  මඩකලපුව දිස්ත්‍රික්කයෙහි දරිද්‍රතා දර්ශකය 2006/07 වර්ෂයේදී 10.7%ක් වුව ද 2009/10 වර්ෂයේදී එය 20.3%ක් දක්වා වැඩි වී තිබේ. අම්පාර දිස්ත්‍රික්කයේ 10.9%ක සිට 11.8%ක් දක්වා එම කාලය තුළ වැඩි වී ඇත.

- බස්නාහිර පළාත සෙසු පළාත් අභිබවා දළ දේශීය නිෂ්පාදිතයට විශාලතම දායකත්වය සපයා ඇත. එහි දායකත්වය 44%ක් විය. එහෙත් අවශේෂ පළාත් ගත් විට අතිශයින් පහළ දායකත්වයක් පෙන්නුම් කොට තිබේ. උදාහරණ වශයෙන් උතුරු පළාතේ දායකත්වය 4%ක් වූ අතර ඌව පළාතේ 5%ක් විය.

- යටිතල පහසුකම් ව්‍යාප්තිය අතින් ගත් විට ද ප්‍රාදේශීය විෂමතා කැපී පෙනේ. වතු අංශයේ කුටුම්භ 23%කට විදුලිය පහසුකම් නොමැති අතර 40%කට පිරිසිදු පානීය ජල පහසුකම් නොමැත.

- ඉහළ ද්විතීය අධ්‍යාපනය සඳහා ඇති පහසුකමේ ව්‍යාප්තියේ ද විෂමතා පවතී. එම විෂමතා වතු අංශයේ කැපී පෙනේ. වතු අංශයේ ළමයින් 54%ක් පමණි, ඉහළ ද්විතීය අධ්‍යාපනයට යොමු වනුයේ. එහෙත් මෙම ප්‍රතිශතය නාගරික හා ග්‍රාමීය අංශවල පිළිවෙළින් 86%ක් හා 81%ක් විය.

**(එක් පැහැදිලි කිරීමකට ලකුණු 02 බැගිනි. මුළු ලකුණු 05යි)**

(iv) **ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ලක්ෂණ :**

- ශ්‍රී ලංකාව ඉතා ඉහළ මර්ත්‍යතා හා සාඵල්‍යතා අනුපාත සහිත අඩු ජනගහන වර්ධනයක් ඇති අයහපත් තත්ත්වයක සිට, ඉතා අඩු මර්ත්‍යතා හා සාඵල්‍යතා අනුපාත සහිත අඩු ජනගහන වර්ධනයක් ඇති යහපත් තත්ත්වයක් කරා මාරුවීම ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ප්‍රධාන ලක්ෂණය වේ.

- ජනගහනයේ වයස් ව්‍යුහය වෙනස්වීම පිරමීඩාකාර හැඩයක සිට සිලින්ඩරාකාර හැඩයකට ක්‍රමයෙන් නැඹුරුවීමක් පෙන්නුම් කරයි. ළමා ජනගහනයට සාපේක්ෂව වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය ඉහළ යාමට නැඹුරු වී ඇත.

- අවුරුදු 60ට වැඩි ජනගහන ප්‍රතිශතය වර්තමානයේ 11%ක් වන අතර එය 2020 වන විට 16% දක්වාත් 2050 වන විට 29% දක්වාත් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

- ශ්‍රම හමුදාවට ඇතුළත් වන අවුරුදු 25-54 වයස් කොටසේ ජනගහනය අඩුවීමේ නැඹුරුවක් පවතී.

- කාන්තාවන්ගේ ආයු අපේක්ෂාව පුරුෂයන්ට සාපේක්ෂව ඉහළ යන අතර වියපත් වයස්වලදී වැන්දඹු කාන්තාවන්ගේ ප්‍රතිශතය ද ඉහළ යනු ඇත.

**(ඕනෑම කරුණු 02කට ලකුණු 02යි)**

- වියපත් ජනගහනය සඳහා ලබාදිය යුතු විශ්‍රාම දීමනා ඉහළ යාම රාජ්‍ය මූල්‍ය කෙරෙහි පීඩනයක් ඇති කරන බැවින් රාජ්‍ය ආයෝජනයට අයහපත් ලෙස බලපෑමෙන් ආර්ථික වෘද්ධියෙහි පසුබැසීමක් ඇති විය හැකිය.

- වියපත් ජනගහනය, වැඩ කළ හැකි වයසේදී උපයාගත් ඉතිරි කිරීම්, වියපත් වූ පසු විශාල වශයෙන් පරිභෝජනයට යොදා ගැනීම නිසා ප්‍රාග්ධන සම්පාදනයට අහිතකර බලපෑමක් ඇති වේ.

- යැපුම් අනුපාතය ඉහළ යාම නිසා වැඩ කරන ජනගහනය මත වැඩි ආර්ථික පීඩනයක් ඇති වේ. එය කුටුම්බ ඉතුරුම් අඩුවීමට හේතුවක් වන අතර, ආර්ථික වෘද්ධිය කෙරෙහි ද අහිතකර ලෙස බලපෑ හැකි ය.

- ළමා ජනගහනය අඩුවීම නිසා ශ්‍රම හමුදාවේ සංකෝචනයක් හට ගනු ඇත. එය ද ආර්ථික වෘද්ධියට අහිතකර වේ.

- ළමා ජනගහනය අඩුවීම නිසා ආණ්ඩුවට අධ්‍යාපනය සඳහා වැය කිරීමට සිදුවන මුදල් ප්‍රමාණය අඩුකර ගැනීමට හැකි වේ. එම සම්පත් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමට යොදා ගැනීමෙන් ආර්ථික වෘද්ධියට හිතකර බලපෑමක් ඇතිකර ගත හැකි වේ.

**(ඕනෑම කරුණු 03කට ලකුණු 03යි)**

**09 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගෙන් 44%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 75%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (i) කොටස පහසුම ප්‍රශ්නය වී ඇත. එහෙත් එහි පහසුතාව ද 27%කි. පහසුතාව අඩුම කොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 13%ක් පමණි. සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රශ්නය අඩු පහසුතාව සහිත ප්‍රශ්නයකි.

- i වන කොටසේ පහසුතාව 27%කි. එම ප්‍රශ්නය මගින් පරීක්ෂා කර ඇත්තේ ආර්ථික වර්ධනය හා සංවර්ධනය අතර වෙනස විචාරාත්මකව විග්‍රහ කිරීමේ හැකියාව පිළිබඳව ය. මෙම කොටසට සිසුන් දැක් වූ ප්‍රතිචාර අනුව 73%ක් වැනි දුෂ්කරතා මට්ටමක් පැවතීම උක්ත මාතෘකාව පිළිබඳ ව සිසුන්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවන බව අනාවරණය කරයි. එමනිසා ආර්ථික වර්ධනය, ආර්ථික සංවර්ධනය හා සංවර්ධනය යන සංකල්ප අතර වෙනස හා සම්බන්ධය විචාරාත්මකව විග්‍රහ කිරීමට සිසුන් තුළ කුසලතාව වර්ධනය කළ යුතුය.

- ii වන කොටස, රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක කවරේ ද යන්න විමසයි. එම කොටසෙහි පහසුතාව 20%කි. සිසුන් විශාල පිරිසකට එම කොටස දුෂ්කර වී ඇත්තේ ඵලදායිතාව තීරණය කරන සාධක පිළිබඳ නව ප්‍රවේශ ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීමේ නොහැකියාව නිසාවෙනි. ඵලදායිතාව තීරණය කරන සාධක යාවත්කාලීනව අනාවරණය කිරීමට සිසුන්ගේ දැනුම සංවර්ධනය කළ යුතුය.

- iii වන කොටස, ශ්‍රී ලංකාව මානව සංවර්ධනය සම්බන්ධයෙන් ලබා ඇති සාධනීය මට්ටම ජාතික, ප්‍රාදේශීය හා ආංශික වශයෙන් සැසඳීමට සහ විවරණය කිරීමට සිසුන් තුළ වූ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමට යොමු වූවකි. මෙම කොටස සඳහා සිසුන් දැක්වූ ප්‍රතිචාර අනුව පහසුතාව 16%කි. ඉන් අනාවරණය වන්නේ වැඩි සිසුන් පිරිසක් උක්ත මාතෘකාව ආශ්‍රිත තොරතුරු හා සංඛ්‍යාත්මක දත්ත පිළිබඳ ව ප්‍රමාණවත් දැනුමකින් සහ අවබෝධයකින් පසු නොවූ බව ය. එබැවින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේදී සිසුන් තුළ එම කුසලතාව වර්ධනය කිරීමට අවධානය යොමු කළ යුතුය.

- iv වන කොටස ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ කැපී පෙනෙන ලක්ෂණ විස්තර කිරීම වෙත යොමු වූවකි. එම කොටස කෙරෙහි සිසුන් පෙන්නුම් කළ ප්‍රතිචාර අනුව පහසුතාව 13%කි. වැඩි සිසුන් පිරිසක් දැක්වූ ප්‍රතිචාර අසාර්ථක වීමට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක වෙනස්වීම් පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන් සිසුන් යාවත්කාලීන වී නොමැති වීමයි. එබැවින් ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු පිළිබඳ කාලීන අනාවරණ සහිතව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධන කළ යුතුය.

## 10 ප්‍රශ්නය

**10. (i) ශ්‍රී ලංකාවේ ඉතුරුම්-ආයෝජන පරතරයේ මෑතකාලීන උපනති පරීක්ෂා කරන්න.** *(ලකුණු 04 යි)*

**(ii) වර්ෂ 2016 ට ප්‍රථම එක්සත් ජනපද ඩොලර් 4000 ඉක්මවූ ප්‍රතිශීර්ෂ ආදායම් ඉලක්කයක් අත්කර ගැනීමට අපේක්ෂා කරන ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධයෙන්, දැනට පවතින සෘණ ඉතුරුම්-ආයෝජන පරතරය ගම්‍ය කරන දෑ කවරේ ද?** *(ලකුණු 06 යි)*

**(iii) ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීමේ දී මෙරට සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග කවරේ ද?** *(ලකුණු 05 යි)*

**(iv) දිළිඳු රටවල ස්ථාවර හා දිගුකාලීන ආර්ථික වර්ධනයක් අත් කර ගැනීමේ දී, යහපාලනය පවත්වා ගැනීම කෙතෙක් දුරට වැදගත් වන්නේ ද?** *(ලකුණු 05 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(10) (i)

ඉතුරුම්-ආයෝජන පරතරයේ මෑත කාලීන උපනති
(ද.දේ.නිෂ්පාදිතයේ % ලෙස)

| වර්ෂය | ඉතුරුම් | | ආයෝජනය | දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය |
|---|---|---|---|---|
| | දේශීය | ජාතික | | |
| 2010 | 19.3 | 25.4 | 27.6 | -8.3 |
| 2011 | 15.4 | 22.0 | 30.0 | -14.6 |
| 2014 | 17.0 | 24.0 | 30.6 | -13.7 |

**(ඕනෑම වර්ෂයක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 04යි)**

(ii) - ඉහළ ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමට සහ පවත්වාගෙන යාමට මධ්‍ය කාලීන හා දිගු කාලීන වශයෙන් ජාතික ඉතුරුම් හා ආයෝජන ඉහළ නංවා ගත යුතුය. 2016ට ප්‍රථම ප්‍රතිශීර්ෂ ආදායම එක්සත් ජනපද ඩොලර් 4000 ඉලක්කය සපුරා ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරන බැවින්, ඒ සඳහා ආයෝජන මට්ටම දැනට පවත්නා 30% ප්‍රමාණයේ සිට 33% දක්වා ඉහළ නංවා ගත යුතුය.

- දැනට ශ්‍රී ලංකාවේ ඉතුරුම් - ආයෝජන පරතරය සෘණ අගයක් ගන්නා අතර එහි ප්‍රමාණය ද දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 7%-8% ප්‍රමාණයකි. (2012 වර්ෂයේදී ජාතික ඉතුරුම් 24%ක් වූ අතර ආයෝජනය 30.6%ක් විය.)

- සෘණ ඉතුරුම්-ආයෝජන පරතරය මගින් ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ හිඟ ඇති කරනු ලැබේ. මෙම හිඟය මූල්‍යකරණය කිරීමේදී විදේශ ණය බර වැඩිවීම සහ විදේශීය වත්කම් පහළ වැටීම ද සිදුවේ.

- විශාල පරිමාවේ විදේශ මූල්‍යකරණ ක්‍රියාවලියක් ඔස්සේ ඉතුරුම්-ආයෝජන පරතරය පියවා ගත හැකි නමුදු එවැනි ක්‍රියාමාර්ගයක ආර්ථික ප්‍රතිවිපාක එතරම් හිතකර නොවේ. එවැනි ක්‍රියා, දේශීය මුදල් ඒකකයේ විදේශීය අගය ඉහළ යාමටත් ශ්‍රී ලංකාවේ ගෝලීය තරගකාරිත්වය දුර්වලවීමටත් හේතු වේ.

- විදේශ ණය සේවා ගාස්තු ඉහළ යාම ගෙවුම් ශේෂය මත මෙන්ම රාජ්‍ය මූල්‍ය මත ද අතිරේක බරක් ඇති කරන අතර, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යටතේ අයවැය හිඟයේ ප්‍රමාණය 5%ක මට්ටමක් කරාගෙන ඒමට ද අපහසු වනු ඇත.

- රාජ්‍ය අංශයේ ඇඩි සම්පත් සංරෝධකයක් ඇති බැවින්, ආයෝජන මට්ටම 30% සිට 33% දක්වා ඉහළ නැංවීමට රාජ්‍ය අංශයට හැකියාවක් නොමැත. එහි ලා දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන් ආකර්ශණීය කර ගැනීමත් ඒ සඳහා හිතකර පරිසරයක් රට තුළ නිර්මාණය කර ගැනීමත් අත්‍යවශ්‍යව පවතී.

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 06යි)**

(iii) - ඉදිරි කාලය තුළ, සංචාරක ක්ෂේත්‍රය ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමට අපේක්ෂිත ය. 2016 වන විට ශ්‍රී ලංකාවට විදේශ සංචාරකයන් මිලියන 2.5ක් පැමිණෙනු ඇතැයි නිමානය කොට ඇත. මෙම පසුබිම තුළ සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේදී ශ්‍රී ලංකාව අභියෝග රැසකට මුහුණ දෙනු ඇත.

- සංචාරක ව්‍යාපාරය සඳහා රුකුල් දෙන හිතකර පරිසරයක් රට තුළ නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. දැනට මෙහිලා ඇතැම් ගැටලු පැන නැගී ඇත. ඇතැම් ප්‍රබල බටහිර හා යුරෝපා රටවල් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් දරන ආකල්ප ශුභදායි නොවේ. කිසියම් රටක්, ප්‍රබල සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීමට ක්‍රියාකිරීමේදී එම රට පිළිබඳ ව පවත්නා ගෝලීය ආකල්ප ඉතා තීරණාත්මක ය. එබැවින් මෙම ආකල්ප වෙනස් කොට ශ්‍රී ලංකාව පිළිබඳ යහපත් ආකල්ප විදේශීය රටවල් තුළ ඇති කිරීමට අවශ්‍ය ශක්තිමත් වැඩ පිළිවෙළක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ.

- සංචාරකයන් ආකර්ෂණය කරන ප්‍රධාන අංශ අවධාරණය කරමින් විවිධාංගීකරණයක් සහිත පුළුල් වෙළෙඳපොළක් බිහිකිරීමට වෙළෙඳපොළ කේන්ද්‍රීය උපාය මාර්ග සැලසුම් කළ යුතුය. දැනට පවත්නා ප්‍රවේශය මගින් සැපයුම මත කේන්ද්‍ර වූ සංචාරක වෙළෙඳපොළෙහි ඉල්ලුම් පාර්ශ්වය සහ ඒවායේ වෙනස්කම් ගැන ප්‍රමාණවත් අවධානයක් යොමු කොට නොමැත.

- අනාගතයේ අපේක්ෂිත වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් නවාතැන් පහසුකම් කඩිනමින් ඇති කිරීම තවත් ප්‍රබල අභියෝගයක් වේ. සංචාරකයන් මිලියන 2.5ක් පැමිණෙතියි අපේක්ෂා කෙරේ නම් ඔවුනට නවාතැන් සැපයීමට කාමර 40 000ක් පමණ අවශ්‍ය වෙතියි ඇස්තමේන්තු කොට ඇත. එහෙත් දැනට සංචාරක කර්මාන්තය තුළ විධිමත් හා නොවිධිමත් දෙඅංශයේම ඇත්තේ කාමර 22 000ක් පමණ ප්‍රමාණයකි. එබැවින් අතිරේක කාමර 18 000ක ඌනතාවක් පවතී.

- සංචාරකයන් ආකර්ෂණය කෙරෙන ස්ථාන පිරිසිදුව පවත්වා ගෙන යාමටත් ඒවාට පහසුවෙන් ළඟා විය හැකි ආකාරයට සංවර්ධනය කිරීමටත් සැලකිය යුතු ආයෝජනයක් කිරීමට රජයට සිදුවනු ඇත. විශේෂයෙන් ම දුම්රිය සේවය නවීකරණය කිරීම, මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම, ගුවන්තොටුපල පහසුකම් පුළුල් කිරීම ඒවා අතර ප්‍රධාන තැනක් ගනී.

- මානව ප්‍රාග්ධනයේ ඌනතාව සංචාරක ව්‍යාපාරය හමුවේ ඇති තවත් ප්‍රබල අභියෝගයකි. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මනාව තේරුම් ගත හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් පුහුණු ශ්‍රම හමුදාවක් ඉතා කඩිනමින් බිහිකර ගත යුතුව ඇත. මෙහිලා දැනට පවත්නා පුහුණු කිරීම් පහසුකම් කිසිසේත් ප්‍රමාණවත් නොවේ.

**(ඕනෑම එක් කරුණකට ලකුණු 02 බැගිනි. මුළු ලකුණු 05යි)**

(iv) - පාලනකරණය යන්නෙන් අදහස් කෙරෙනුයේ රටක් තුළ හෝ සංවිධානයක් තුළ තීරණ ගැනීමේ හා තීරණ ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියයි. මෑත කාලයේ සංවර්ධනය පිළිබඳ ව සිදුවන කතිකාවල "පාලනකරණය", "යහපාලනය" වැනි පද වැඩි වැඩියෙන් ව්‍යවහාරයට එනු දැකිය හැකිය. අසාර්ථක රාජ්‍යයක් හෝ සමාජයක් බිහිවීමේලා වගකිව යුතු ප්‍රධානතම මූල සාධකයක් ලෙස අයහපත් පාලනකරණය (bad governance) දක්වනු ලැබේ. විදේශ ආධාර සපයන රටවල් මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය ආයතන ද ආධාර හා ණය සැපයීම් වැඩි වැඩියෙන් යොමු කොට ඇත්තේ අදාළ රටවල් යහපාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට එකඟතාව දක්වනවාද යන කොන්දේසිය කෙරෙහි ය.

- යහපාලනය යන්නෙන් ප්‍රධාන කරුණු 8ක් අදහස් කෙරේ. ඒවා නම්,
  - (i) සහභාගිත්වය
  - (ii) එකඟතාව
  - (iii) වගවීම
  - (iv) පාරදෘශ්‍යභාවය
  - (v) සංවේදී බව
  - (vi) සඵල හා කාර්යක්ෂමතාව
  - (vii) සාධාරණත්වය හා
  - (viii) නීතියේ ආධිපත්‍යයයි.

  මෙම කරුණුවලින් අදහස් කෙරෙනුයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී දූෂණයෙන් තොරව එය සිදුවන බවත්, සුළු ජාතීන්ගේ අදහස් ද සැලකිල්ලට ගන්නා බවත්, සමාජයේ ආන්තිකකරණයට ලක්වූ කොටස්වල හඬට කන් දෙන බවත් ය.

- යහපාලනය ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසියකි. රටක ආර්ථික සංවර්ධිත ක්‍රියාවලියේදී පාලනකරණයේ ගුණාත්මක තත්ත්වය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. පාලනකරණයේදී ඉතා වැදගත් ක්ෂේත්‍රයක් වනුයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයයි. දිළිඳු රටකට උද්ධමනය පාලනය කොට තබා ගැනීමටත්, සංවර්ධනයට අවශ්‍ය කරන සම්පත් සොයා ගැනීමටත්, ප්‍රමුඛතා මත ශුභ සාධන වියදම් දැරීමටත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යටතේ අයවැය හිඟය පහළට ගෙන ඒම ඉතා වැදගත් වේ.

- රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රය හැරුණු විට යහපාලනය නොමැතිකමෙහි බලපෑමට හසුවන තවත් ක්ෂේත්‍රයක් වනුයේ විදේශ ආයෝජන ක්ෂේත්‍රයයි. රටේ සංවර්ධනය වෙනුවෙන් විදේශ ආයෝජන අවශ්‍ය කරන තීරණාත්මක ක්ෂේත්‍ර සඳහා විදේශ ආයෝජන ලබා ගැනීමට තැත් කිරීමේදී, ආයෝජන බලපත්‍ර ලබාදීම පිණිස නිලධාරීන් විසින් අල්ලස් ඉල්ලා සිටීම නිසා විදේශීය ආයෝජකයෝ අධෛර්යමත් වෙති.

- යහපාලනය යටතේ නීතියේ ආධිපත්‍යය පවත්වා ගැනීම, දේපොළ හිමිකම් සුරක්ෂිත කරදීම, පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් රැකදීම රටක සංවර්ධනයට ඍජුව ම අදාළ වනු ඇත.

**(ඕනෑම එක් කරුණකට ලකුණු 02 බැගිනි. මුළු ලකුණු 05යි)**

10 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලින් අඩුම පිරිසක් තෝරා ඇති ප්‍රශ්නය 10 වන ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 16%කි. (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 88%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 9%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (ii) කොටස වඩාත්ම අපහසු වී ඇත. එහි පහසුතාව 8%කි. පහසුතාව වැඩිම කොටස (iii) වේ. එහි පහසුතාව 31%කි. i වන සහ iv වන කොටස් ද අඩු පහසුතාවක් ගෙන ඇති අතර ඒවායේ පහසුතා 9% බැගිනි. සමස්තයක් ලෙස ගත්විට අඩුම පහසුතාව සහිත ප්‍රශ්නයයි.

- i කොටසේ පහසුතාව 9%ක් තරම් අඩු අගයකි. වර්ෂ කිහිපයක ආර්ථික දත්ත මතකයේ තබා නොගැනීම නිසා පහසුතාව අවම වී ඇතැයි සිතිය හැකිය. සංඛ්‍යා දත්ත පිළිබඳ තොරතුරු විමසන ප්‍රශ්න ශිෂ්‍යයා විසින් තෝරා ගන්නේ අවම වශයෙන් බව පෙනේ. අඩුම පිරිසක් තෝරා ගෙන ඇත්තේ මෙම ප්‍රශ්නයයි.

- ii කොටස මෙම ප්‍රශ්නයේ අඩුම පහසුතාව පෙන්වයි. එහි පහසුතාව 8%කි. දැනට පවතින ඉතුරුම්-ආයෝජන පරතරය ආශ්‍රයෙන් ගම්‍ය කරන දෑ පිළිබඳ ව ශිෂ්‍යයාගේ විශ්ලේෂණ හැකියාව විමසීමට ලක් කෙරේ. එහෙත් ශිෂ්‍යයා පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව පෙන්වයි. ශිෂ්‍යයා විශ්ලේෂණාත්මක චින්තනයට හුරුවන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීම අවශ්‍ය බව පෙනේ.

- iii කොටස මෙම ප්‍රශ්නයේ ඉහළම පහසුතාව පෙන්වන කොටසයි. එහි පහසුතාව 31%කි. සංචාරක කර්මාන්තයේ දියුණුව කෙරෙහි රජයේ මැදිහත්වීම හේතුවෙන් ශිෂ්‍යයා ද ඒ පිළිබඳ ව යම් අවබෝධයකින් යුක්ත බව පෙන්වයි. තොරතුරු සෙවීම කෙරෙහි ශිෂ්‍යයා උනන්දු කරවීමෙන් මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ හැකියාව වර්ධනය කළ හැකිය.

- iv කොටසේ පහසුතාව 9%කි. යහපාලනය/පාලනකරණය වැනි නව සංකල්ප පිළිබඳ ව ශිෂ්‍යයාගේ දැනුම ප්‍රමාණවත් නොවීම නිසා පහසුතාව අඩුවී ඇතැයි සිතිය හැකිය. වැඩිදුර කියවීම් කෙරෙහි යොමු වන පරිදි පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීමෙන් මෙවැනි ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු ලිවීමට ශිෂ්‍යයා යොමු කළ හැකි වනු ඇත.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ඇගයීම් වාර්තාව සැකසීමේදී භාවිත කරන ලද තොරතුරු සංවිධානය කිරීමෙන්, II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි තෝරාගැනීමේ ප්‍රතිශතය හා පහසුතාව දැක්වෙන පහත සඳහන් ප්‍රස්තාරය සහ වගුව ගොඩනැගිය හැකිය.




| ප්‍රශ්න අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තෝරාගැනීමේ ප්‍රතිශතය | 97 | 89 | 49 | 36 | 23 | 69 | 85 | 44 | 44 | 16 |
| පහසුතාව | 29 | 51 | 41 | 35 | 39 | 26 | 42 | 30 | 19 | 14 |

මෙම II පත්‍රය "අ" සහ "ආ" වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න "අ" කොටසට ද අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න "ආ" කොටසට ද අයත් ය. අපේක්ෂකයන් විසින් "අ" කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද "ආ" කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු විය.

"අ" කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරාගැනීමට ලක්ව ඇත්තේ අංක 1 සහ 2 ප්‍රශ්න වන අතර "ආ" කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන්ම තෝරා ගැනීමට ලක්ව ඇත්තේ අංක 6 සහ 7 ප්‍රශ්න වේ. ඒවා තෝරාගනු ලැබීමේ ප්‍රතිශත පිළිවෙළින් 97%, 89%, 69% සහ 85% වේ. ඊළඟට වැඩිම තෝරාගනු ලැබීමට පත්ව ඇත්තේ 3 වන ප්‍රශ්නයයි. විකල්ප ප්‍රශ්න හයක් අතුරෙන් වැඩිම තෝරාගනු ලැබීමට ලක්ව ඇති එම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගෙන් හරි අඩකට ආසන්න සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත. විෂය නිර්දේශයෙහි මෙම ප්‍රශ්නවලට පාදක වූ තේමා සහ විෂය කරුණු, ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයට ලක් වූ හා සිසුන් අතර වඩාත් ජනප්‍රිය වූ ඒවා විය යුතුය. එබැවින් එම ප්‍රශ්නවල පහසුතා සාපේක්ෂ වශයෙන් ඉහළ අගය ගත යුතුය. ප්‍රශ්න තෝරා ගනු ලැබීමේ ප්‍රතිශතවල අවරෝහණ පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 1, 2, 7, 6 සහ 3 වේ. එහෙත් පහසුතාවල එම පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් 2, 7, 3, 5 සහ 4 වේ. අංක 1 සහ 6 ප්‍රශ්න වැඩියෙන් තෝරා ගනු ලැබ ඇති නමුදු, ඒවාට සපයන ලද පිළිතුරු එතරම් සතුටුදායක නොවන බවත් වැඩියෙන් ලකුණු උපයා ගැනීමට සමත් වී නොමැති බවත් මෙම තොරතුරුවලින් ගම්‍ය වේ. එබැවින් සිසුන්ගේ වැඩි අවධානයට ලක්වන මෙවැනි ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලියේදී සිසුනට මඟපෙන්වීම වඩාත් සාර්ථක ප්‍රතිඵල ලැබීමට මහෝපකාරී වේ.

වැඩිම පහසුතාව ඇති අංක 2 ප්‍රශ්නයෙහි වුව ද පහසුතාව 51%කට සීමා වී තිබීම ද ආර්ථික විද්‍යාව විෂයයෙහි ප්‍රගතිය අපේක්ෂා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. ස්ව අභිප්‍රේරණයෙන් යුතුව ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නකුට, සාමාන්‍ය වශයෙන් ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් වැඩි ප්‍රතිශතයක් උපයා ගැනීමට හැකිවන ආකාරයට තම පිළිතුර නිවැරදි විෂය කරුණු ඇසුරෙන් සංවිධානය කර ඉදිරිපත් කිරීමට ද මඟ පෙන්වනු ලැබිය යුතුය.

අඩුවෙන්ම තෝරා ගනු ලැබ ඇත්තේ අංක 10 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද 14%ක අවම අගයකට සීමා වී ඇත. ඊට පාදක වී ඇති විෂය කරුණු කෙරෙහි පන්ති කාමර ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැති බව පෙනේ.

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සැලකූ විට පහසුතම ප්‍රශ්නයේ පහසුතාව වුවද 51%කට සීමාවීමත් අංක 2, 3 හා 7 හැර අනෙක් ප්‍රශ්න හතෙහිම පහසුතාව 40%ට වඩා අඩුවීමත් මෙම විෂයය හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. එමෙන් ම II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව ද 33%කට සීමා වී ඇත. මෙම තොරතුරු ඇසුරෙන් අවධාරණය කෙරෙන්නේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය අනාවරණ පරීක්ෂණ කෙරෙහි යොමුවීමේත් ඉලක්ක ගත ප්‍රතිකාර්ය වැඩ සටහන් නොපමාව ක්‍රියාත්මක කරනු ලැබීමේත් වැදගත් අවශ්‍යතාවයි.

# III කොටස

3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස්**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. එකම ප්‍රශ්නය කොටස් දෙකක් ලෙස එකට ලියැවී ඇති විට, කොටස් 2ටම පිළිතුරු සැපයීම කෙරේ අවධානය යොමු විය යුතුය.
- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතුය. තව ද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.
- ★ II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ★ ප්‍රශ්න අංක හා කොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.
- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- ★ පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.
- ★ ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාලය කළමනාකරණය කරගත යුතුය.

**විශේෂ උපදෙස් :**

* ආර්ථික විද්‍යා විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය. උදා : පරිභෝජනය

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සූත්‍ර හා සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් සැලකිලිමත් විය යුතුය.

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාළ අවස්ථාවලදී නිවැරදි ව ඒකක සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.

* අදාළ රූප සටහන් අඳින විට රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහවල දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

## 3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* සංකල්ප පිළිබඳ ව නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිත ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුණුවල කාලීනව හටගන්නා වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ ව සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුය.

* මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත් කෙරෙන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුය. එමගින් තම දැනුම යාවත්කාලීන කර ගත යුතුය.



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440